## විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය

(වර්ෂ 1947 අංක 2 දරණ ආඥපනතේ දෙවැනි වගන්තියෙන්, විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය වර්ෂ 1901 පටන් ලංකාවේ "පැනවූ නීතියේ" කොටසක් බවට පත් වේ.)

### සාමාන්‍ය

1.මේ නියෝගයන් යටතේ ආණ්ඩුවේ සේවකයන්ට කිසිම විශ්‍රාම වැටුපක් හෝ දීමනාවක් හෝ ඒකාන්තයෙන් හිමිකර ගැනීමට අයිතිවාසිකමක් නැත්තේ ය. වන්දි ගෙවීමක් නොකොට ආණ්ඩුවේ සේවකයෙකු සේවයෙන් පහකර දැමීමට ආණ්ඩුවට බලය ඇත්තේ ය.

2.ආණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද නිවේදනයකින් "විශ්‍රාම වැටුප් හිමි තනතුරක්ය" යි ප්‍රකාශ කරන ලද්දා වූ ලංකා රාජ්‍ය සේවාවට ඇතුළත් වූ ද ස්ථිර ධුරයක් දරන ආණ්ඩුවේ සෑම සේවකයෙකුටම, මෙහි පහත පෙනෙන ව්‍යතිරේකයන්ට හා විධිවිධානයන්ට යටත්ව, විශ්‍රාම වැටුපක් මතු දක්වන අයුරු දිය හැකිය.

[1](i) මෙම ව්‍යවස්ථා සංග්‍රහයෙහි පටහැනිව කුමක් සඳහන්ව ඇතද, මෙහි මින් මතු සලසා ඇති විධිවිධාන වලට යටත්ව මාස එකසිය විස්සක දළ සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් පසුව විශ්‍රාම ගන්නා විශ්‍රාම වැටුප් හිමි තනතුරක් හෝ ධුරයක් දරන යම් රජයේ නිලධරයකු විශ්‍රාම ලැබුවිට, මෙහි පහත දක්වා ඇති "අ" වක්‍රයේ විධිවිධාන සලසා ඇති පරිදි වාර්ෂික වැටුපක් ලැබීමට ඔහු හිමිකම් ලැබිය යුතුය.

"අ" වක්‍රය විශ්‍රාම වැටුප් ප්‍රමාණය

| වාර්ෂික වැටුප | විශ්‍රාම ගන්නා අවස්ථාවේ සේවා කාලය | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | අවු.25 | අවු.25 | අවු.26 | අවු.26 | අවු.27 | අවු.27 | අවු.28 | අවු.28 | අවු.29 | අවු.29 | අවු.30 |
| | | මාස 6 | | මාස 6 | | මාස 6 | | මාස 6 | | මාස 6 | |
| රුපියල් | % | % | % | % | % | % | % | % | % | % | % |
| 25440 සහ ඊට වඩා අඩු | 85 | 86 | 87 | 88 | 89 | 90 | 90 | 90 | 90 | 90 | 90 |
| 25441-26460 | 84 | 85 | 86 | 87 | 88 | 89 | 90 | 90 | 90 | 90 | 90 |
| 26461-28740 | 83 | 84 | 85 | 86 | 87 | 88 | 89 | 90 | 90 | 90 | 90 |
| 28741-30060 | 82 | 83 | 84 | 85 | 86 | 87 | 88 | 89 | 90 | 90 | 90 |
| 30061-31740 | 81 | 82 | 83 | 84 | 85 | 86 | 87 | 88 | 89 | 90 | 90 |
| 31741-41280 | 80 | 81 | 82 | 83 | 84 | 85 | 86 | 87 | 88 | 89 | 90 |
| 41281-55920 | 79 | 80 | 81 | 82 | 83 | 84 | 85 | 86 | 87 | 88 | 89 |
| 55921-66840 | 78 | 79 | 80 | 81 | 82 | 83 | 84 | 85 | 86 | 87 | 88 |
| 66841-71040 | 77 | 78 | 79 | 80 | 81 | 82 | 83 | 84 | 85 | 86 | 87 |
| 71041-101400 | 76 | 77 | 78 | 79 | 80 | 81 | 82 | 83 | 84 | 85 | 86 |
| 101401 සහ ඊට වැඩි | 75 | 76 | 77 | 78 | 79 | 80 | 81 | 82 | 83 | 84 | 85 |

[1]1997.06.19 දින දරණ ගැසට් පත්‍රය බලන්න. මෙම සංශෝධනය 1996 දෙසැම්බර් මස 24 වන දින සිට ක්‍රියාත්මක වූ බව සැළකිය යුතුය. 1997.01.02 වන දින සිට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/97 වැටුප් පරිවර්තනය අනුව තවදුරටත් සංශෝධනය විය යුතුය.

එසේ වුවද, අවුරුදු 25 ක සේවයක් සම්පූර්ණ කිරීමට පෙර විශ්‍රාම ගන්නා යම් රජයේ නිලධරයකුගේ විශ්‍රාම වැටුප් එක් එක් මාස හයක හෝ ඉන් කොටසක හෝ කාලසීමාව සඳහා වැටුපෙන් සියයට එකක අඩු කිරීමකට යටත් විය යුතු අතර, යම් රජයේ නිලධරයකු විසින් වැටුප් රහිත නිවාඩු ලබාගෙන ඇති අවස්ථාවක, ඔහුගේ විශ්‍රාම වැටුප එක් මාසයක හෝ ඉන් කොටසක හෝ සෑම කාල සීමාවක් සඳහාම, වැටුපෙන් සියයට 0.2 ක අඩු කිරීමකට යටත් විය යුතුය.

මේ උපවගන්තියේ කාර්ය සඳහා විශ්‍රාම වැටුප් කටයුතුවලදී ගණන් ගත යුතු සේවය ගණන් ගැනීමේදී, පහත දැක්වෙන වැටුප් රහිත නිවාඩු ඇතුළත් නොකෙරෙන බව සැලකිය යුතුය.

(අ) පාසල් ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ සිට 1970 අප්‍රේල් මස පළමුවන දිනයේදී සිවිල් විශ්‍රාම වැටුප් ක්‍රමයට ගුරුවරුන් මාරු කිරීමට පෙරාතුව ඔවුනට දී ඇති අර්ධ වැටුප් සහිත හා වැටුප් රහිත නිවාඩු ;

(ආ) යම් රජයේ නිලධරයකුගේ තම වැඩ කටයුතුවලට අදාළව ඔහුට ප්‍රයෝජනවත් විය හැකි උසස් සුදුසුකම් ලබා ගැනීමේ කාර්ය සඳහා ඔහුට ප්‍රදානය කරන ලද වැටුප් රහිත නිවාඩු; සහ

(ඇ) එක් අවුරුද්දක් දක්වා වූ වැටුප් රහිත නිවාඩු කාලසීමාවන්.

[1](ii) 1991 ජනවාරි මස 01 වැනි දින හෝ ඊට ප්‍රථම අංක 44/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන යටතේ විශ්‍රාම ගන්නා යම් නිලධරයකු, විශ්‍රාම ගැනීමේ මනාපය පළ කරන්නේ වයස අවුරුදු පනස් නවය සම්පූර්ණ කිරීමේදී හෝ ඊට ප්‍රථම නම්, ඔහුට 2අ (1) (i) වැනි වගන්තියට අනුකූල පරිවර්තිත පාරිතෝෂිකයට අමතරව, මාස හයක අඩු නොකළ විශ්‍රාම වැටුපට සමාන ප්‍රසාද මුදලක් ලැබීමටද හිමිකම ඇත්තේ ය.

(iii) මාස එකසිය විස්සක දළ සේවයක් සම්පූර්ණ කිරීමට මත්තෙන් ලෙඩදුක් නිසා හෝ වයස සම්පූර්ණ වීම නිසා හෝ විශ්‍රාම ගන්නා ඕනෑම කෙනෙකුට විශ්‍රාම ගන්නා කාලයේ දී, දැරූ ස්ථිර ධුරයේ හෝ ධුරයන් හි හෝ මාසික වැටුපෙන් 12න් පංගුව බැගින් සේවය කළ එක් එක් මාසය වෙනුවෙන් ගණන් බලා පාරිතෝෂික මුදලක් ලැබිය හැකිය.

එහෙත්, සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ නියුක්ත, ඉම රටින් ම තෝරා පත්කර ගන්නා ලද සාත්තු සේවිකාවකට හෝ මෙවන් කෙනෙකුට හෝ මාස අනූහයක සේවය සම්පූර්ණ කළාට පසු ඕනෑ ම වේලාවක දී 14 වැනි වගන්තියෙන් නියමිත වෛද්‍ය සාක්ෂ්‍ය පත්‍රය නොමැතිව, විශ්‍රාම ලබන්නට පුළුවන. එබඳු ප්‍රස්තාවයක දී ඔහුට, සේවය කළ එක් එක් මාසය වෙනුවෙන් මාසික වැටුපෙන් 12 න් පංගුව බැගින් ගණනය කොට, උපරිම වශයෙන් දොළොස් මාසයක වැටුපට සීමිත වූ පාරිතෝෂිකයක් ලැබිය හැකිය.

2.අ (1) [2](i) ශ්‍රී ලංකා රජය යටතේ කරන ලද සේවය සම්බන්ධයෙන් මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුපක් දෙනු ලබන යම් රජයේ නිලධරයකුට ඔහුගේ මනාපය පරිදි එකී විශ්‍රාම වැටුප වෙනුවට දෙවන වගන්තියෙහි 'අ' වක්‍රයෙහි විධිවිධාන සලස්වා ඇති පරිදි මාස 24 ක විශ්‍රාම වැටුපට සමාන පාරිතෝෂිකයක් සමඟ මෙහි 'ආ' වක්‍රයෙහි විධිවිධාන සලස්වා ඇති පරිදි විශ්‍රාම වැටුපක් ගෙවනු ලැබිය හැකි ය.

---

[1]1992.04.03 දින අංක 709 දරණ ගැසට් පත්‍රය බලන්න.

[2]1997.06.19 දින අංක 981 දරණ ගැසට් පත්‍රය බලන්න.. මෙම සංශෝධනය 1996 දෙසැම්බර් මස 24 වන දින සිට ක්‍රියාත්මක වූ බව සැළකිය යුතුය. 1997.01.02 වන දින සිට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/97 වැටුප් පරිවර්තනය අනුව කවදුරටත් සංශෝධනය විය යුතුය.

[1]"ආ" චක්‍රය විශ්‍රාම වැටුප් ප්‍රමාණය

| වාර්ෂික වැටුප | විශ්‍රාම ගන්නා අවස්ථාවේදී සේවා කාලය | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | අවු.25 | අවු.25 | අවු.26 | අවු.26 | අවු.27 | අවු.27 | අවු.28 | අවු.28 | අවු.29 | අවු.29 | අවු.30 |
| | | මාස 6 | | මාස 6 | | මාස 6 | | මාස 6 | | මාස 6 | |
| රුපියල් | % | % | % | % | % | % | % | % | % | % | % |
| 25440 සහ ඊට වඩා අඩු | 75 | 76 | 77 | 78 | 79 | 80 | 81 | 82 | 83 | 84 | 85 |
| 25441-26460 | 74 | 75 | 76 | 77 | 78 | 79 | 80 | 81 | 82 | 83 | 84 |
| 26461-28740 | 73 | 74 | 75 | 76 | 77 | 78 | 79 | 80 | 81 | 82 | 83 |
| 28741-30060 | 72 | 73 | 74 | 75 | 76 | 77 | 78 | 79 | 80 | 81 | 82 |
| 30061-31740 | 71 | 72 | 73 | 74 | 75 | 76 | 77 | 78 | 79 | 80 | 81 |
| 31741-41280 | 70 | 71 | 72 | 73 | 74 | 75 | 76 | 77 | 78 | 79 | 80 |
| 41281-55920 | 69 | 70 | 71 | 72 | 73 | 74 | 75 | 76 | 77 | 78 | 79 |
| 55921-66840 | 68 | 69 | 70 | 71 | 72 | 73 | 74 | 75 | 76 | 77 | 78 |
| 66841-71040 | 67 | 68 | 69 | 70 | 71 | 72 | 73 | 74 | 75 | 76 | 77 |
| 71041-101400 | 66 | 67 | 68 | 69 | 70 | 71 | 72 | 73 | 74 | 75 | 76 |
| 101401 සහ ඊට වැඩි | 65 | 66 | 67 | 68 | 69 | 70 | 71 | 72 | 73 | 74 | 75 |

එසේ වුවද, අවුරුදු 25 ක සේවයක් සම්පූර්ණ කිරීමට පෙර විශ්‍රාම ගන්නා යම් රජයේ නිලධරයකුගේ විශ්‍රාම වැටුප එක් එක් මාස හයක හෝ ඉන් කොටසක හෝ කාල සීමාව සඳහා වැටුපෙන් 1% ක අඩු කිරීමකට යටත් විය යුතු අතර, රජයේ නිලධරයකු විසින් වැටුප් රහිත නිවාඩු ලබාගෙන ඇති අවස්ථාවක, ඔහුගේ විශ්‍රාම වැටුප එක් මාසයක හෝ ඉන් කොටසක හෝ සෑම කාලසීමාවක් සඳහාම වැටුපෙන් 0.2 % ක අඩු කිරීමකට යටත් විය යුතුය. මේ උපවගන්තියේ කාර්ය සඳහා, විශ්‍රාම වැටුප් සඳහා ගණන් ගත යුතු සේවය ගණන් ගැනීමේ දී පහත දැක්වෙන වැටුප් රහිත නිවාඩු ඇතුළත් නොකෙරෙන බව සැලකිය යුතුය.

(අ) පාසල් ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ සිට, 1970.අප්‍රේල් මස පළමුවන දිනයේ දී සිවිල් විශ්‍රාම වැටුප් ක්‍රමයට ගුරුවරුන් මාරු කිරීමට පෙරාතුව ඔවුන්ට දී ඇති අර්ධ වැටුප් සහිත හා වැටුප් රහිත නිවාඩු ;

(ආ) යම් රජයේ නිලධරයකුගේ වැඩ කටයුතු වලට අදාළව ඔහුට ප්‍රයෝජනවත් විය හැකි උසස් සුදුසුකම් ලබා ගැනීමේ කාර්ය සඳහා ඔහුට ප්‍රදානය කරන ලද වැටුප් රහිත නිවාඩු; සහ

(ඇ) එක් අවුරුද්දක් දක්වා වූ වැටුප් රහිත නිවාඩු කාලසීමාවන්.

(ii) (iii) වන පරිච්ඡේදයෙහි දක්වා ඇති විධිවිධානයන්ට යටත්ව, (i) වන උපවගන්තියෙහි සඳහන් මනාපය අනුව ක්‍රියා කළ හෝ ක්‍රියාකරන හෝ යම් නිලධාරියෙකුට, ඔහු ඒ මනාපය අනුව ක්‍රියා නොකළේ නම් ඔහුට ගෙවිය හැකිව තිබූ සම්පූර්ණ විශ්‍රාම වැටුප හෝ වාර්ෂිකය ඔහු විශ්‍රාම ගන්නා දින සිට අවුරුදු දහයක කාලයක් අවසාන වන දිනට පසුව ගෙවිය හැකිය.

එසේ වුවද අවුරුදු දහයක කාලය අවසාන වන දිනට පසුව යෙදෙන දින, යම් මාසයක පළමු වන දින හැර වෙනත් දිනයකට යෙදෙන අවස්ථාවක, ඒ විශ්‍රාම වැටුප හෝ වාර්ෂිකය ආරම්භවන දිනය, ඊට පසුව එළඹෙන මාසයේ පළමු වන දින විය යුතුය.

---

[1] 1997.06.19 දින අංක 981 දරණ ගැසට් පත්‍රය බලන්න. මෙම සංශෝධනය 1996 දෙසැම්බර් මස 24 වන දින සිට ක්‍රියාත්මක වූ බව සැළකිය යුතුය. 1997.01.02 වන දින සිට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/97 වැටුප් පරිවර්තනය අනුව තවදුරටත් සංශෝධනය විය යුතුය.

(iii) මෙම ව්‍යවස්ථා සංග්‍රහයේ 15 වැනි වගන්තිය යටතේ හෝ වෙනයම් ලිඛිත නීතියක විධිවිධාන යටතේ හෝ තමා විශ්‍රාම ලැබූ දිනට පසු දිනයකදී සිට විශ්‍රාම වැටුපක් දෙනු ලබන සහ මෙම වගන්තියේ ඉහත සඳහන් විධිවිධානයන් අනුව මනාපය පළකර ඇති හෝ මනාපය පළකරන යම් නිලධාරියෙකුට, තමාට විශ්‍රාම වැටුප් දෙනු ලැබූ දින සිට අවුරුදු දහයක කාලයක් අවසාන වන දිනයට පසුව යෙදෙන දින සිට ඔහු විසින් එවැනි මනාපයක් අනුව ක්‍රියා නොකරන ලද නම් ඔහුට ගෙවිය යුතුව තිබුණ සම්පූර්ණ විශ්‍රාම වැටුප ගෙවිය හැකිය.

එසේ වුවද, අවුරුදු දහයක කාලය අවසන් වන දිනට පසුව යෙදෙන දිනය යම් මාසයක පළමුවන දිනය හැර වෙනත් දිනයකට යෙදෙන අවස්ථාවක එම විශ්‍රාම වැටුප ගෙවීම ආරම්භ වන දිනය, ඊට පසුව එළඹෙන මාසයේ පළමුවන දිනය විය යුතුය.

(iv) මෙ වගන්තියෙහි ඉහත දැක්වෙන විධිවිධානවල සඳහන් මනාපය නිලධාරියා විසින් පාවිච්චි කරනු ලැබ, ඒ වෙනුවෙන් වූ ලිඛිත නිවේදනය විශ්‍රාම වැටුප් අයදුම්පත සමඟ විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂවරයා වෙත එවිය යුතුය.

(v) මෙ වගන්තියෙහි ඉහත දැක්වෙන විධිවිධාන යටතේ නිලධාරියෙකු විසින් පාවිච්චි කරන ලද මනාපය වෙනස් කළ නොහැකිය.

(vi) විකල වූ සිහියෙන් යුක්ත වූ, හෝ අසනීපයක් හෝ තුවාලයක් හේතු කොට ගෙන සිහි කල්පනාවෙන් යුක්තව තෝරා ගැනීමක් කිරීමෙහි අපොහොසත් තත්ත්වයට පමුණුවනු ලැබූ නිලධාරියෙකු සම්බන්ධයෙන් වූ විට, මේ උප වගන්තියේ පූර්වෝක්ත විධිවිධානයන් හි සඳහන් තෝරා ගැනීමේ බලය ස්වකීය අභිමතය පරිදි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමේ තැනැත්තකු විසින් ඒ නිලධාරියා වෙනුවෙන් පාවිච්චි කළ හැකිය.

[1] "අ" වක්‍රය විශ්‍රාම වැටුප් ප්‍රමාණය

| වාර්ෂික වැටුප | විශ්‍රාම ගන්නා අවස්ථාවේදී සේවා කාලය | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | අවු.25 | අවු.25 | අවු.26 | අවු.26 | අවු.27 | අවු.27 | අවු.28 | අවු.28 | අවු.29 | අවු.29 | අවු.30 |
| | | මාස 6 | | මාස 6 | | මාස 6 | | මාස 6 | | මාස 6 | |
| රුපියල් | % | % | % | % | % | % | % | % | % | % | % |
| 49860 සහ ඊට අඩු | 85 | 86 | 87 | 88 | 89 | 90 | 90 | 90 | 90 | 90 | 90 |
| 49861-51480 | 84 | 85 | 86 | 87 | 88 | 89 | 90 | 90 | 90 | 90 | 90 |
| 51481-55140 | 83 | 84 | 85 | 86 | 87 | 88 | 89 | 90 | 90 | 90 | 90 |
| 55141-57780 | 82 | 83 | 84 | 85 | 86 | 87 | 88 | 89 | 90 | 90 | 90 |
| 57781-62040 | 81 | 82 | 83 | 84 | 85 | 86 | 87 | 88 | 89 | 90 | 90 |
| 62041-78420 | 80 | 81 | 82 | 83 | 84 | 85 | 86 | 87 | 88 | 89 | 90 |
| 78421-103560 | 79 | 80 | 81 | 82 | 83 | 84 | 85 | 86 | 87 | 88 | 89 |
| 103561-116400 | 78 | 79 | 80 | 81 | 82 | 83 | 84 | 85 | 86 | 87 | 88 |
| 116401-124500 | 77 | 78 | 79 | 80 | 81 | 82 | 83 | 84 | 85 | 86 | 87 |
| 124501-171360 | 76 | 77 | 78 | 79 | 80 | 81 | 82 | 83 | 84 | 85 | 86 |
| 171361 සහ ඊට වඩා වැඩි | 75 | 76 | 77 | 78 | 79 | 80 | 81 | 82 | 83 | 84 | 85 |

[1] 1997.06.19 දින අංක 981 දරණ ගැසට් පත්‍රය බලන්න. 1997.01.02 වන දින සිට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/97 වැටුප් පරිවර්තනය අනුව තවදුරටත් සංශෝධනය වී ඇත.

[1]"ආ" වක්‍රය විශ්‍රාම වැටුප් ප්‍රමාණය

| වාර්ෂික වැටුප | විශ්‍රාම ගන්නා අවස්ථාවේදී සේවා කාලය | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | අවු.25 | අවු.25 | අවු.26 | අවු.26 | අවු.27 | අවු.27 | අවු.28 | අවු.28 | අවු.29 | අවු.29 | අවු.30 |
| | | මාස 6 | | මාස 6 | | මාස 6 | | මාස 6 | | මාස 6 | |
| රුපියල් | % | % | % | % | % | % | % | % | % | % | % |
| 49860 සහ ඊට අඩු | 75 | 76 | 77 | 78 | 79 | 80 | 81 | 82 | 83 | 84 | 85 |
| 49861-51480 | 74 | 75 | 76 | 77 | 78 | 79 | 80 | 81 | 82 | 83 | 84 |
| 51481-55140 | 73 | 74 | 75 | 76 | 77 | 78 | 79 | 80 | 81 | 82 | 83 |
| 55141-57780 | 72 | 73 | 74 | 75 | 76 | 77 | 78 | 79 | 80 | 81 | 82 |
| 57781-62040 | 71 | 72 | 73 | 74 | 75 | 76 | 77 | 78 | 79 | 80 | 81 |
| 62041-78420 | 70 | 71 | 72 | 73 | 74 | 75 | 76 | 77 | 78 | 79 | 80 |
| 78421-103560 | 69 | 70 | 71 | 72 | 73 | 74 | 75 | 76 | 77 | 78 | 79 |
| 103561-116400 | 68 | 69 | 70 | 71 | 72 | 73 | 74 | 75 | 76 | 77 | 78 |
| 116401-124500 | 67 | 68 | 69 | 70 | 71 | 72 | 73 | 74 | 75 | 76 | 77 |
| 124501-171360 | 66 | 67 | 68 | 69 | 70 | 71 | 72 | 73 | 74 | 75 | 76 |
| 171361 සහ ඊට වඩා වැඩි | 65 | 66 | 67 | 68 | 69 | 70 | 71 | 72 | 73 | 74 | 75 |

(2) මේ රෙගුලාසි යටතේ කෙනෙකුට පාරිතෝෂිකයක් ද විශ්‍රාම වැටුපක් ද යන දෙක ම දෙන විට,මේ ව්‍යවස්ථා සංග්‍රහයේ 2 වැනි සහ 23 වැනි වගන්තිවලින් නියමිත සීමා ඇතුළත එම විශ්‍රාම වැටුප ගෙනෙන සේ ලංකා විශ්‍රාම වැටුපෙන් අඩු කළ යුතු ප්‍රමාණය ගණනය කිරීම සඳහා ඒ විශ්‍රාම වැටුප් මුදල,පරිවර්තනය කරවා ගැනීමේ මනාපය ප්‍රකාශ නොකොට තිබුණි නම්,ඔහුට ලැබෙන්නට තිබුණ අඩු නොකළ විශ්රාම වැටුප සේ සැළකිය යුතුය.

(3) අවලංගු කරන ලදී.

[2]2අඅ. මේ ව්‍යවස්ථා සංග්‍රහයෙහි පටහැනිව කුමක් සඳහන් ව ඇත ද, මෙහි 'ට' උපලේඛනයේ නිශ්චිතව සඳහන් ධුරයකට හෝ තනතුරකට, රාජ්‍ය සේවයට පිටතින් පත් කරනු ලැබූ ද එකී ධුරය හෝ තනතුර මාස හැටක් හෝ ඊට වැඩි කාලයක් දැරුවා වූ ද යම් තැනැත්තෙකු එකී ධුරය හෝ තනතුර ස්ථිර ධුරයක් හෝ තනතුරක වුව ද නොවුවද, අවුරුදු 5 කාලයක් සඳහා ඔහුගේ වැටුපෙන් 1/3 කට සමාන වූ ද ඊට පසුව අවුරුදු පහකට වැඩි එක් එක් සම්පූර්ණ සේවා අවුරුද්ද වෙනුවෙන් වැටුපෙන් 1/30 පංගුව බැගින් වැඩිවෙමින් සේවා අවුරුදු 15 ක් වෙනුවෙන් අවසාන වරට ලැබූ වැටුපෙන් 2/3 ක උපරිමය දක්වා වූ ද විශ්‍රාම වැටුපක්, අකාර්යක්ෂමතාව හෝ විෂමාචාරය මත හැර වෙනත් යම් හේතුවක් නිසා ඔහුගේ සේවය අවසාන වීමේ දී ලැබීමට හිමිකම ලැබිය යුතුය. ඉහත 2අඅ වගන්තිය යටතේ විශ්‍රාම වැටුපක් ගෙවනු ලැබිය යුතු යම් තැනැත්තෙකු සම්බන්ධයෙන් පරිවර්තිත පාරිතෝෂිකයක් ගෙවනු නොලැබිය යුතුය.

[3]එසේ වුවද විශ්‍රාම වැටුපක් ලබන රජයේ නිලධරයෙකු හෝ විශ්‍රාම ලත් නිලධරයකුට උපලේඛනයේ සඳහන් තනතුරකට පත් කරනු ලැබ එහි සඳහන් තනතුරු එකක් හෝ වැඩි ගණනක අවුරුදු 5ක අඛණ්ඩ, අවම සේවා කාලයක් සම්පූර්ණ,කරන ලදුව ඒ තනතුරු එක හෝ වැඩි ගණන, දැරීම තනර වූ විට -

(අ) ඔහුගේ විශ්‍රාම වැටුප නිශ්චය කිරීමේ කාර්යය සඳහා රජයේ නිලධරයෙකු වශයෙන් වූ ඔහුගේ සේවාවන් සහ 'ට' උපලේඛනයේ සඳහන් අවසන් තනතුරේ ලැබූ වැටුප සැලකිල්ලට ගනිමින් 2අඅ වගන්තියෙහි සඳහන් පදනම මත විශ්‍රාම වැටුපක් ලැබීමේ මනාපය ඔහු සතු වන්නේය ;

---

[1]1997.06.19 දින අංක 981 දරණ ගැසට් පත්‍රය බලන්න. 1997.01.02 වන දින සිට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/97 වැටුප් පරිවර්තනය අනුව තවදුරටත් සංශෝධනය වී ඇත.

[2]1989.11.24 දින අංක 586 දරණ ගැසට් පත්‍රය බලන්න. මෙම සංශෝධනය 1981 ජනවාරි මස 01 වන දින සිට ක්‍රියාත්මක වූ ලෙස සියලු කාර්යය සඳහා සැලකිය යුතුයි.

[3]1990.01.05 දින අංක 592 දරණ ගැසට් පත්‍රය බලන්න.

(ආ) ඔහුගේ ප්‍රතිශෝධිත විශ්‍රාම වැටුප නිශ්චය කිරීමේ කාර්යය සඳහා රජයේ නිලධරයෙකු වශයෙන් වූ ඔහුගේ සේවාවන් සහ 'ට' උපලේඛනයේ සඳහන් අවසන් තනතුරේ ලැබූ වැටුප සැලකිල්ලට ගනිමින් 2අඅ වගන්තියෙහි සඳහන් පදනම මත ඔහුගේ විශ්‍රාම වැටුප ප්‍රතිශෝධනය කිරීමේ මනාපය ඔහු සතු වන්නේය.

(ඇ) රජයේ සේවයේ අවුරුදු 10 ක අවම සේවයක් ඇත්තා වූද 'ට' උපලේඛනයේ සඳහන් තනතුරකින් විශ්‍රාම ලබන්නා වූද තැනැත්තෙකු සම්බන්ධයෙන් වන විට 2අඅ වගන්තිය හෝ රජයේ නිලධරයෙකුට අදාළ වන රීති සහ ඔහුගේ අවසන් වැටුප යන දෙකින් ඔහුට වඩා වාසිදායක එක පදනම් කරගෙන ගනන් බලන ලද ඔහුගේ විශ්‍රාම වැටුප ලබා ලැබීමේ හෝ ප්‍රතිශෝධනය කිරීමේ මනාපය ඔහු සතු වන්නේය.

තවද, එබඳු, අවස්ථාවකදී රජයේ නිලධරයෙකු වශයෙන් ඔහුගේ විශ්‍රාම වැටුප මත ඔහුට ගෙවන ලද යම් පරිවර්තිත පාරිතෝෂිකයක් ඔහුගේ කලින් විශ්‍රාම වැටුප පදනම් මතම අයකර ගනු ලැබිය යුතු ය.

2අආ (1) (i) විශ්‍රාම ගන්නා කාලය වන විට, මෙම ව්‍යවස්ථා සංග්‍රහයේ 2 වැනි වගන්තිය යටතේ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනයකින්,"විශ්‍රාම වැටුප් හිමි තනතුරක්ය" යි ප්‍රකාශ නොකරන ලද්දා වූ නමුත් ලංකාණ්ඩුව යටතේ වූ යම් ස්ථිර තනතුරක සේවයෙහි යෙදී සිට විශ්‍රාම ලත් ආණ්ඩුවේ නිලධාරියකුට--

(අ) ඔහු විශ්‍රාම ගැනීමෙන් පසු එම තනතුර විශ්‍රාම වැටුප් හිමි තනතුරක් යයි ප්‍රකාශ කරනු ලැබූ කල්හි ද,

(ආ) එම තනතුර විශ්‍රාම වැටුප් හිමි තනතුරක් බව එම ආණ්ඩුවේ නිලධාරියා විශ්‍රාම ගැනීමට පෙර ප්‍රකාශ නොකර තිබුණේ අනවධානය හේතු කොට ගෙන යයි ලේකම්වරයා හට ඒත්තු ගිය විටද,

එම ආණ්ඩුවේ නිලධාරියා විශ්‍රාම ගැනීමට පෙර එම තනතුර විශ්‍රාම වැටුප් හිමි තනතුරක් යයි ප්‍රකාශ කර තිබුණි නම් යම් සේ මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුපක් හෝ පාරිතෝෂිකයක් හෝ ලැබෙන්නේ ද එපරිද්දෙන්ම විශ්‍රාම වැටුපක් හෝ පාරිතෝෂිකයක් හෝ දිය හැක්කේ ය.

[1]එසේවුද වුවත් ඉහත 2 අආ (1) වගන්තියේ සුදුසුකම සපුරා ඇති පොලිස් උප සේවයේ අවුරුදු 15 ක සක්‍රිය සේවයක් හිමිව තිබූ දැනට විශ්‍රාමික හෝ මියගිය නිලධාරීන්ගේ මුල් පත්වීම් දිනය ලෙස 1974.01.01 දින හෝ ඉන්පසු එළඹෙන දිනයක් ලෙස සැලකීම.

මුල් පත්වීම් දින සිට බලපැවැත්වෙන පරිදි පොලිස් උප සේවයේ වසර 15 ක සක්‍රිය සේවයක් හිමිව දැනට විශ්‍රාමික තත්ත්වයේ සිටින හෝ මියගිය නිලධාරීන්ට විශ්‍රාම වැටුප හෝ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ හිමිකම ලබා දීම.

ඔවුන් සේවයේ ස්ථිර වූ නිලධාරීන් ලෙස සැලකීම හා 2007.05.23 වැනි දින සිට විශ්‍රාම වැටුප හෝ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම සහ 2007.05.23 දිනට ප්‍රථම හිඟ වැටුප් කිසිවක් නොගෙවීම.

ඉහත විධි විධාන යටතේ විශ්‍රාම වැටුප් තත්ත්වය පිරිනැමීම සඳහා වසර 15 ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර නොමැති නිලධාරියකු/ නිලධාරිනියක විශ්‍රාම ලබන දිනය වන විට වසර 10 ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබේ නම් ඔහු/ ඇය සේවයේ නියුක්තව සිට සෑම වර්ෂයක් සඳහාම එක් මාසයක වැටුපට සමාන පාරිතෝෂිකයකට හිමිකම ලබා දීම.

[2](ii) මෙම ව්‍යවස්ථා සංග්‍රහයේ පවතැනිව කුමක් සඳහන්ව ඇත්ද විශ්‍රාම වැටුප් සහිත තනතුරකින් 1988.01.01 වැනි දිනට පෙර හෝ පසුව විශ්‍රාම ගත් රජයේ නිලධරයකු, සේවයේ කඩවීමකින් තොරව විශ්‍රාම වැටුප් සහිත තනතුරක නැවත සේවයේ යොදවනු ලැබ, ඒ තනතුරෙහි අඛණ්ඩව සේවය කරන්නේ නම්, ගිවිසුම් වැටුපට අමතරව අංක 387 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුකූල වැටුප් පරිවර්තනය යටතේ 1988.01.01 වැනි දින දී, අවස්ථාවෝචිත පරිදි, ඒ නිලධරයා විසින් ලබා ගන්නා ලද වැටුප මත පදනම් වූ පරිශෝධිත විශ්‍රාම වැටුප, ඔහුට ගෙවනු ලැබිය හැකිය.

[3]එසේ වුව ද විශ්‍රාම ගනු ලැබූ රජයේ නිලධාරියෙකු සේවා කඩවීමකින් පසුව විශ්‍රාම වැටුප් සහිත තනතුරක නැවත සේවයෙහි නියුක්ත කරනු ලැබ එම සේවයෙහි අවුරුදු 02 ක අඛණ්ඩ සේවයක් සම්පූර්ණ කර එකී නැවත සේවයෙහි යොදවන ලද තනතුරෙන් විශ්‍රාම ගැනීමේ දී විශ්‍රාම ගැනීමේ දිනයෙහි වූ ප්‍රතිශෝධිත වැටුප මත කල්පිත පදනමින් ඔහුගේ විශ්‍රාම වැටුප් ප්‍රතිශෝධනය කළ යුතුය.

[4]විධිමත් අනුමැතියක් මත විශ්‍රාම වැටුප් සහිත තනතුරක නැවත සේවයේ යොදවනු ලැබ වසර 02 ක සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් අනතුරුව 2004.12.01 දින සිට 2005.12.31 දක්වා අතර කාලය තුළ දී සේවය අවසාන කරනු ලැබූ විශ්‍රාමික රාජ්‍ය නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප, ඔවුන්, විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 2: අ: ආ: වගන්ති ප්‍රකාරව විශ්‍රාම වැටුප් පරිවර්තනය කිරීමට හිමිකම් ලබා ඇත්නම්,

i. අංක 9/2004 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛනයේ දැක්වෙන වැටුප් මත කෙරෙන පරිවර්තනයක් මගින් ඔවුන්ගේ විශ්‍රාම වැටුප් කල්පිත පදනම මත ප්‍රතිශෝධනය කල හැක.

---

[1]2009.07.03 දින අංක 1608/38 දරණ ගැසට් පත්‍රය බලන්න.

[2]1994.03.11 දින අංක 810 දරණ ගැසට් පත්‍රය බලන්න.

[3]1998.12.04 දින දරණ ගැසට් පත්‍රය බලන්න.

[4]2008.07.28 දින අංක 1560/1 දරණ ගැසට් පත්‍රය බලන්න.

ii. එකී විශ්‍රාම වැටුප් පරිවර්තනය 2006.12.31 දින දක්වා හිඟ විශ්‍රාම වැටුප් ගෙවීමකින් තොරව විශ්‍රාම වැටුප් ප්‍රතිශෝධනය කිරීමේ කාර්ය සඳහා පමණක් අදාළ කර ගත යුතුය.

[1](iii) විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව ඇතද, එහෙත් 2අආ (ii) වගන්තියේ විධිවිධානවලට යටත්ව, විශ්‍රාම වැටුප් සහිත තනතුරකින් විශ්‍රාම ගත් රජයේ නිලධරයකු එසේ විශ්‍රාම ගැනීමෙන් පසුව, විශ්‍රාම වැටුප් සහිත තනතුරක නැවත සේවයේ යොදවනු ලැබූ විටක, එම විශ්‍රාම වැටුප් සහිත තනතුරෙහි අඛණ්ඩ සේවයකින් පසුව එම නැවත සේවයේ යොදවන ලද තනතුරෙහි සේවය නතර කිරීමේදී, ඔහුගේ මුල් විශ්‍රාම වැටුප-

i. ඔහු නැවත සේවයේ යොදවනු ලැබ සිටි තනතුරෙහි සේවය නතර කරන අවස්ථාවේ අදාළ වූ විශ්‍රාම වැටුප් ගණනය කිරීමේ ක්‍රමය හෝ ඊට පූර්වයෙන් වූ වෙනත් විශ්‍රාම ගැනීමේ යෝජනා ක්‍රමයක් යන මෙයින් ඔහුට වඩා වාසිදායක ක්‍රමය පදනම් කරගෙන ; සහ

ii. ඔහු නැවත සේවයේ යොදවනු ලැබ සිටි තනතුරෙහි සේවය නතර කරන අවස්ථාවේදී, 1992.12.24 වැනි දින හා අංක 37/92 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුකූලව එම නිලධාරියා ලබා ඇති 1993 නව පරිවර්තික වැටුප් පරිමාණය පදනම් කරගෙන, ප්‍රතිශෝධනය කරනු ලැබිය හැකිය.

එසේ වුවද, 1991.01.01 වැනි දින හෝ ඊට පෙර, 1990.10.18 වැනි දින හා අංක 44/90 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන යටතේ, සාමාන්‍යයෙන් හිමිකම ඇති පරිවර්තිත විශ්‍රාම වැටුපට අමතරව, හය මාසයක අඩු නොකළ විශ්‍රාම වැටුපට සමාන ප්‍රසාද මුදලක් ලබා, වයස අවුරුදු 55 එළඹීමට ප්‍රථම විශ්‍රාම ගත් නිලධරයන්ට, මෙම විශ්‍රාම වැටුප් ප්‍රතිශෝධනය අදාළ නොවිය යුතුය.

මෙම සංශෝධනය 1992 දෙසැම්බර් මස 31 වැනි දින හෝ ඊට පෙර විශ්‍රාම ලබා නැවත සේවයේ යොදවනු ලැබූ නිලධරයකු ලෙස 1993 ජනවාරි මස 01 වැනි දින හෝ ඊට පසුව අඛණ්ඩ සේවයේ යෙදුනු කවර නිලධරයකුට වුවද අදාළ විය යුතුය.

[2](iv) විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, එහෙත් 2 අ ආ (II) වැනි වගන්තියේ විධිවිධාන වලට යටත්ව, විශ්‍රාම වැටුප් සහිත තනතුරකින් විශ්‍රාම ගත් රජයේ නිලධාරියකු එසේ විශ්‍රාම ගැනීමෙන් පසුව විශ්‍රාම වැටුප් සහිත තනතුරක නැවත සේවයේ යොදවනු ලැබූ විටක එම විශ්‍රාම වැටුප් සහිත තනතුරෙහි අඛණ්ඩ සේවයකින් පසුව, එම නැවත සේවයේ යොදවන ලද තනතුරෙහි සේවය නතර කිරීමේ දී ඔහුගේ මුල් විශ්‍රාම වැටුප :-

i. ඔහු නැවත සේවයෙහි යොදවනු ලැබූ තනතුරෙහි සේවය නතර කරන අවස්ථාවේ අදාළ වූ විශ්‍රාම වැටුප් ගණනය කිරීමේ ක්‍රමය හෝ ඊට පූර්වයෙන් වූ වෙනත් විශ්‍රාම ගැනීමේ යෝජනා ක්‍රමයක් යන මෙයින් ඔහුට වඩා වාසිදායක ක්‍රමය පදනම් කරගෙන සහ,

ii. ඔහු නැවත සේවයෙහි යොදවනු ලැබ සිටි තනතුරෙහි සේවය නතර කරන අවස්ථාවේ දී 1997.01.15 හා අංක 2/97 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුකූලව එම නිලධාරියා ලබා ඇති 1997 නව පරිවර්තිත වැටුප් පරිමාණය පදනම් කරගෙන ප්‍රතිශෝධනය කරනු ලැබිය හැකි ය.

මෙම සංශෝධනය 1996 දෙසැම්බර් මස 31 වැනි දින හෝ ඊට පෙර විශ්‍රාම ලබා 1997 ජනවාරි මස 01 වැනි දින හෝ ඊට පසුව නැවත සේවයෙහි යොදවනු ලැබූ නිලධාරියෙකු ලෙස අඛණ්ඩව සේවයේ යෙදී සිටි යම් නිලධාරියෙකුට අදාළ විය යුතු ය.

(2) විශ්‍රාම ගන්නා කාලය වන විට,මෙම ව්‍යවස්ථා සංග්‍රහයේ 2 වැනි වගන්තිය යටතේ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනයකින් "විශ්‍රාම වැටුප් හිමි තනතුරක්ය" යි ප්‍රකාශ නොකරන ලද්දා වූ නමුත් ලංකාණ්ඩුව යටතේ වූ යම් ස්ථිර තනතුරක, විශ්‍රාම ගන්නා කාලයේ දී සේවයෙහි යෙදී සිට විශ්‍රාම ලත් ආණ්ඩුවේ නිලධාරියකු විශ්‍රාම ගැනීමෙන් පසු මියගිය කල්හිද, එසේම ඔහුගේ මරණයෙන් පසු එම තනතුර විශ්‍රාම වැටුප් හිමි තනතුරක් යයි ප්‍රකාශ කරනු ලැබූ කල්හි හා, එම තනතුර විශ්‍රාම වැටුප් හිමි තනතුරක් බව එම ආණ්ඩුවේ නිලධාරියා විශ්‍රාම ගැනීමට පෙර ප්‍රකාශ නොකර තිබුණේ අනවධානය හේතු කොට ගෙන යයි ලේකම්වරයා හට ඒත්තු ගිය විටද, එම ආණ්ඩුවේ නිලධාරියා විශ්‍රාම ගැනීමට පෙර එම තනතුර විශ්‍රාම වැටුප් හිමි තනතුරක් බව ප්‍රකාශ කර තිබුණි නම් මියගිය ආණ්ඩුවේ නිලධාරියාට මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ දිය හැකිව තිබූ විශ්‍රාම වැටුප් මුදලට නැතහොත් පාරිතෝෂික මුදලට සමානව පාරිතෝෂිකයක්, ඔහුගෙන් යැපෙන්නන් හට, මෙම ව්‍යවස්ථා සංග්‍රහයේ 39 වැනි වගන්තියේ විධිවිධාන අනුව ගෙවිය හැකිය.

(3) මෙම වගන්තියේ පූර්වෝක්ත විධිවිධාන යටතේ ගෙවිය හැකි වන කවර විශ්‍රාම වැටුපකින් හෝ පාරිතෝෂිකයකින් හෝ වුවද--

(අ) මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවන ලද යම් පාරිතෝෂිකයක් ඇත්නම් ඊට අයත් මුදල් ප්‍රමාණය; හෝ

---

[1]1994.03.11 දින අංක 810 දරණ ගැසට් පත්‍රය බලන්න.

[2]1998.06.05 දින අංක 1031 දරණ ගැසට් පත්‍රය බලන්න.

(ආ)1942 අංක 18 දරන රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල් ආඥාපනතේ විධිවිධාන යටතේ ප්‍රසාද මුදලක් හෝ ආධාර මුදලක් හෝ වශයෙන් ගෙවන ලද දීමනාවකට අයත් මුදල් ප්‍රමාණය හෝ අඩු කර ගනු ලැබේ.

(4) මෙම වගන්තිය 1946 ජනවාරි මස 1 වැනි දින වලංගු වූවා සේ සැලකිය යුතුය.

2.අඇ. යම් ආණ්ඩුවේ සේවකයකු මියගිය කාලයේදී මෙම ව්‍යවස්ථා සංග්‍රහයේ 2 වැනි වගන්තිය යටතේ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනයකින් විශ්‍රාම වැටුප් හිමි තනතුරක් යයි ප්‍රකාශ නොකරන ලද තනතුරක් දරමින් සිට ඔහු මිය යෑමෙන් පසුව එකී තනතුර විශ්‍රාම වැටුප් හිමි තනතුරක් යයි ප්‍රකාශ කරන ලද්දේ නම්, එකී ආණ්ඩුවේ නිලධාරියා මිය යෑමට පෙර එම තනතුර විශ්‍රාම වැටුප් තනතුරක් බව ප්‍රකාශ නොකර තිබුණේ අනවධානය හේතුකොට ගෙන යයි ලේකම්වරයා සෑහීමට පත්වූවහොත්, එවිට එකී ආණ්ඩුවේ නිලධාරියා මිය යෑමට කලින් එකී තනතුර විශ්‍රාම වැටුප් හිමි තනතුරක් යයි ප්‍රකාශ කර තිබුණි නම් මේ ව්‍යවස්ථා සංග්‍රහයේ 2 ආ (1) වැනි වගන්ති යටතේ දිය හැකිව තිබූ පාරිතෝෂිකය, එකී ආණ්ඩුවේ නිලධාරියාගෙන් යැපෙන්නන්ගේ යහපත පිණිස ලේකම්වරයා අනුමත කරන යම් පුද්ගලයකුට හෝ පුද්ගලයන්ට හෝ ගෙවිය හැකිය.

2අඇ. තාවකාලික සේවකයකු වශයෙන් නියමිත කාල පරිච්ඡේදයක් සේවය කිරීමෙන් පසුව, ස්ථිර තත්ත්වයකට හා විශ්‍රාම වැටුප් අයිතිවාසිකම්වලට හිමි වන සේවකයකු විසින් දරන ලද යම් තනතුරක්, ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනයකින් විශ්‍රාම වැටුප් හිමි තනතුරක් යයි ප්‍රකාශ කර තිබුණේ නම්, එම තනතුරද මෙම ව්‍යවස්ථා සංග්‍රහයේ 2, 2 අආ සහ 2 අඇ යන වගන්තිවල කාර්යයන් සඳහා "ස්ථිර තනතුරක්" යන පාඨයට ඇතුළත් වන්නේය.

2ආ.(1) විශ්‍රාම වැටුප් සීමිත තනතුරක ස්ථිර කරන ලද්දා වූත් රජයේ සේවයෙහි අවුරුදු පහක සේවා කාලයක් සම්පූර්ණ කළාවූත්, (ආධුනික තත්ත්වයෙන් හෝ ගිවිසුමක් පිට හෝ ප්‍රාදේශිය මහජන මණ්ඩලයක් යටතේ කරන ලද සේවා කාලයක් වේ නම්, එයද ඇතුළත්ව) නිලධාරියෙක් සේවයෙහි යෙදෙමින් සිටියදී මිය ගිය හොත්, ලේකම්වරයා විසින් අනුමත කරනු ලැබිය හැකි තැනැත්තාට හෝ තැනැත්තන්ට, මියගිය නිලධාරියාගේ යැපෙන්නන්ගේ යහපත සඳහා,

[1](අ) නිලධරයා අවුරුදු දහයක සේවයක් සම්පූර්ණ කිරීමෙන් පසුව විශ්‍රාම ගියා සේ සලකා ඒ නිලධරයා මිය ගිය දිනයේ දී ඔහුගේ වැටුප හා සේවා කාලය පදනම් කරගෙන ගණන් බලන ලද 2 (i) වන වගන්තියේ විධිවිධාන සලසා ඇති පරිදි වූ මාස 24 ක විශ්‍රාම වැටුපට සමාන පාරිතෝෂිකයක් හෝ

(ආ) අවුරුදු එකකට වැඩි නොවන කාලයක විශ්‍රාම වැටුප් සහිත වේතනයේ මුදල් ප්‍රමාණයේ පාරිතෝෂිකයත් යන දෙකින් කුමක් වැඩි වුවද, එය ප්‍රදානය කළ හැකිය.

[2]ත්‍රස්තවාදී/ කඩාකප්පල්කාරී ක්‍රියා හේතුකොටගෙන අනියම්/දෛනික වැටුප් ලබන හෝ තාවකාලික තත්ත්වයේ නිලධාරියකු 1983 ජූලි මස 31 වැනි දිනට පසුව මියගිය විට අංක 369 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව ඔහු මියගිය දිනයේ ස්ථිර හා විශ්‍රාම වැටුප් හිමි තනතුරක් දරමින් සිටියා සේ සලකා, එහි සඳහන් පරිදි එවැනි නිලධාරීන් අවුරුදු 05 ක සේවා කාලයක් සම්පූර්ණ කර එවැනි තනතුරක ස්ථිර කරනු ලැබ සිටියාක් මෙන් ඔහුගෙන් යැපෙන්නන්ට මරණ පාරිතෝෂිකයක් ලැබීමට හිමිකම් ලැබේ.

(2) රාජිනියගේ ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක සේවයේ සිට ලංකා සේවයෙහි නිලයකට ද්විතීයනය කරන ලද නිලධාරියකු එසේ ලංකා සේවයෙහි යෙදී සිටිය දී මළහොත් පූර්වෝක්ත ආකාරයට මරණ පාරිතෝෂිකයක් දිය හැකිය. ඒ නිලධාරියා අධිරාජ්‍ය වෘද්ධ විශ්‍රාම වේතන පනත යටතේ පාරිතෝෂිකයකට හිමි වේනොත් ඒ පාරිතෝෂික දෙකෙන් වැඩි පාරිතෝෂිකය වශයෙන් ගෙවිය හැකිය.

(3) මේ ව්‍යවස්ථා සංග්‍රහයේ 2අ වැනි වගන්තිය යටතේ අඩු නොකරන ලද විශ්‍රාම වැටුපක් දෙනු ලැබූ නිලධාරියකු මැරුණ විට, ලේකම්වරයා අනුමත කරන කෙනෙකුට, අභාවප්‍රාප්ත වූ විශ්‍රාමිකයාගෙන් යැපෙන්නන්ගේ ප්‍රයෝජනය සඳහා, ඒ අභාවප්‍රාප්ත විශ්‍රාමිකයා මැරෙණ විට සේවයෙහි යෙදී සිටියේ නම්, විශ්‍රාමිකයා ලැබූ සම්පූර්ණ විශ්‍රාම වැටුපද, ඔහුට හිමිව තිබුණු වැටුපද යන මේ මුළු මුදල මැරෙණ විට ඔහු සේවයෙහි යෙදී සිටියේ නම් ඔහුට ගෙවිය යුතුව තිබුණු මරණ පාරිතෝෂිකයට යම් ගණනකින් අඩු වේ නම්, අඩුවන එම ගණනට වැඩි නොවන මුදලක් මරණ පාරිතෝෂිකය වශයෙන් ගෙවිය හැකිය.

(4) මියගිය නිලධාරියකු වෙනුවෙන් මෙම වගන්තියේ පූර්වෝක්ත විධිවිධාන යටතේ ගෙවිය හැකි පාරිතෝෂිකයෙන්, එම මියගිය නිලධාරියගෙන් ආණ්ඩුවට හෝ ලොහෝර් ආර්යා ණය අරමුදලට හෝ ලැබිය යුතු වන මුදල් ප්‍රමාණය තැකහොත් මුදල් ප්‍රමාණයන් අඩු කර ගනු ලැබේ.

(5) (4) වැනි ඡේදයේ සඳහන් වන විධිවිධානයන් 1951 ඔක්තෝම්බර් 1 වැනි දින වලංගු වූවා සේ සැලකිය යුතුය.

---

[1]1997.06.19 දින අංක 981 දරණ ගැසට් පත්‍රය බලන්න.

[2]1993.04.08 දින අංක 762 දරණ ගැසට් පත්‍රය බලන්න.

[1](6) 1980 ජූලි මාසයේදී ධූරය අත්හරින ලද යම් රජයේ නිලධරයෙකු -

(අ) විශ්‍රාම යාම සඳහා සිය මනාපය ක්‍රියාත්මක කිරීමක් නොමැතිව හෝ මේ ව්‍යවස්ථාව යටතේ විශ්‍රාම වැටුපක් සහ පාරිතෝෂිකයක් හෝ විශ්‍රාම වැටුපක් හෝ පාරිතෝෂිකයක් ලබා නොගෙන මිය ගිය අවස්ථාවක, මේ ව්‍යවස්ථාව යටතේ පටහැනිව කුමක් සඳහන් වුවද, ඔහු සම්පූර්ණ වැටුප් සහිත නොකඩවා සේවයේ යෙදුන ලෙස සහ ව්‍යවස්ථා සංග්‍රහයේ 2 ආ (1) වගන්තියේ විධිවිධාන සලස්වා ඇති පරිදි මරණ පාරිතෝෂිකයක් දීම සඳහා, මේ ව්‍යවස්ථා සංග්‍රහයේ 10අ (2) (1) වන වගන්තියේ සඳහන් 1989 මැයි මස 08 වන දින හෝ මියගිය ලෙස කල්පිත පදනම මත සළකනු ලැබිය යුතුය. තවද,

(ආ) 1980 ජූලි මස ධූරය අත්හරින ලද මිය ගිය නිලධරයෙකු සම්බන්ධයෙන් මරණ පාරිතෝෂිකයක් එවකටත් ප්‍රදානය කරන ලද අවස්ථාවක, ඒ ප්‍රදානය මේ උපවගන්තියේ (අ) ඡේදයේ විධිවිධාන සලස්වා ඇති පරිදි ප්‍රතිශෝධනය කරනු ලැබිය හැකිය.

[2]1953 අංක 44 දරන පාඨශාලා ගුරු විශ්‍රාම වැටුප් පනත සහ 1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනත යටතෙහි විශ්‍රාම වැටුප් හිමිකම ලබන ගුරුවරු/ගුරුවරියන්ට විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුපකට හිමිකම ලැබෙන විට, එකී විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ බලපැවැත්වෙන විධිවිධාන ඒ ආකාරයට ඔවුන්ට ද බලපවත්වන්නේ ය. කෙසේ වෙතත් ඔවුන් තම විශ්‍රාම වැටුප් හිමිකම ආරක්ෂා කර ගැනීමට සේවා කාලය තුළ දී ගුරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු අතර, එම දායක මුදල ලැබෙන මූලික වැටුපෙන් 6% ක් විය යුතුය.

[3]01.(අ) 2012 මාර්තු මස 19 වැනි දින හෝ ඉන්පසුව විශ්‍රාමික රජයේ නිලධාරීන් කොන්ත්‍රාත් පදනම මත හෝ සේවා අවශ්‍යතා මත නැවත සේවයේ යොදවා විශ්‍රාම වැටුප් සංශෝධනය කිරීමේ දී ඔවුන්ට පෙර ගෙවන ලද සම්පූර්ණ පාරිතෝෂිකය ඔවුන්ගේ නව ප්‍රදානයෙන් අය කළ යුතු ය.

(ආ) 2012 මාර්තු 19 දිනට පෙර නැවත සේවයේ යොදවා ගත් නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප් සංශෝධනය කිරීමේ දී කලින් ඔවුන් වෙත කරන ලද ප්‍රදානය අනුව ගෙවන ලද පාරිතෝෂිකයෙන් අදාළ දිනය දක්වා අය කරන ලද පාරිතෝෂිකයේ වටිනාකම හැර ඉතිරි පාරිතෝෂිකයේ වටිනාකම සංශෝධනයෙන් පසු හිමි පාරිතෝෂිකයෙන් අඩු කර අවශ්‍ය ගැලපීම සිදු කර ආපසු ගෙවිය යුතු මුදලක් වෙත් නම් ගෙවීම කළ යුතු ය.

[4]02.ඉහත සඳහන් කරුණු හැරුණු කොට විශ්‍රාම වැටුප් ප්‍රදාන පත්‍රය සංශෝධනය වන වෙනත් අවස්ථාවන්හි ද පෙර ගෙවන ලද පාරිතෝෂික මුදල සම්පූර්ණයෙන්ම නව පාරිතෝෂික මුදලින් අය කළ යුතුය.

03.මෙම විධිවිධාන සත්නද්ධ හමුදා විශ්‍රාම වැටුප් සංශෝධනය සඳහා ද අදාළ වේ.

1974 අංක 16 දරන පළාත් පාලන සේවා පනත සහ එහි අනුෂාංගික පනත් හා රෙගුලාසි යටතෙහි විශ්‍රාම වැටුප් හිමිකම් ලබන පළාත් පාලන සේවකයන්ට විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුපකට හිමිකම ලැබෙන විට, එකී විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ බලපැවැත්වෙන විධිවිධාන ඒ ආකාරයට ඔවුන්ට ද බලපවත්වන්නේය.

3. මෙම ව්‍යවස්ථා සංග්‍රහයෙහි අනෙක් විධිවිධානයනට යටත්ව, විශ්‍රාම වැටුප හෝ පාරිතෝෂිකය සඳහා ගණන් ගනු ලැබීමට නියමිත රජයේ නිලධාරියකුගේ සේවය, ඔහු විසින් විශ්‍රාම වැටුප් හිමි නිලයෙහි හෝ නිලවල දරන ලද සේවා කාලය සහ මෙම ව්‍යවස්ථා සංග්‍රහයෙහි දැක්වෙන විශ්‍රාම වැටුප සහ පාරිතෝෂිකය සඳහා ගණන් ගත හැකි එවැනි අනෙක් සේවය ද විය යුතුය.

එහෙත්,

(1) ලේකම්වරයා විසින් අනුමත කරන ලද අභ්‍යාස ආයතනයෙන් යම් කාලයක් පුහුණුව ලබා 1931 ජූනි මස 15 වන දිනට පෙර රජයේ සේවයෙහි තනතුරකට පත් කරන ලැබූ ගුරුවරයකු විසින් අවුරුදු දෙකකට වැඩි නොවන එකී පුහුණුවීමේ කාලයෙන් අඩක් විශ්‍රාම වැටුප හෝ පාරිතෝෂිකය සඳහා ගණන් ගත හැකිය.

(2) 1934 ජූනි මස 15 වන දින හෝ ඉන් පෙර රජයේ සේවයෙහි සිටියා වූ ද රජයේ පාසලක නුපුහුණු ගුරුවරියකු ලෙස 12 මසකට නොඅඩු කාලයක් පූර්ණ සේවයෙහි යෙදී සිටියා වූ ද ලේකම්වරයා විසින් අනුමත කරන ලද අභ්‍යාස ආයතනයක පුහුණුව ලැබීම සඳහා නිවාඩු දෙන ලද්දා වූ ද ගුරුවරයකු විසින් අවුරුදු දෙකකට නොවැඩි එකී පුහුණුවීමේ කාලය විශ්‍රාම වැටුප හා පාරිතෝෂිකය සඳහා ගණන් ගත හැකිය.

මෙසේ ගණන් ගත හැක්කේ මේ එක් එක් පුහුණුවීමේ කාලය, ඉන්පසුව රජයේ ගුරුවරයකු වශයෙන් කරන විශ්‍රාම වැටුප් හිමි සේවය හා අඛණ්ඩ වූවහොත්ය.

---

[1]1990.02.22 දින අංක 599 දරණ ගැසට් පත්‍රය බලන්න.

[2]2012.02.03 දින දරණ අංක 1743/28 ගැසට් පත්‍රය බලන්න.

[3]2018.08.16 දින දරණ අංක 2084/59 ගැසට් පත්‍රය බලන්න.

[4]2012.03.19 දින දරණ අංක 1750/1 ගැසට් පත්‍රය බලන්න.

3අ (I) අංක 2 දරන උප වගන්තියෙහි විධිවිධානයන්ට යටත්ව, මෙකී ව්‍යවස්ථා සංග්‍රහය අනුව විශ්‍රාම වැටුපක් හෝ පාරිතෝෂිකයක් ගෙවිය යුතු වූ සේවය හා එවැනි සේවාවන් අතර හෝ එවැනි සේවා කාලය තුළදී හෝ ඒ අතරතුර හෝ ඇතිවන කඩවීම පිළිබඳ කුමක් සඳහන් වුවද, මෙකී සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුපක් හෝ පාරිතෝෂිකයක් ගෙවීම සඳහා ගණන් ගනු ලබන සේවය හා සමඟ පහත සඳහන් සේවය හෝ සේවාවන් විශ්‍රාම වැටුප හා පාරිතෝෂිකය සඳහා ගණන් ගනු ලැබිය යුතුය :-

(අ) ග්‍රාමීය වැඩ අධිකාරි කෙනෙකු වශයෙන් කරන සේවය;

(ආ) අධ්‍යාපන දිස්ත්‍රික් කාරක සභාවෙහි කරන සේවය

(ඇ) දේශීය ආරෝග්‍යශාලාවේ හා එම විද්‍යාලයේ කාර්යය මණ්ඩලයෙහි කරන සේවය;

(ඈ) ගම්සභා ලිපිකරුවෙකු හෝ කච්චේරියේ කාර්යාල කාර්ය සහායක හෝ ගම්සභා අරමුදලින් නඩත්තු වන ගම්සභා උසාවියක කරන සේවය;

(ඉ) වාරිමාර්ග දඩ අරමුදලින් නඩත්තු වන සේවය;

(ඊ) විශ්‍රාම වැටුප් සඳහා වූ ඒකාබද්ධ යෝජනාක්‍රමය යටතේ රජයේ සේවයට පත් කරන ලද විශ්‍රාමිකයන් නගර සභාවක, ගම්සභාවක හෝ සනීපාරක්ෂක මණ්ඩලයක කරන සේවය;

(උ) 1953 ඔක්තෝබර් මස 1 වන දින ආරම්භ 1954 මාර්තු මස 31 වන දින අවසන් වන කාලය තුළ කොළඹ මහ නගර සභාවේ නාගරික අරමුදලින් නඩත්තු වන සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ වීක්ෂකයකු වශයෙන් කරන සේවය;

(ඌ) ජාතික නිවාස දෙපාර්තමේන්තුවේ සේවය, නිවාස ණය මණ්ඩලයේ සේවය හා සමඟ අඛණ්ඩ වන විට නිවාස ණය අරමුදලින් නඩත්තු වන (1949 අංක 26 දරන පනතින් ප්‍රතිෂ්ඨාපිත) නිවාස ණය මණ්ඩලයේ සේවය හා ජාතික නිවාස අරමුදලින් නඩත්තු වන ජාතික නිවාස දෙපාර්තමේන්තුවේ සේවය;

(එ) රජයේ අරමුදලින් හෝ එම දෙපාර්තමේන්තුවේ දායක අරමුදලින් හෝ සමූපාකාර අරමුදලින් වැටුප් ගෙවන ලද සමූපාකාර සංවර්ධන හා සමූපාකාර සමිති රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ සේවය;

(ඒ) ප්‍රධාන මුලාදෑනියකු යටතේ ලිපිකරුවකු ,කාර්යාල කාර්ය සහායකයකු හෝ පණිවුඩකරුවකු වශයෙන් හෝ කරන සේවය;

(ඔ) විශේෂ කොට්ඨාශ (කොළඹ) සංවර්ධන මණ්ඩලයේ සේවය;

(ක) 1951 ජූනි 1 වැනි දින සිට ලංකාණ්ඩුව විසින් පවරා ගන්නා ලද සේවකයන් විසින් සීමාසහිත කේබල් සහ වයර්ලස් සමාගම යටතේ 1951 ජූනි 1 වැනි දිනට පූර්වයෙන් කරන ලද සේවය;

(ග)සනීපාරක්ෂක මණ්ඩලයක් යටතේ සේවය;

(ජ) [1]දීමනාවක් ලබමින් නිර්වේතන නේවාසික නිලධාරියකු වශයෙන් කරන සේවය;

(ට) 1951 ජූනි මස 1 වෙනි දින සිට ලංකා ආණ්ඩුව යටතට පවරා ගන්නා ලදුව, 1978 මාර්තු මස 29 වෙනි දින විදේශ විදුලි සංදේශ සේවයෙහි නියුක්තව සිටින සේවකයන්ගේ සීමා සහිත කේබල් ඇන්ඩ් වයර්ලස් සමාගම යටතේ වූ 1951 ජූනි මස 1 වන දිනට පෙර සේවය;

(ඨ) දෙවන ලෝක මහා සංග්‍රාම කාලය තුළ හෝ ඉන්පසුව බ්‍රිතාන්‍ය ආණ්ඩුව යටතේ ශ්‍රී ලංකාවෙහි කලින් තිබුණු බ්‍රිතාන්‍ය සන්නද්ධ හමුදා ආයතනවලට අයත් ශ්‍රී ලංකාවේ ත්‍රිවිධ හමුදාවේ සහ ආණ්ඩුවේ සෙසු දෙපාර්තමේන්තුවල කලින් සිටි හා දැනට සේවයෙහි නියුක්ත සිවිල් සේවකයන්ගේ එකී සේවාව සඳහා බ්‍රිතාන්‍ය ආණ්ඩුව විසින් ගෙවන ලද පාරිතෝෂික මුදලක් සේවා නියුක්තයා විසින් ඒකාබද්ධ අරමුදලට ආපසු ගෙවා තිබෙන්නා වූ හෝ විශ්‍රාම ගැනීමේ දී ඔහුට ගෙවිය යුතු වන පරිවර්තිත පාරිතෝෂික මුදලින් එකී පාරිතෝෂික මුදල අඩු කිරීමට සේවා නියුක්තයා එකඟ වන්නා වූ හෝ අවස්ථාවක, එවැනි සේවා නියුක්තයෙකු බ්‍රිතාන්‍ය ආණ්ඩුව විසින් සේවයෙහි නියුක්ත කර ගන්නා ලද දිනය හෝ 1939 සැප්තැම්බර් මස 3 වන දිනය හෝ යන දින දෙකින් පසුව යෙදෙන දිනයෙහි සිට එවැනි සිවිල් සේවා නියුක්තයන්ගේ සේවය;

(ඩ) ලංකා බෞද්ධ මණ්ඩලයේ ශ්‍රී ලංකා සංස්කෘතික සභාවේ සේවය;

(ඪ) ශිෂ්‍ය ගුරුවරුන් සහ දුෂ්කර ප්‍රදේශවල ගුරුවරුන් වශයෙන් කරන සේවය;

[2](ද) උපාධිධාරී අභ්‍යාස යෝජනා ක්‍රමය යටතේ උපාධිධාරී අභ්‍යාසලාභියෙකු ලෙස පුහුණු වීම ලැබූ කාල සීමාව;

(ත) ගිවිසුමකට බැඳී කම්කරු දෙපාර්තමේන්තුවේ වෘත්තීය අභ්‍යාස මධ්‍යස්ථානයක උපදේශකවරයකු වශයෙන්;

---

[1]1972.11.03 දින අංක 32 දරණ ගැසට් පත්‍රය බලන්න.

[2]1983.08.26 දින අංක 260 දරණ ගැසට් පත්‍රය බලන්න.

[3]1992.10.23 දින අංක 738 දරණ ගැසට් පත්‍රය බලන්න.

[3](ඛ) 1974ට ප්‍රථම ගංගා භූමි සංවර්ධන මණ්ඩලයේ සේවය වෙනුවෙන් විශ්‍රාම ප්‍රතිලාභ වශයෙන් ලැබුණ යම් මුදලක්, ඒ ප්‍රතිලාභ ලැබුණ දිනයේ සිට ආපසු දෙන දිනය තෙක් වර්ෂයකට සියයට හතර බැගින් වූ සුළු පොළියත් සමඟ ආපසු ගෙවනු ලබන අවස්ථාවක 1974 ට ප්‍රථම වූ ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩලයේ සේවය.

[1](ම) 1981 සැප්තැම්බර් මස 01 දිනට පෙර නොවන දිනයක දී සන්නද්ධ හමුදා ස්වේච්ඡා සේවයේ කරන ලද සේවය.

[2](ර) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සේවය කළ කාල පරිච්ඡේදය සඳහා ගණන් බලන ලද වැන්දඹු සහ අනාත්දරු විශ්‍රාම වැටුප් දායක මුදල සමගම සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල් සේවක භාර අරමුදලට දායක මුදල් හා ගෙවන ලද පාරිතෝෂිකය. විශ්‍රාම ලබන අවස්ථාවේදී පරිවර්තිත විශ්‍රාම වැටුපෙන් අයකර ගැනීමට යටත්ව ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව යටතේ 1993 ජනවාරි මස 01 වැනි දිනට කළ සේවය

(2) (1) වන උප වගන්තියෙහි සඳහන් යම් සේවා කාලයක් විෂමාචාරය නිසා අවසන් කරන ලද්දේ නම්, එසේ අවසන් කරන ලද දිනයට පෙර වූ සේවා කාලය හෝ කාල මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු විශ්‍රාම වැටුප හෝ පාරිතෝෂිකය සඳහා ගණන් නොගත යුතුය.

(3) තේ පාලන දෙපාර්තමේන්තුවේ හෝ රබර් පාලන දෙපාර්තමේන්තුවේ නිලධාරියකු වශයෙන් සිටියදී, 1963 ජනවාරි 1 වැනි දින සිට පමණක් රජය යටතේ විශ්‍රාම වැටුප් ලැබෙන නිලධාරියකු වීමට සිය මනාපය පළකර සිටි කිසි තැනැත්තකු සම්බන්ධයෙන් (1) උප වගන්තියේ (ඖ) කරුණෙහි විධිවිධාන අදාළ නොවිය යුතුය.

[3]3ආ. දීමනාවක් ලබමින් සීමාවාසික වෛද්‍ය නිලධාරියකු වශයෙන් කරන සේවය, ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු වශයෙන් කරන නිත්‍ය සේවය හෝ වැඩ බලන සේවය සමඟ අඛණ්ඩව තිබුනොත් මේ ව්‍යවස්ථාවන් යටතේ කිසියම් විශ්‍රාම වැටුපක් හෝ පාරිතෝෂිකයක් හෝ ලැබිය හැකි සේවය වශයෙන් ගණන් ගත යුතුය.

3ඇ. අවලංගු කරන ලදී.

3ඈ. අවලංගු කරන ලදී.

3ඉ(1) මේ ව්‍යවස්ථා සංග්‍රහයෙහි විරුද්ධ තත්ත්වයකින් කුමක් සඳහන් වුවද, පාඨශාලා ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් නියෝගවල 2(ix) වැනි නියෝගය යටතේ "ලේඛනගත සේවය" ලෙස ගණන් ගනු ලබන සේවා කාලය හෝ සේවා කාල එබඳු සේවා කාලය තුළ හෝ අතර නැතහොත් එබඳු යම් සේවා කාලයක් හා මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුපක් හෝ පාරිතෝෂිකයක් ගෙවනු ලැබිය හැකි සේවා කාලයක් අතර විය හැකි යම් ඛණ්ඩවීමක් ගැන නොසලකා, මෙම විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුපක් හෝ පාරිතෝෂිකයක් ගෙවිය හැකි සේවය ද සමඟ විශ්‍රාම වැටුප් හෝ පාරිතෝෂික ගෙවීම සඳහා ගණන් ගත යුතුය. එසේ වුවද ---

[4]3ඉඉ. මේ ව්‍යවස්ථා සංග්‍රහයෙහි පටහැනිව කුමක් සඳහන් වුව ද රජය විසින් අත්කර ගන්නා ලද වතු පාසල්වල ගුරුවරුන්ගේ සේවා කාලය හෝ සේවා කාල, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප හෝ පාරිතෝෂිකය ගෙවිය යුතු සේවා කාලයක් ද සමඟ මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු විශ්‍රාම වැටුප හෝ පාරිතෝෂිකය සඳහා ගණන් ගනු ලැබිය යුතු අතර, එසේ ගණන් ගැනීමේ දී එවැනි යම් සේවා කාලය තුළ හෝ ඒවා අතර නැතහොත් එවැනි යම් සේවා කාලයක් සහ මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප හෝ පාරිතෝෂිකය ගෙවිය යුතු සේවා කාලයක් අතර යම් ඛණ්ඩයක් වුව ද එය නොතැකිය යුතුය.

එසේ වුව ද, එවැනි යම් සේවා කාලයක් විෂමාචාරය නිසා අවසන් කරන ලද අවස්ථාවක, එසේ සේවය අවසන් කිරීමේ දිනයට පෙරාතුව වූ සේවා කාලය හෝ සේවා කාල මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවනු ලබන විශ්‍රාම වැටුප හෝ පාරිතෝෂිකය සඳහා ගණන් නොගත යුතුය.

(අ) විෂමාචාරය හේතුකොට එබඳු යම් ලේඛනගත සේවා කාලයක් කෙළවර කරන ලද අවස්ථාවක, ඒ කෙළවර කිරීමට පෙරාතුව වූ ලේඛනගත සේවා කාලය හෝ සේවා කාල මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය හැකි විශ්‍රාම වැටුප් හෝ පාරිතෝෂික සඳහා ගණන් නොගත යුතුය.

---

[1] 1996.10.04 දින අංක 944 දරණ ගැසට් පත්‍රය බලන්න.

[2] 2000.06.09 දින දරණ ගැසට් පත්‍රය බලන්න. මෙම සංශෝධනය 1996.01.01 වැනි දින සිට ක්‍රියාත්මක වී ඇති ලෙස සලකනු ලැබිය යුතුය.

[3] 1972.11.03 දින අංක 32 දරණ ගැසට් පත්‍රය බලන්න.

[4] 1994.11.04 දින අංක 844 දරණ ගැසට් පත්‍රය බලන්න.

(ආ) පාසල් ගුරුවරියන්ගේ විශ්‍රාම වැටුප් නියෝගවල 5 වැනි නියෝගයේ විධිවිධාන අනුව ගුරුවරයකු විශ්‍රාම වැටුපට දායක මුදල් ගෙවීමට බැඳී සිටි යම් ලේඛනගත සේවා කාලයක් විශ්‍රාම වැටුපට දායක මුදල් ගෙවා නොමැති අවස්ථාවක, ඒ කාලය සම්බන්ධයෙන් ගෙවිය යුතු දායක මුදල් ඒ ගුරුවරයා විසින් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ගෙවනු ලැබුවහොත් පමණක්ම ඒ ලේඛනගත සේවා කාලය මෙම ව්‍යවස්ථා යටතේ විශ්‍රාම වැටුප් හෝ පාරිතෝෂික ගෙවීම සඳහා ගණන් ගත යුතුය.

(ඇ) එබඳු යම් ලේඛණගත සේවා කාලයක් සම්බන්ධයෙන් පාසල් ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් නියෝගවල 5 වැනි නියෝගය යටතේ යම් ගුරුවරයෙකු විසින් ගෙවන ලද දායක මුදල් ඔහු වෙත ආපසු ගෙවන ලද අවස්ථාවක, ඒ ගුරුවරයා විසින් තමන් වෙත ආපසු ගෙවන ලද දායක මුදලට සමාන මුදලක් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ගෙවනු ලැබුවහොත් පමණක්ම ඒ ලේඛණගත සේවා කාලය මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් හෝ පාරිතෝෂික ගෙවීම සඳහා ගණන් ගත යුතුය.

3 ඊ. මෙම ව්‍යවස්ථාවන්හි පටහැනිව කුමක් සඳහන් වුවද, 1961 ජනවාරි 1 වැනිදා සිට 1962 දෙසැම්බර් 31 වැනිදා දක්වා කාලය තුළ තේ පාලක දෙපාර්තමේන්තුවේ හෝ රබර් පාලක දෙපාර්තමේන්තුවේ සේවය කළ කිසියම් රජයේ නිලධාරියකුගේ සේවය, මෙම ව්‍යවස්ථාවන් යටතේ විශ්‍රාම වැටුපක් හෝ පාරිතෝෂිකයක් හෝ ගෙවිය හැකි යම් සේවා කාලයකට පසුව එළඹී ඇතිනම්, මෙම ව්‍යවස්ථාව යටතේ ගෙවිය හැකි යම් විශ්‍රාම වැටුපක් හෝ පාරිතෝෂිකයක් හෝ සඳහා ගණන් ගත යුත්තේ අදාළ සේවා කාලය සඳහා ඔහු විසින් ලබාගෙන ඇති පාරිතෝෂික මුදල, එම මුදල ඔහු ලැබූ දින සිට එම මුදලට වර්ෂයකට සියයට හතර බැගින් වූ සුළු පොළියක් ද සමඟ ආපසු ගෙවුවොත් පමණි.

[1]3උ(1) අධ්‍යාපන අධ්‍යක්ෂ උපකෘත පාසලක කළමනාකරු වශයෙන් පත් කරනු ලැබූ දින සිට එම පාසලේ දේපළ රජයට පවරා ගනු ලැබූ දිනය තෙක් එම පාසලෙහි කරන ලද සේවය මෙම ව්‍යවස්ථාවල කාර්යයන් සඳහා රජය යටතේ සේවය ලෙස සලකනු ලැබිය යුතු අතර, මෙ ව්‍යවස්ථාව යටතේ විශ්‍රාම වැටුපක් හෝ පාරිතෝෂිකයක් හෝ ප්‍රදානය කිරීම සඳහා එම සේවය ගණන් ගනු ලැබිය යුතුය.

(2) මෙ වගන්තියේ "උපකෘත පාසල" යන යෙදුමෙහි 1960 අංක 5 දරණ උපකෘත පාසල් හා ගුරු විද්‍යාල (විශේෂ විධිවිධාන) පනතෙහි එයට ඇති අර්ථයම ඇත්තේය.

[2]3ඌ(1) මුදාහරිනු ලැබූ සන්නද්ධ හමුදාවල යම් සාමාජිකයෙකුගේ අවස්ථාවෝචිත පරිදි, යුද්ධ හමුදාවේ නිත්‍ය බලකායේ, නිත්‍ය නාවික බලකායේ හෝ නිත්‍ය ගුවන් බලකායේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව, එබඳු සේවයක් සඳහා ගෙවනු ලබන පාරිතෝෂිකයක් සන්නද්ධ සේවාවන්ට අයත් වන එබඳු සාමාජිකයෙකු විසින් ඒකාබද්ධ අරමුදලට ආපසු ගෙවා ඇති අවස්ථාවන්හිදී හෝ විශ්‍රාම ගනු ලබන විට සන්නද්ධ සේවාවන්හි සාමාජිකයෙකුට ගෙවනු ලබන පරිවර්තිත පාරිතෝෂිකයෙන් හෝ විශ්‍රාම වැටුපෙන් එබඳු පාරිතෝෂිකයක් අඩු කරගනු ලැබීමට ඔහු එකඟ වුවහොත් මෙ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව ඇත්ද, මෙ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුපක හෝ පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතුය.

(2) මෙ වගන්තියේ කාර්යයන් සඳහා -

"සන්නද්ධ හමුදාවල සමාජිකයෙකු" යන්නෙන් -

(අ) ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය බලකායේ නිලධාරියෙකු වන හෝ සෙබළෙකු වන; හෝ

(ආ) ශ්‍රී ලංකා නාවික හමුදාවේ නිත්‍ය නාවික බලකායේ නිලධරයකු වන හෝ නාවිකයෙකු වන; හෝ

(ඇ) ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ නිත්‍ය ගුවන් බලකායේ නිලධරයකු වන හෝ ගුවන් භටයෙකු වන තැනැත්තෙකු අදහස් වේ.

"මුදාහරිනු ලැබූ" යන්නෙන් -

(අ) නිලධරයින් සම්බන්ධයෙන් වන විට ජනාධිපතිවරයාගේ අනුමැතිය ඇතිව සන්නද්ධ සේවා වලින් විශ්‍රාම යාම සහ,

(ආ) සෙබළුන් නැවියන් හෝ ගුවන් භටයන් සම්බන්ධයෙන් වන විට, පිළිවෙලින් යුද්ධ හමුදාපතිගේ, නාවික හමුදාපතිගේ හෝ ගුවන් හමුදාපතිගේ අනුමැතිය ඇතිව නිදහස් වීම අදහස් වේ.

4. සොළොස් හැවිරිදි වයසට අඩු රජයේ නිලධාරියකුගේ සේවය මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප හෝ පාරිතෝෂිකය සඳහා ගණන් ගනු නොලැබිය යුතුය.

4.අ. අවලංගු කරන ලදී.

4 ආ (1) මෙම ව්‍යවස්ථා සංග්‍රහයෙහි විරුද්ධව කුමක් සඳහන් වුවද, යම් තැනැත්තකු රජය යටතේ පුහුණුවීමේ හෝ පුරුදු කිරීමේ කාලයක් සම්පූර්ණ කළ පසු එකී පුහුණුවීම හෝ පුරුදු කිරීම කලින් අවශ්‍ය වූ රජයේ නිලයකට හෝ තනතුරකට පත් කරනු ලැබ, අවසානයේ දී විශ්‍රාම වැටුප් හිමි නිලයකින් හෝ තනතුරකින් විශ්‍රාම ලද්දේ නම් එකී පුහුණු වීමේ හෝ පුරුදු කිරීමේ කාලය සඳහා වැටුප් ගෙවූ ආකාරය නොසලකා, එම පුහුණුවීමේ හෝ පුරුදු කිරීමේ කාලය මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු විශ්‍රාම වැටුප හෝ පාරිතෝෂිකය සඳහා ගණන් ගත යුතුය.

---

[1]1975.09.12 දින අංක 181 දරණ ගැසට් පත්‍රය බලන්න.

[2]1977.12.02 දින අංක 294 දරණ ගැසට් පත්‍රය බලන්න.

(2) ඉහත දැක්වෙන උප වගන්තියෙහි කාර්යය සඳහා, යම් රජයේ නිලධාරියකුට ඔහුගේ පුහුණු කිරීමේ හෝ පුරුදු කිරීමෙ කාලය සම්පූර්ණ කිරීමෙන් ඉක්බිති ඔහු පුහුණුකරනු ලැබූ හෝ පුහුණු කරනු ලැබූ නිලය හෝ තනතුර සඳහා පත්වීමක් ලබා ගැනීමට ඔහුගේ පාලනයට යටත් නොවූ හේතූන් නිසා නොහැකි වී පසු කලෙක දී යම් නිලයකට හෝ තනතුරකට පත් කරන ලද්දේ නම්, ඒ නිසා ඇති වූ සේවයේ කඩවීම නොසලකා හරිනු ලැබිය යුතුය.

4ඇ. (1) මෙම ව්‍යවස්ථාවන්හි පටහැනිව කුමක් සඳහන් වුවද, කොළඹ වරාය කොමිෂන් සභාවේ ආධුනිකයෙකු ලංකා රජය යටතේ වූ ආධුනික කාලයක් සේවය කොට "ඒ" උප ලේඛනයෙහි සඳහන් කොට ඇත්තා වූ කොළඹ වරාය කොමිසන් සභාවේ හෝ වෙළඳ නැව් කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ හෝ යම් විශ්‍රාම වැටුප් සහිත තනතුරකට තමා පත් කරනු ලැබීම සඳහා පූර්ව අවශ්‍යතාවන් වන්නා වූ ද, ලංකා රජය විසින් නොසලස්වනු ලබන්නා වූ ද, විදේශීය නෞකාවල අතිරේක මුහුදු අභ්‍යාසයක් ලබන අවස්ථාවක, ඒ කාල සීමාව තුළ වේතනය ගෙවනු ලැබූ ක්‍රමය ගැන නොසලකා ලංකා රජය යටතේ වූ සම්පූර්ණ ආධුනික සේවා කාල පරිච්ඡේදය සහ ලේකම්වරයා විසින් ස්වකීය අභිමතය පරිදි නිශ්චය කරනු ලැබිය හැකි අයුරු එකී මුහුදු අභ්‍යාස කාල පරිච්ඡේදයේ හෝ කාල පරිච්ඡේදවල සමස්ථය හෝ ඉන් යම් කොටසක් හෝ මෙම ව්‍යවස්ථා යටතේ විශ්‍රාම වැටුප් හෝ පාරිතෝෂික සඳහා වූ සේවයක් වශයෙන් ගණන් ගත යුතුය.

(2) (1) වැනි උප වගන්තියේ කාර්යයන් සඳහා, ලංකා රජය යටතේ වූ ආධුනික සේවා කාල පරිච්ඡේදයත් අතර හෝ, එම මුහුදු අභ්‍යාස කාල පරිච්ඡේදයක් "ඒ" උප ලේඛනයෙහි නිශ්චිතව සඳහන් කොට ඇත්තා වූ ද, කොළඹ වරාය කොමිසන් සභාවේ හෝ වෙළඳ නැව් කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ හෝ යම් විශ්‍රාම වැටුප් සහිත තනතුරකට පත් කරනු ලැබීමත් අතර හෝ සිදු වී ඇති යම් සේවය කඩවීමක් එකී ආධුනිකයා විසින් පාලනය කර ගනු නොලැබිය හැකි වූ හේතූන් නිසා සිදුවී ඇති බවට ලේකම්වරයා සෑහීමකට පත් වුවහොත් එසේ සේවය කඩවීම නොසලකා හැරිය යුතුය.

5. ජනාධිපති ධූරයට පත්වන ලංකාණ්ඩුවේ ඕනෑම සේවකයකුට ඒ ධූරයෙන් අස්වන විට වයස අවුරුදු පණස් පහට අඩු වුවහොත්, ජනාධිපති ධූරයට පත්වීමේදී ඔහු අත්හළ ධූරය දිගටම දරා, අසනීපය නිසා සේවයෙන් නිදහස් වීමට සිදුවූවා නම් ඔහුට ලැබෙන්නට තිබුණු විශ්‍රාම වැටුප ඔහුට හිමිවිය යුතුය.

6. එහෙත් එවැනි නිලධාරියකුට, ඔහු බාර ගනිතියි යුක්ති සහගතව බලාපොරොත්තු විය හැකි වෙන තනතුරක් ආණ්ඩුව යටතේ දුන්විට, ඔහු එය භාරගත හොත්, එසේ සේවය කරන ඒ කාලය තුළදී ඔහුට විශ්‍රාම වැටුප ගෙවීම අත් හිටවිය යුතුය. දෙනු ලබන තනතුර ඔහු ප්‍රතික්ෂේප කළහොත් ඔහුට වයස පණස් පහ වනතුරු විශ්‍රාම වැටුප් ගෙවීම නතර කළ යුතුය.

### තනතුරු නැතිකිරීම

7. (1) තනතුර නැති කිරීමේදී තම තනතුර විශ්‍රාම වැටුප් සහිතයයි ප්‍රකාශ කරන ලද ආණ්ඩුවේ සේවකයකුට දිය හැකි විශ්‍රාම වැටුප හෝ පාරිතෝෂිකය හෝ පහත දැක්වන අයුරු වේ.

[1](i) මාස එකසිය විස්සක දළ සේවා කාලයක් නිලධරයා විසින් සම්පූර්ණ කර ඇත්නම් 10 වන වගන්තියට අනුකූලව විශ්‍රාම වැටුප් සඳහා ගණන් ගත යුතු සේවා කාලයට අවුරුදු පහක් එකතුකර අවස්ථාවෝචිත පරිදි 2 (i) වගන්තියෙහි හෝ 2අ (i) වගන්තියෙහි විධිවිධාන සලසා ඇති පරිදි විශ්‍රාම වැටුපක් ඔහුට ප්‍රදානය කරනු ලැබිය හැකිය. එසේ එකතු කෙරෙන සේවය එකතු කරනු ලැබූ විට ඔහු වයස අවුරුදු 55 සම්පූර්ණ කළ හැකිව තිබූ සේවා කාලය කිසිදු අවස්ථාවක නොඉක්මවිය යුතුය.

(ii) නිලධාරියා මාස එකසිය විස්සක දළ සේවයක් සම්පූර්ණ කර නැතොත්, 10 වැනි වගන්තිය අනුව විශ්‍රාම වැටුප සඳහා ගණන් ගන්නා සේවයේ ද ඊට එකතුකරන ලද ඒ සේවයෙන් සියයට පනාහක සේවයේ ද එක් එක් මාසය වෙනුවෙන් මාස් පඩියෙන් 1/12 ක පාරිතෝෂිකයක් ඔහුට දිය හැකිය.

[1](2) එසේ වුව ද සෑම විටම එසේ විශ්‍රාම ගන්වනු ලබන රජයේ නිලධාරියා නැවත සේවයේ නියුක්ත කරවීම සඳහා රජයේ සේවයට ආපසු කැඳවනු ලැබීමට යටත්වන අතර, නැවත සේවයේ නියුක්ත කරවීමට ප්‍රථමයෙන් වූ සේවා කාලයට එකතු කරනු ලබන සේවා අවුරුදු සංඛ්‍යාව කිසිදු අවස්ථාවක අවුරුදු 30 (තිහ) නොඉක්මවිය යුතුය.

### විශ්‍රාම වැටුප් ගණන් බැලිය යුතු ආකාරය

8. රජයේ නිලධාරියකුට දෙනු ලබන විශ්‍රාම වැටුප හෝ පාරිතෝෂිකය හෝ, ඔහු විශ්‍රාම යන අවස්ථාවේදී ඔහු ලැබූ වැටුප මත ගණන් බලනු ලැබිය යුතුය.

එසේ වුවද, අකාර්යක්ෂමතාවය නිසා සේවයෙන් පහ කිරීම වෙනුවට සානුකම්පිත විකල්පයක් වශයෙන් හෝ තනතුර අතහැර යාම මත නිලධාරියකු විශ්‍රාම ගන්වා, 15 වන වගන්තිය යටතේ විශ්‍රාම වැටුපක් ගෙවනු ලබන අවස්ථාවක, එවැනි නිලධාරියකුට ගෙවනු ලබන විශ්‍රාම වැටුපක් අවස්ථාවෝචිත පරිදි, ඒ නිලධාරියා සේවයෙන් පහ කරනු ලැබූ අවස්ථාවේ හෝ තනතුර අතහැර ගිය අවස්ථාවේ හෝ ලැබූ වැටුප මත ගණන් බැලිය යුතුය.

---

[1]1997.06.19 දින අංක 981 දරණ ගැසට් පත්‍රය බලන්න.

[1]එසේකුදු වුවත්, මෙම ව්‍යවස්ථා සංග්‍රහයෙහි මීට පටහැනිව කුමක් සඳහන් වුවද 1987 නොවැම්බර් මස 31 දක්වා (එකී දින දෙක ද ඇතුළුව) කාලය තුළ විශ්‍රාම ගන්නා වූ හෝ තුවාලයකින් පීඩා විඳින්නා වූ හෝ මිය ගියා වූ රජයේ නිලධාරියෙකුට හෝ නිලධාරියෙකු වෙනුවෙන් 1986 මැයි 2 වැනි දින අංක 327 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාර ප්‍රදානයක් ලැබීමට සුදුසුකම් ඇති කල්හි ඔහුට ගෙවිය යුතු වන විශ්‍රාම වැටුප හෝ පාරිතෝෂිකය හෝ වෙනත් කිසියම් ප්‍රදානයක් ගෙවීමේ කාර්යය සඳහා එම නිලධාරියා ඉහත කී වැටුපට අනුරූප වූ 1988 නව ඒකාබද්ධ වැටුප 1987 දෙසැම්බර් 11 වැනි දින අංක 387 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාර ලබා ඇත්තා සේ සැලකිය යුතුය.

8අ, 8ආ, 8ඇ අවලංගු කරන ලදී.

8ඇ. මේ ව්‍යවස්ථා සංග්‍රහයේ කුමක් සඳහන් වුව ද, නිලධරයෙකු විශ්‍රාම ගත්තේ යම් අවස්ථානුගත කරුණු මත ද, ඒ කරුණු මත ඔහු විශ්‍රාම නොගත්තේ නම් ඔහුට හිමිවිය හැකිව තිබූ විශ්‍රාම වැටුපට වඩා අඩු විශ්‍රාම වැටුපක් ඒ නිලධරයෙකුට ප්‍රදානය කරනු ලබන බව අමාත්‍ය මණ්ඩලයේ මතය වන අවස්ථාවක අමාත්‍ය මණ්ඩලය විධාන කරන පරිදි වැඩි කරන ලද විශ්‍රාම වැටුපක් ගෙවීමට ලේකම්වරයා විසින් බලය දෙනු ලැබිය හැකිය. එසේ වුව ද, මේ වගන්තිය යටතේ ප්‍රදානය කරනු ලබන විශ්‍රාම වැටුප තම පූර්ණ ධුර කාලය සේවය කිරීමෙන් පසුව ඒ නිලධරයා විශ්‍රාම ගත්තේ නම්, ඔහුට හිමිවිය හැකිව තිබූ මුදල නොඉක්මවිය යුතුය.

9 (i). 8 වන වගන්තිය හෝ අංක 8 අ දරණ වගන්තිය සම්බන්ධයෙන් වැටුප යන්නට, වැටුපට සමාන වන පුද්ගලික දීමනාව ඇතුළත් වේ. එහෙත් වෙන කිසිම ලැබීමක් ඊට ඇතුළත් නොවේ.

(ii) සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ නියුක්ති යුරෝපීය මෙට්‍රන් කෙනෙකු හෝ සාත්තුකාර සහෝදරියක හෝ මේ රටෙන්ම තෝරාපත් කරගත් ඕනෑම මෙට්‍රන් කෙනෙකු හෝ සාත්තුකාර සහෝදරියක හෝ සාත්තු සේවිකාවක හෝ සම්බන්ධයෙන් මෙහි අන්තිමට දැක්වුණු වගන්තියේ කටයුතු සඳහා ඒ මෙට්‍රන් හෝ සාත්තුකාර සහෝදරිය හෝ සේවිකාව හෝ පදිංචි වී සිටින, කුලිය නොගෙවන ආණ්ඩුවේ නිවාසයේ වාර්ෂික වටිනාකම "වැටුප" යන්නට ඇතුළත් වේ. එසේකුදු වුවත්, ඒ මෙට්‍රන්ගේ හෝ සාත්තුකාර සහෝදරියගේ හෝ සේවිකාවගේ හෝ වාර්ෂික වැටුපෙන් හයෙන් පංගුවකට වැඩි මුදලක් ඒ වාර්ෂික වටිනාකම වශයෙන් ගණන් නොගත යුතුය.

(iii) මේ ව්‍යවස්ථා සංග්‍රහය සම්බන්ධ කටයුතු සඳහා, ගම්මුලාදෑනියකුට හෝ කට්ටුකංකානම් කෙනෙකුට හෝ වැව් ලේකම් කෙනෙකුට හෝ ගෙවන මාසික දීමනාව ඔහුට ගෙවනු ලබන වැටුප වශයෙන් සැළකිය යුතුය.

(iv) (iii) වැනි උපවගන්තියේ විධිවිධානයන්, කට්ටුකංකානම් කෙනෙකුගේ හෝ වැව් ලේකම් කෙනෙකුගේ හෝ දීමනාව සම්බන්ධයෙන් වූ කල ඒවා 1946 ජනවාරි මස 1 වැනි දින වලංගු වූවා සේ සැළකිය යුතුය.

[2](v) (අ) 1974 ජූලි මස 1 වැනි දිනට පසු විශ්‍රාම ගන්නා සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ යම් වෛද්‍ය නිලධාරියෙකු සම්බන්ධයෙන් වූ විට, මෙම ව්‍යවස්ථාවල 8 වන වගන්තියේ කාර්යය සඳහා "වැටුප" යන යෙදුමට පුද්ගලික වෘත්තීය වෙනුවට ඒ වෛද්‍ය නිලධාරියාට ගෙවනු ලබන විශ්‍රාම වැටුප් රහිත දීමනාව ඇතුළත් විය

එසේ වුවද :-

(i) වෛද්‍ය නිලධාරියෙකු විසින් ඔහුගේ විශ්‍රාම ගැනීමට කලින් ඇති අවුරුදු 3 ඇතුළතදී විශ්‍රාම වැටුප් රහිත දීමනාව ලබා නොමැති අවස්ථාවකදී හෝ ඔහු උසස් ශ්‍රේණියකට හෝ තනතුරකට උසස් වීමක් ලැබීමේ හේතුවෙන් එම ස්ථාවර විශ්‍රාම වැටුප් රහිත දීමනාව ලබා නොමැති අවස්ථාවකදී, ඒ වෛද්‍ය නිලධාරියාගේ විශ්‍රාම වැටුප ගණන් බැලීම සඳහා ගණන් ගන්නා වැටුපට එකතු කරන ප්‍රමාණය ඔහුගේ විශ්‍රාම ගැනීමේ දිනට කලින්ම, ඇති අවුරුදු 3 ඇතුළතදී ඔහු ලැබූ විශ්‍රාම වැටුප් රහිත දීමනාවල සාමාන්‍ය ගණන මත පදනම් විය යුතුය.

(ii) වෛද්‍ය නිලධාරියකු ඔහුගේ විශ්‍රාම ගැනීමට කලින් ඇති අවුරුදු 3 ඇතුලත දී උසස් ශ්‍රේණියකට හෝ තනතුරකට උසස් වීමක් ලබා නොමැති අවස්ථාවකදී හා ඔහුගේ විශ්‍රාම ගැනීමේ දිනට කලින්ම ඇති අවුරුදු 3 ඇතුළතදී එම ස්ථාවර විශ්‍රාම වැටුප් රහිත දීමනාව ලබා නොමැති අවස්ථාවකදී ඒ වෛද්‍ය නිලධාරියාගේ විශ්‍රාම වැටුප ගණන් බැලීමට ගණන් ගන්නා වැටුපට එකතු කරන ප්‍රමාණය ඔහුගේ විශ්‍රාම ගැනීමේ දින වන විට ඔහු විසින් ලබා ඇති විශ්‍රාම වැටුප් රහිත දීමනාව මත පදනම් විය යුතුය

මේ උප වගන්තියෙහි කාර්යයන් සඳහා "වෛද්‍ය නිලධාරියා" යන යෙදුමට ජ්‍යෙෂ්ඨ පරිපාලන ශ්‍රේණියේ හෝ නියෝජ්‍ය පරිපාලන ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරියෙකු සහ ගුරුවරයෙකු වශයෙන් හෝ නිලධාරියකු වශයෙන් සේවය කිරීම සඳහා ලංකා විශ්ව විද්‍යාලයට පත් කරනු ලබන්නා වූ ද, විශ්‍රාම ගැනීමේදී 1972 අංක 1 දරණ ලංකා විශ්ව විද්‍යාලීය පනතේ 42 වන වගන්තිය අනුව මේ ව්‍යවස්ථා යටතේ විශ්‍රාම වැටුපක් ලැබීම සඳහා සුදුසුකම් ලබන්නා වූ ද, සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ ඕනෑම වෛද්‍ය නිලධාරියෙකු ඇතුළත් විය යුතුය.

(ආ) මෙම උප වගන්තියේ ඉහත සේවයේ විධිවිධාන 1964 අගෝස්තු මස 1 වැනි දින ක්‍රියාත්මක වී ඇතැයි සැලකිය යුතුය.

---

[1]1992.01.24 දින අංක 699 දරණ ගැසට් පත්‍රය බලන්න.

[2]1976.08.13 දින අංක 226 දරණ ගැසට් පත්‍රය බලන්න.

(vi) 1964 අගෝස්තු මස 1 වැනි දින සේවයේ සිටි සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ යම් ඇපොතිකරි කෙනෙකු සම්බන්ධයෙන්, මෙම ව්‍යවස්ථාවල 8 වන වගන්තියේ කාර්යය සඳහා "වැටුප" යන යෙදුමට ඔහු විශ්‍රාම ලත් දිනයේදී ඔහු ලබා ගත් නියමිත විශ්‍රාම වැටුප් සහිත දීමනාව ඇතුළත් විය යුතුය.

එසේකුදු වුවත් ඒ විශ්‍රාම වැටුප් සහිත දීමනාව හෝ එම ස්ථාවර විශ්‍රාම වැටුප් සහිත දීමනාව ඔහු විසින් ඔහුගේ විශ්‍රාම ගැනීමේ දිනට කලින් ඇති අවුරුදු 3 ඇතුළතදී, ලබා නොමැති අවස්ථාවලදී, ඔහුගේ විශ්‍රාම වැටුප ගණන් බැලීම සඳහා ගණන් ගන්නා වැටුපට ඇතුළත් කළ යුතු විශ්‍රාම වැටුප් සහිත දීමනාව, ඔහුගේ විශ්‍රාම ගැනීමේ දිනට කලත් ඇති අවුරුදු 3 ඇතුළතදී ඔහු විසින් ලබන ලද විශ්‍රාම වැටුප් සහිත දීමනාවල සාමාන්‍ය ගණන විය යුතුය.

(vii) සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ ඖෂධ සංයෝජකයකු සම්බන්ධයෙන් මෙම ව්‍යවස්ථා සංග්‍රහයෙහි 8 වන වගන්තියේ කාර්යයන් සඳහා "වැටුප" යන පදයට ඔහු විසින් 1966 ජනවාරි 1 වැනි දින පටන්ගෙන 1968 අප්‍රේල් 30 දින අවසාන වන කාල සීමාව තුළ ලබාගත් මාසයකට රු.7.50 ක් වූ විශ්‍රාම වැටුප් සහිත දීමනාව ද ඇතුළු විය යුතුය.

(viii) 1977 අප්‍රේල් මස 5 වෙනි දිනට පසුව විශ්‍රාම ගන්නා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ යම් දන්ත ශල්‍ය වෛද්‍යවරයෙකු සම්බන්ධයෙන් මෙම ව්‍යවස්ථාවල 8 වන වගන්තියේ කාර්යය සඳහා "වැටුප" යන යෙදුමට පුද්ගලික වෘත්තිය වෙනුවට ඒ දන්ත ශල්‍ය වෛද්‍යවරයාට ගෙවනු ලබන විශ්‍රාම වැටුප් රහිත දීමනාව ඇතුළත් විය යුතුය.

(i) එසේ වුව ද දන්ත ශල්‍ය වෛද්‍යවරයෙකු විසින් ඔහුගේ විශ්‍රාම ගැනීමට කලින් ඇති අවුරුදු තුන ඇතුළත දී විශ්‍රාම වැටුප් රහිත දීමනාව ලබා නොමැති අවස්ථාවක දී හෝ ඔහු උසස් ශ්‍රේණියකට හෝ තනතුරකට උසස් වීමක් ලැබීමේ හේතුවෙන් එම ස්ථාවර විශ්‍රාම වැටුප් රහිත දීමනාව ලබා නොමැති අවස්ථාවක දී ඒ දන්ත ශල්‍ය වෛද්‍යවරයාගේ විශ්‍රාම වැටුප ගණන් බැලීම සඳහා වැටුපට එකතු කළ යුතු ප්‍රමාණය ඔහු විශ්‍රාම ගැනීමේ දිනට කලින් ඇති අවුරුදු තුන ඇතුළත දී ඔහු ලබන විශ්‍රාම වැටුප් රහිත දීමනාවල සාමාන්‍ය ගණන මත පදනම් විය යුතු ය.

(ii) දන්ත ශල්‍ය වෛද්‍යවරයෙකු විසින් ඔහුගේ විශ්‍රාම ගැනීමට කලින් ඇති අවුරුදු 3 ඇතුළතදී උසස් ශ්‍රේණියකට හෝ තනතුරකට උසස් වීමක් ලබා නොමැති අවස්ථාවකදී හා ඔහුගේ විශ්‍රාම ගැනීමේ දිනට කලින් ඇති අවුරුදු 3 ඇතුළතදී එම ස්ථාවර විශ්‍රාම වැටුප් රහිත දීමනාව ලබා නොමැති අවස්ථාවකදී එම දන්ත ශල්‍ය වෛද්‍යවරයාගේ විශ්‍රාම වැටුප් ගණන් බැලීමට ගණන් ගන්නා වැටුපට එකතු කරන ප්‍රමාණය විශ්‍රාම ගැනීමේ දිනය වන විට ඔහු විසින් ලබා ඇති විශ්‍රාම වැටුප් රහිත දීමනාව මත පදනම් විය යුතුය.

(iii) එසේම තවදුරටත් 1970 අංක 2 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධානයන්හි ප්‍රකාර වයස අවුරුදු පනස් පහ සම්පූර්ණ වූ විට හෝ ඉන් පසුව විශ්‍රාම ගත්තා වූ හෝ විශ්‍රාම ගැන්වූ දන්ත ශල්‍ය වෛද්‍යවරයෙකු සම්බන්ධයෙන් විශ්‍රාම වැටුප් ගණන් බැලීම සඳහා එකතු කළ යුතු විශ්‍රාම වැටුප් රහිත දීමනාව ඔහු විශ්‍රාම ගැනීමේ අවස්ථාවේදී ඔහු විසින් ලබා ඇති විශ්‍රාම වැටුප් රහිත දීමනාව විය යුතුය.

මේ උප වගන්තියේ කාර්යයන් සඳහා "දන්ත ශල්‍ය වෛද්‍යවරයෙකු" යන යෙදුමට ජ්‍යෙෂ්ඨ පරිපාලන ශ්‍රේණියට අයත් දන්ත ශල්‍ය වෛද්‍යවරයෙකු සහ ගුරුවරයෙකු වශයෙන් හෝ නිලධාරියෙකු වශයෙන් සේවය කිරීම සඳහා ලංකා විශ්ව විද්‍යාලයට පත් කරනු ලැබුවා වූ ද විශ්‍රාම ගැනීමේදී 1972 අංක 1 දරණ ලංකා විශ්ව විද්‍යාලයීය පනතේ 42 වන වගන්තිය අනුව මෙම ව්‍යවස්ථා යටතේ විශ්‍රාම වැටුපක් ලැබීම සඳහා සුදුසුකම් ලබන්නා වූ ද සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ දන්ත ශල්‍ය වෛද්‍යවරයෙකු ඇතුළත් විය යුතුය.

(ix) මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත යයි කරනු ලැබූ තනතුරක් දරණ, 1978 පෙබරවාරි මස 1 වන දිනයට පසුව විශ්‍රාම ගන්නා, රාජ්‍ය සේවයෙහි යම් ඉංජිනේරුවරයෙකු සම්බන්ධයෙන් වූ විට, මෙම ව්‍යවස්ථා සංග්‍රහයේ 8 වන වගන්තියේ කාර්යය සඳහා "වැටුප" යන යෙදුමට, ලේකම්වරයා විසින් නිශ්චය කරනු ලබන යම් විශ්‍රාම වැටුප් සහිත දීමනාවක් ඇතුළත් විය යුතුය ;

එසේ වුවද-

(i) යම් ඉංජිනේරුවරයෙකු ඉහළ ශ්‍රේණියකට හෝ තනතුරකට උසස් කරනු ලැබීම හේතුකොට ගෙන ඔහු විශ්‍රාම ලැබූ දිනයට පෙරාතුවම වූ අවුරුදු තුන සඳහා එකම අනුප්‍රමාණය මත එම විශ්‍රාම වැටුප සහිත දීමනාව ඔහු ලබා නොමැති අවස්ථාවක, ඒ ඉංජිනේරුවරයාගේ විශ්‍රාම වැටුප ආගණනය කරනු ලබන්නේ වැටුපට එකතු කරනු ලබන යම් ප්‍රමාණයක් මත ද ඒ ප්‍රමාණය, ඔහු විශ්‍රාම ලැබූ දිනයට පෙරාතුවම වූ අවුරුදු තුන ඇතුළත ඔහු ලැබූ එම දීමනාවේ සාමාන්‍ය ගණන මත පදනම් විය යුතුය; තව ද-

(ii) යම් ඉංජිනේරුවරයෙකු ඔහු විශ්‍රාම ලැබූ දිනයට පෙරාතුවම වූ අවුරුදු තුන ඇතුළත ඉහළ ශ්‍රේණියකට හෝ තනතුරකට උසස් වීමක් ලබා නොමැත්තා වූ ද ඔහු විශ්‍රාම ලැබූ දිනයට පෙරාතුවම වූ අවුරුදු තුන ඇතුළත එකම ප්‍රමාණය මත එම දීමනාව ලබා නොමැත්තා වූ ද අවස්ථාවක, ඒ ඉංජිනේරුවරයාගේ විශ්‍රාම වැටුප ආගණනය කරනු ලබන්නේ, වැටුපට එකතු කරනු ලබන යම් ප්‍රමාණයක් මත ද ඒ ප්‍රමාණය ඔහු විශ්‍රාම ලැබූ දිනයේ දී ඔහු ලැබූ දීමනාව මත පදනම් විය යුතුය.

එසේ වුවද, තවදුරටත් 1970 අංක 2 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාර ඉංජිනේරුවරයෙකු වයස අවුරුදු 55 සම්පූර්ණ වූ විට හෝ ඉන්පසුව විශ්‍රාම ලබන්නා වූ නැතහොත් විශ්‍රාම ගැන්වූ අවස්ථාවක විශ්‍රාම වැටුප් ආගණනය කරනු ලබන්නේ, වැටුපට එකතු කරනු ලබන යම් ප්‍රමාණයක් මතද ඒ ප්‍රමාණය ඔහු විශ්‍රාම ලැබූ දිනයේ දී ඔහු ලැබූ දීමනාව විය යුතුය.

මෙ උපවගන්තියේ කාර්යය සඳහා "ඉංජිනේරුවරයෙකු" යන යෙදුමෙන් ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ නිලධරයෙකු අදහස් වේ.

[1](x) 1995 ජූලි මස 26 වන දින හෝ එදිනට පසුව ශ්‍රේෂ්ඨාධිකරණයේ හෝ අභියාචනාධිකරණයේ යම් විනිශ්චයකාරවරයකු විශ්‍රාම ගිය විට, මෙ ව්‍යවස්ථා සංග්‍රහයේ 8 වන වගන්තියේ කාර්ය සඳහා "වැටුප" යන යෙදුමට එම විනිශ්චයකාරවරයා විශ්‍රාම යන අවස්ථාවේදී ලබාගත් විශ්‍රාම වැටුප් අහිමි දීමනාව ද ඇතුළත් විය යුතුය.

10.(i) පඩි රහිත නිවාඩු ලබා ගත් නිලධාරියකු සේවයට නොපැමිණ සිටින කිසිම කාලපරිච්ඡේදයක්, ඒ නිවාඩු ආණ්ඩුවේ ප්‍රතිපත්තිය අනුව දෙන ලද්දක් නොවේ නම්, විශ්‍රාම වැටුප් ගණන් බැලීම සඳහා සේවය වශයෙන් ගණන් නොගත යුතුය.

(ii) නිලධාරියකු අඩ වැටුප් පිට නිවාඩු ලබාගෙන සේවයට නොපැමිණ සිටින කවර කාලපරිච්ඡේදයකින් වුවත්, ඒ නිවාඩුව ආණ්ඩුවේ ප්‍රතිපත්තිය අනුව දෙන ලද්දක් නොවේ නම්, විශ්‍රාම වැටුප සඳහා ගණන් ගත යුත්තේ භාගයක් පමණකි.

(iii) ලංකාවේ සේවාවට මුලින්ම පත් වී, එහි ඒමට නිලධාරියකුට ගතවන කවර කාලපරිච්ඡේදයක් වුවත්, ඒ කාලපරිච්ඡේදය වෙනුවෙන් ලංකාවේ අරමුදල්වලින් අඩ වැටුපට අඩු නොවන වැටුපක් ඔහුට නොලැබී ඇත්නම් එම කාලපරිච්ඡේදය ගණන් නොගත යුතුය.

[2]10අ. (1) 1966 ජනවාරි 8 වන දින වැඩ වර්ජනයට සහභාගී වීම නිසා හෝ දේශපාලන හෝ වෘත්තීය සමිති කටයුතුවලට සහභාගී වීම නිසා හෝ 1965 අප්‍රේල් මස 13 වැනිදායින් පසු සේවයෙන් පහ කරනු ලද්දාවූ සේවය නතර කරනු ලැබුවා වූ යම් රජයේ නිලධාරියකු හෝ යම් දෛනික වැටුප් ලබන සේවකයෙකු, 1970 ජූනි මස 10 වන දින අංක 1 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධානයන් අනුව නැවත සේවයට බඳවාගනු ලැබූ අවස්ථාවකදී අවස්ථාවෝචිත පරිදි, සේවයෙන් පහ කරන ලද හෝ සේවය නතර කරන ලද හෝ දිනයේ සිට නැවත සේවයට බඳවා ගනු ලැබූ දිනය දක්වා කාල සීමාව, මෙම ව්‍යවස්ථාවලට පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මෙම ව්‍යවස්ථාවන් යටතේ යම් විශ්‍රාම වැටුපක් හෝ පාරිතෝෂිකයක් හෝ ප්‍රදානය කිරීම සඳහා සම්පූර්ණ වැටුප් සහිත සේවා කාලයක් ලෙස ගණන් බැලිය යුතුය.

[3](2) (i) ශ්‍රීලංකා ආණ්ඩුවේ සේවය ස්ථිර සහ විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දැරුවෙකු වූ යම් රජයේ නිලධාරියෙකු 1980 ජූලි මස සිට ධුරය අත්හරිනු ලැබූ ලෙස සලකනු ලැබුවා වූ ද මෙ ව්‍යවස්ථාවේ පටහැනිව කුමක් සඳහන් වුවද සේවයේ පුනර්යුක්ත කරනු නොලැබුවා වූ හෝ විශ්‍රාම නොලැබුවා වූ ද අවස්ථා වන -

(I) 1989 මැයි මස 11 වැනි දින අංක 32/89 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන වලට අනුකූලව මෙ ව්‍යවස්ථාව සවතේ විශ්‍රාම වැටුප් සහ පාරිතෝෂිකය හෝ විශ්‍රාම වැටුප හෝ පාරිතෝෂිකය පිළිබඳ කාර්යය සඳහා කල්පිත පදනම මත -

(අ) 1980 ජූලි මස ඔහු ධුරය හැර ගිය දින සිට අමාත්‍ය මණ්ඩල තීරණයේ දින වූ 1989 මැයි මස 08 වන දින හෝ ඔහු අවුරුදු 55 ට එළඹී දින හෝ යන දින දෙකින් කලින් එළඹෙන දින දක්වා ඔහු සම්පූර්ණ වැටුප් සහිත නොකඩවා සේවයේ යෙදී සිටි ලෙස ; සහ

(ආ) ඉහත (අ) හි සඳහන් කාලසීමාව තුළ ඔහුගේ සියලු වැටුප් වර්ධක උපයා ගනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතුය;

තවද,

(II) ඉහත (1) වන උපවගන්තියේ පදනම මත ඔහුට විශ්‍රාම වැටුපක් දිය යුතු අතර ඒ විශ්‍රාම වැටුප 1989 මැයි මස 08 වන දින සිට හෝ ඔහු අවුරුදු 55 ට එළඹී දින යන දින දෙකින් කලින් එළඹෙන දින සිට ඔහුට ගෙවනු ලැබිය යුතුය.

එසේ වුවද තම සේවය 1989 මැයි මස 08 වන දින වන විට මාස 120 ට අඩු නිලධරයෙක් සම්බන්ධයෙන් වන විට, සුදුසුකම ලැබීමෙහි ලා අවශ්‍ය අතිරේක මාස සංඛ්‍යාව ඔහුගේ සේවයට එකතු කරනු ඇත. ඒ අවස්ථාවේදී විශ්‍රාම වැටුප ගෙවීම ඔහු මාස 120 ක සේවය සම්පූර්ණ කරනු ලබන දින සිට ආරම්භ කරනු ලැබිය යුතුය.

(ii) එවකටත් විශ්‍රාම වැටුපක් ගෙවනු ලැබ ඇති යම් රජයේ නිලධරයෙකුට ඉහත දැක්වෙන (I) වන උපවගන්තියෙහි විධිවිධාන සලස්වා ඇති පරිදි ප්‍රතිශෝධිත වැටුප මත තම විශ්‍රාම වැටුප ප්‍රතිශෝධනය කර ගැනීමෙ මනාපය ඔහු සතු වන්නේය.

---

[1]1997.03.14 දින අංක 967 දරණ ගැසට් පත්‍රය බලන්න.

[2]1972.11.03 දින අංක 32 දරණ ගැසට් පත්‍රය බලන්න.

[3]1990.02.22 දින අංක 599 දරණ ගැසට් පත්‍රය බලන්න.

[1]10ආ. 1947 මහා වැඩ වර්ජනයට සහභාගී වීම හේතු කොට ගෙන සේවයෙන් පහ කරනු ලැබූ යම් රාජ්‍ය නිලධාරියකු හෝ රාජ්‍ය සේවාවන්හි යම් දෛනික වැටුප් ලබන සේවකයෙකු ආණ්ඩුව විසින් නැවත සේවයට බඳවාගනු ලැබූ අවස්ථාවකදී, ඔහු සේවයෙන් පහ කරන ලද දිනයෙන් ආරම්භව නැවත සේවයට බඳවාගනු ලැබූ දිනයෙන් අවසාන වන කාල සීමාව, මෙම ව්‍යවස්ථාවල පටහැනිව කුමක් සඳහන්ව ඇත්ද මෙම ව්‍යවස්ථාව යටතේ ගෙවිය හැකි යම් විශ්‍රාම වැටුපක් හෝ පාරිතෝෂිකයක් ප්‍රදානය කිරීම සඳහා සම්පූර්ණ වැටුප් සහිත සේවා කාලයක් ලෙස ගණන් ගත යුතුය.

[2]10ඇ. (1) ආණ්ඩුවේ අනුමැතිය ඇතිව, ආණ්ඩුව යටතේ වූ තම නිලය හෝ තනතුර අත්හැර ව්‍යවස්ථාපිත මණ්ඩලයක ස්ථිර රක්ෂාවක් භාරගත් විශ්‍රාම වැටුප් හිමි යම් රාජ්‍ය නිලධරයෙකු, ඒ ව්‍යවස්ථාපිත මණ්ඩලයේ අනුමැතිය ඇතිව නැවතත් ආණ්ඩුවෙහි සේවයට බැඳෙන අවස්ථාවක, ඒ නිලධාරියා ව්‍යවස්ථාපිත මණ්ඩලයට බැඳීම සඳහා සේවය අත්හැරීමට පෙර ආණ්ඩුව යටතේ කරන ලද සේවය, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ යම් විශ්‍රාම වැටුපක් හෝ පාරිතෝෂිකයක් ගෙවීම සඳහා ගණන් ගත යුතුය.

(2) මෙම වගන්තියෙහි කාර්යයන් සඳහා "ව්‍යවස්ථාපිත මණ්ඩලය" යන යෙදුමට මේ ව්‍යවස්ථා සංග්‍රහයේ 48 අ වන වගන්තියෙහි ඇති අර්ථයම වේ.

[3]10ඈ. පාලක නියෝග 408 බී, 220, 262 සහ 275 අනුව හෝ කලින් පැවති ඒවාට ප්‍රතිරූප නියෝග අනුව හෝ චෝදනා ඉදිරිපත් කර 1956 අප්‍රේල් මස 12 වන දිනට පෙර සේවයෙන් පහ කරනු ලැබූ හෝ සේවයෙන් පහ කරනු ලැබීමට සානුකම්පිත විකල්පයක් වශයෙන් අකාර්යක්ෂමතාව මත සේවයෙන් විශ්‍රාම ගන්වන ලද රාජ්‍ය නිලධරයෙකු හෝ රාජ්‍ය සේවයෙහි දෛනික වැටුප් ලබන යම් සේවකයෙකු හෝ එදිනට පසු ආණ්ඩුව විසින් නැවත සේවයට ගනු ලැබූ අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, ඔහු සේවයෙන් පහ කරන ලද හෝ විශ්‍රාම ගන්වන ලද දිනයෙන් ආරම්භව නැවත සේවයට බඳවාගනු ලබන දිනයෙන් අවසන් වන කාල සීමාව, මෙම ව්‍යවස්ථාවල පටහැනිව කුමක් සඳහන්ව ඇතද, මෙම ව්‍යවස්ථා යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුපක් හෝ පාරිතෝෂිකයක් හෝ ප්‍රදානය සඳහා සම්පූර්ණ වැටුප් සහිත සේවා කාලයක් ලෙස ගණන් ගත යුතුය.

එසේ වුවද, සේවයෙන් පහ කිරීමට සානුකම්පිත විකල්පයක් වශයෙන් අකාර්යක්ෂමතාවය මත විශ්‍රාම ගන්වනු ලැබූ යම් රාජ්‍ය නිලධාරියෙකු සම්බන්ධයෙන් වූ අවස්ථාවක, විශ්‍රාම ගන්වනු ලැබූ දින සිට නැවත සේවයට බඳවාගන්නා ලද දින දක්වා වූ කාල සීමාව ඔහු විශ්‍රාම වැටුපක් හා දීමනා කිසිවක් ලබා ඇත්නම් එය ආපසු ගෙවනු ලැබිය යුතුය.

### පුද්ගලික වෘත්තීය

11.(1) විශ්‍රාම ගන්නා නිලධාරියාගේ සම්පූර්ණ සේවා කාලයම ආණ්ඩුවේ සේවය සඳහාම ගතකර තිබීම විශ්‍රාම වැටුප ලැබීම පිණිස ඇති අත්‍යවශ්‍ය සුදුසුකමක් බව සාමාන්‍ය නියෝගයකි. එහෙත් ඇටෝර්නි ජනරාල් තැනගේ දෙපාර්තමේන්තුවේ නිලධාරීහු, සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ යටත් නිලධාරීහු, ගම්මුලාදෑනීහු, කට්ටු කංකානම්වරු සහ වැව් ලේකම්වරු යන මොවුන්ට මේ විධිවිධානය අදාළ නොවිය යුතුය.

(2) (1) වැනි උප වගන්තියේ විධිවිධානයන්, කට්ටු කංකානම්වරුන්ට හා වැව් ලේකම්වරුන්ට අදාළ වන කරමින්, 1946 ජනවාරි මස 1 වැනි දින වලංගු වූවා සේ සැලකිය යුතුය.

### අඩු කිරීම

12.(1) රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගන්නා කාලයේදී නොසැලකිලිමත්කම හෝ අක්‍රමිකතාව හෝ විෂමාචාරය හෝ නිසා ආණ්ඩුවේ නිලධාරියකුට විරුද්ධව විනයානුකූල ලෙස කටයුතු කෙරෙන අවස්ථාවක දී හෝ එසේ කටයුතු කිරීමට අදහස් කර තිබෙන අවස්ථාවක දී හෝ සිය නිදහස සඳහා කියන කරුණු තුෂ්ටිදායක නොවේතියි, නියම බලධරයකු කල්පනා කළහොත් මේ ව්‍යවස්ථාවන් යටතේ ඒ සේවකයාට ගෙවිය හැකි යම් විශ්‍රාම වැටුපක් හෝ පාරිතෝෂිකයක් හෝ වෙන දීමනාවක් නතර කිරීමට හෝ අඩු කිරීමට හෝ බලය ලේකම්වරයාට ඇත්තේය.

(2) නිලධරයකු රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගත් කාලයෙහිදී පැවති, ඒ විශ්‍රාම ගැනීමෙන් පසු අවසන් වුණු යම් පරීක්ෂණයකින් ඔහුගේ සේවා කාලය තුළ යම් නොසැලකිලිමත්කමක්, අක්‍රමිකතාවක් හෝ විෂමාචාරයක් ඔහුගෙන් කෙරී ඇති බව අනාවරණය වූ අවස්ථාවක, ඒ පරීක්ෂණයෙහි දී කරුණු තීරණයක් සම්බන්ධයෙන් ස්වකීය නිදහසට ඉදිරිපත් කළ කරුණු සතුටුදායක නොවේතැයි නියම බලධරයා විසින් සැලකුවහොත් හෝ ඒ තීරණ සම්බන්ධයෙන් ඔහු නිදහසට කරුණු ඉදිරිපත් නොකළහොත්, මේ ව්‍යවස්ථා යටතේ ඒ නිලධාරියාහට ගෙවිය යුතු හෝ ප්‍රදානය කළයුතු යම් විශ්‍රාම වැටුපක්, පාරිතෝෂිකයක් හෝ වෙනත් දීමනාවක් නතර කිරීම හෝ අඩු කිරීම හෝ අඩු කිරීම ලේකම්වරයා විසින් කළ හැකිය.

(3) මේ වගන්තියේ 1 වැනි අනුච්ඡේදයේ සඳහන් වන ආණ්ඩුවේ සේවකයකු නිදහසට කරුණු නොකියා ඇතොත් ඔහුට නිදහසට කරුණු කීමට නියම කරන්නට ලේකම්වරයා විසින් කළ හැකිය.

13. අවලංගු කරන ලදී.

---

[1]1973.11.23 දින අංක 87 දරණ ගැසට් පත්‍රය බලන්න.

[2]1975.10.10 දින අංක 185 දරණ ගැසට් පත්‍රය බලන්න.

[3]1976.11.26 දින අංක 241 දරණ ගැසට් පත්‍රය බලන්න.

## විශ්‍රාම වැටුප් දෙනු ලබන වයස

14. වයස පනස් පස් හැවිරිද්දට අඩු ආණ්ඩුවේ සේවකයකුට, ඔහුගේ දෙපාර්තමේන්තුවේ ප්‍රධානියන්ගෙන් ද සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් පත් කරනු ලබන වෛද්‍ය මණ්ඩලයකින් ද ඒ සේවකයා සේවයට නොපැමිණ නිවාඩු පිට සිටිකොත්, කායික හෝ මානසික දුර්වලතාවක් නිසා සිය ධූරයේ කටයුතු කිරීමට ඔහු නුසුදුසු බවට ලේකම්වරයා විසින් නම් කරන වෛද්‍යානුශාසකයකුගෙන් හෝ වෛද්‍යානුශාසකයන්ගෙන් ද සහතිකපතක් ලැබුණොත් මිස විශ්‍රාම වැටුප් දෙනු නොලැබේ. විශ්‍රාම වැටුප් ඉල්ලන ආණ්ඩුවේ සේවකයකු දෙපාර්තමේන්තුවක ප්‍රධානියාම වුවහොත් ඉහත නියම කළ වෛද්‍ය සහතිකය ලැබුණ විට පමණක් විශ්‍රාම වැටුප් ගෙවනු ලැබේ.

එසේ වුවද, රාජ්‍ය සේවයේ නියුතු ප්‍රධාන හෙද අධ්‍යාපන නිලධාරිනියන්, හෙද පාලිකාවන්, ජ්‍යෙෂ්ඨ ආචාර්යවරියන්, මහජන සෞඛ්‍ය හෙද ආචාර්යවරියන්, හෙද ආචාර්යවරියන්, හෙද සොහොයුරියන්, හෙදියන්, වින්නඹු මාතාවන් සහ බෙහෙත් එන්නත් කරන්නියන්, [1]අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ගුරුවරියන්, ශ්‍රී ලංකාවේ අධ්‍යාපන සේවාවේ සාමාජිකාවන්, අභ්‍යාස විද්‍යාලවල කථිකාචාර්යවරියන් සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ බහු තාක්ෂණික ආයතනවල කනිෂ්ඨ කාර්මික ආයතනවල සහ අනුබද්ධ කාර්මික ඒකකවල කථිකාචාර්යවරියන් සහ උපදේශිකාවන් සහ අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ ලේකම්වරියන් සහ ලේඛිකාවන්, අවස්ථාවෝචිත පරිදි එකී සේවාවන්ට දෙපාර්තමේන්තුවලට, අභ්‍යාස විද්‍යාලවලට, බහු තාක්ෂණික ආයතනවලට, කනිෂ්ඨ කාර්මික ආයතනවලට සහ අනුබද්ධ කාර්මික ඒකකවලට පත් කරනු ලැබීමට පෙරාතුව අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ගුරුවරියන් වශයෙන් සිටියේ නම් ඔවුන්ට සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ දුරකථන ක්‍රියාකරවන්නියන්ටත්, මොනිටර්වරියන්ටත්, සහකාර පරිපාලිකාවරියන්ටත්, ජ්‍යෙෂ්ඨ පරිපාලිකාවරියන්ටත් සහ ප්‍රධාන පරිපාලිකාවන්ටත් වයස අවුරුදු පනහ සම්පූර්ණ වීම හෝ අවුරුදු විස්සක සේවය සම්පූර්ණ කිරීම යන දෙකින් කවරවූ හෝ එකක් පළමුව එළඹෙන අවස්ථාවක, ඉහත සඳහන් කරන ලද වෛද්‍ය සහතිකය නොමැතිව, විශ්‍රාම වැටුපක් පිරිනැමිය හැකි වන්නේය.

එසේවුව වුවත්, පොලිස් සේවයේ නියුක්ත වූ කිසි සම අයකුට, නැතහොත් පොලිස් සේවයේ නියුක්ත වූවකු වශයෙන් කරන ලද සේවයක් සමඟ නොකඩවා පවත්නා සේවයක් ඇතිවන පරිදි, මහජනාරක්ෂක දෙපාර්තමේන්තුවෙහි විශ්‍රාම වැටුප් සහිත වූව ද, ස්ථිර වූව ද තනතුරක් දරා ඇති නිලධාරියෙකුට, වයස අවුරුදු පණහ සම්පූර්ණ වූ කල්හි, මෙම වගන්තියේ පූර්වෝක්ත විධිවිධානයන්හි සඳහන් කරන ලද වෛද්‍ය සහතිකය ඉදිරිපත් කිරීමක් නැතිවම විශ්‍රාම වැටුපක් හෝ පාරිතෝෂිකයක් හෝ දිය හැකිය.

එසේ වුව ද නිලධාරියකු ස්වකීය තනතුර අතහැර ඇත්තාවූ ද, ඒ නිලධාරියා විසින් ස්වකීය තනතුර අත්හරින ලද්දේ යම් අවස්ථාගත කරුණු යටතේ ද ඒ අවස්ථාගත කරුණු අමාත්‍ය මණ්ඩලය විසින් සැලකිල්ලට ගෙන ඒ නිලධරයා විශ්‍රාම ගන්වනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු යැයි තීරණය කරනු ලබන්නා වූ ද අවස්ථාවක, ඒ නිලධාරියා ස්වකීය තනතුර අත්හරින දිනයෙහි විශ්‍රාම ගන්නා ලදැයි සලකනු ලැබිය යුතු අතර, මෙ වගන්තියෙහි සඳහන් වෛද්‍ය සහතිකය ඉදිරිපත් කිරීමක් නොමැතිව ඒ නිලධාරියාට, අවස්ථාවෝචිත පරිදි විශ්‍රාම වැටුපක් හෝ පාරිතෝෂිකයක් ප්‍රදානය කරනු ලැබිය යුතුය.

[2]එසේම තවදුරටත් ඉහත සඳහන් අතුරු වගන්තිය සහ අංක 30/88 හා 1988 අගෝස්තු මස 30 වැනි දින දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය යටතේ විශ්‍රාම ගිය යම් රජයේ නිලධරයකු හය මාසයේ අතිරේක පාරිතෝෂිකය රහිතව, අංක 44/90 හා 1990 ඔක්තෝබර් මස 18 වැනි දින දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාර ගණන් බලන ලද විශ්‍රාම වැටුපක් ලැබීමට 1990 ඔක්තෝබර් මස 18 වැනි දින පටන් හිමිකම් ලැබිය යුතුය.

අංක 30/88 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය යටතේ විශ්‍රාම ලබා, 1990 ඔක්තෝබර් මස 18 වැනි දිනට පෙර වයස අවුරුදු 55 සපිරුණු නිලධාරියෙක්ද, 1990 ඔක්තෝබර් මස 18 වැනි දින පටන් ඉහත සඳහන් ප්‍රතිලාභ ලබන්නේය.

[3]පොලිස් දෙපාර්තමේන්තුවේ සියලු තරාතිරම්වලට අයත් නිලධාරිනියන්ට ද වයස අවුරුදු 50 හෝ සේවා කාලය වසර 20 යන දෙකෙන් පළමුව එළඹෙන දිනයේ දී වෛද්‍ය සහතිකයක් නොමැතිව විශ්‍රාම යාමට මනාපය පළ කළ හැකිය.

[4]බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තුගත තනතුරුවල සේවයේ නියුතු සියලු තරාතිරම්වලට අයත් නිලධාරිනියන්ට වයස අවු. 50 සම්පූර්ණ කරන දින හෝ සේවා කාලය වසර 20 ක අඛණ්ඩ සේවයක් සම්පූර්ණ කරන දින හෝ යන දෙකින් හෝ කවර හෝ පළමුව එළඹෙන දිනයේදී වෛද්‍ය සහතිකයක් නොමැතිව රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ලබාගැනීමට මනාපය පලකළ හැකිවන අතර, එදිනට විශ්‍රාම වැටුපක් ගෙවිය හැකිය.

14.අ අවලංගු කරන ලදී.

---

[1]1977.05.27 දින අංක 267 දරණ ගැසට් පත්‍රය බලන්න.

[2]1992.09.09 දින අංක 732 දරණ ගැසට් පත්‍රය බලන්න.

[3]2009.12.08 දින දරණ අංක 1631/17 ගැසට් පත්‍රය බලන්න.

[4]2014.10.10 දින අංක 1883/15 දරණ ගැසට් පත්‍රය බලන්න.

[1]14ආ. අනිවාර්ය විශ්‍රාම ගැනීමේ වයසට එළඹීමට පෙර, අමාත්‍යාංශයක ලේකම්වරයෙකුට විශ්‍රාම ගැනීමට ඉඩ දිය යුතු බව ජනාධිපතිවරයාගේ මතය වන අවස්ථාවක, මේ ව්‍යවස්ථා සංග්‍රහයෙහි පටහැනිව කුමක් සඳහන්ව ඇත්ද, එම විශ්‍රාම ගැනීම, ධුරය අහෝසි කිරීමේ හේතුව මත සිදු වූවාක් මෙන්, ඒ ලේකම්වරයාට අවස්ථාවෝචිත පරිදි, විශ්‍රාම වැටුපක් හෝ පාරිතෝෂිකයක් හෝ ප්‍රදානය කරනු ලැබිය යුතුය.

[2]15. (1) යම් රාජ්‍ය නිලධාරියකු :-

(අ) සාමාන්‍ය අකාර්යක්ෂමතාව නිසා,

(ආ) සාමාන්‍ය අකාර්යක්ෂමතාව නිසා සේවයෙන් පහ කිරීම වෙනුවට සානුකම්පිත විකල්පයක් වශයෙන්,

(ඇ) සාමාන්‍ය අකාර්යක්ෂමතාවය නිසා තනතුර අතහැර යාම වෙනුවට සානුකම්පිත විකල්පයක් වශයෙන්, හෝ

(ඈ) ආයතන සංග්‍රහයේ II වන කාණ්ඩයේ XLVIII වන පරිච්ඡේදයේ "අ" උපලේඛනයෙහි දැක්වෙන වැරදි නිසා සේවයෙන් විශ්‍රාම ගන්වනු ලැබ ඇති අවස්ථාවන්හිදී, ස්වකීය අභිමතය පරිදි එම නිලධරයාට තමා විසින් නිශ්චය කරනු ලබන විශ්‍රාම වැටුපක්, හෝ පාරිතෝෂිකයක් ලේකම්වරයා විසින් දිය හැකිය.

එසේ වුවද එසේ දෙනු ලබන විශ්‍රාම වැටුප හෝ පාරිතෝෂිකය ඒ නිලධරයාගේ සේවා කාලය අනුව ලැබීමට ඔහු සුදුසු වන මුදලට කිසිවිටකවත් වැඩි නොවිය යුතුය.

(2) ඉහත සඳහන් උපවගන්තිය යටතේ විශ්‍රාම වැටුපක් ගෙවනු ලබන විට, එම විශ්‍රාම වැටුප කවර දිනක සිට ගෙවිය යුතු ද යන්න ස්වකීය අභිමතය පරිදි නිශ්චය කිරීම ලේකම්වරයා විසින් කළ හැකිය.

[3]15.අ.(1) මෙම ව්‍යවස්ථා සංග්‍රහයේ 48 අ සහ 48 අඅ වන වගන්තියෙහි 1957 අංක 49 දරණ රාජ්‍ය කර්මාන්ත සංයුක්ත මණ්ඩල පනතේ 26(4) වන වගන්තියෙහි, 1957 අංක 48 දරණ මෝටර් රථ ගමනාගමන පනතේ 9(3) වන වගන්තියෙහි විධිවිධාන යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක සමාන විධිවිධාන යටතේ ව්‍යවස්ථාපිත මණ්ඩලයක කාර්ය මණ්ඩලයට රාජ්‍ය නිලධරයකු ස්ථිරව පත් කරනු ලැබ, අකාර්යක්ෂමතාවය, නොසැලකිලිමත්කම, අක්‍රමිකතාව හෝ විෂමාචාරය හේතු කොට ගෙන එම ව්‍යවස්ථාපිත මණ්ඩලයේ කාර්ය මණ්ඩලයෙහි ඔහුගේ සේවා නියුක්තිය අවසන් කරනු ලබන අවස්ථාවක, ලේකම්වරයාගේ අභිමතය පරිදි ඒ ලේකම්වරයා විසින් තීරණය කරනු ලබන ප්‍රමාණයක විශ්‍රාම වැටුපක් හෝ පාරිතෝෂිකයක් ඒ ලේකම්වරයා විසින් ඒ නිලධරයා වෙත ගෙවනු ලැබිය හැකිය.

එසේ වුවද, එසේ ප්‍රදානය කරනු ලබන විශ්‍රාම වැටුපෙහි හෝ පාරිතෝෂිකයෙහි ප්‍රමාණය, කිසිම අවස්ථාවකදීවත්, ඔහු එම ව්‍යවස්ථාපිත මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබූ දින රෝගීභාවය හේතුකොට ගෙන රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ලැබුවේ නම් මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ එවිට ඔහුට ලැබීමට හිමිකම තිබුණු ප්‍රමාණයට වැඩි නොවිය යුතුය.

(2) මෙම වගන්තියෙහි කාර්යයන් සඳහා "ව්‍යවස්ථාපිත මණ්ඩලය" යන යෙදුමට මේ ව්‍යවස්ථා සංග්‍රහයෙහි 48අආ වන වගන්තියෙහි ඇති අර්ථයම වේ.

**විශ්‍රාම වැටුප් ලබන්නකු හෝ පාරිතෝෂිකයක් ලබන්නකු හෝ ආපසු සේවයට ගැනීම**

16.(1) සේවයෙන් විශ්‍රාම ගැනීමේ දී පාරිතෝෂිකයක් හෝ පරිවර්තිත පාරිතෝෂිකයක් හෝ සමඟ අඩු විශ්‍රාම වැටුපක් හෝ දෙනු ලැබූ නිලධාරියකු ආණ්ඩුවේ තනතුරකට නැවත පත් කරනු ලැබූ කල, ලේකම්වරයා විධාන කරන ආකාරයට ඒ පාරිතෝෂිකය හෝ පරිවර්තිත පාරිතෝෂිකය හෝ ආණ්ඩුවට ආපසු ගෙවන ලෙස ඒ නිලධාරියාට නියම කරනු ලැබිය හැකිය.

(2) මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුපක් දෙනු ලබූ යම් කිසි නිලධාරියෙකු ආණ්ඩුවේ වෙන තනතුරකට නැවත පත් කරනු ලැබ විශ්‍රාම වැටුපක් ලැබිය යුතු තත්ත්වයක සිට පසුව සේවයෙන් විශ්‍රාම ගතහොත්,එවිට පළමු දුන් විශ්‍රාම වැටුප වෙනුවට, ආණ්ඩුව යටතේ ඔහු කළ මුළු සේවය අඛණ්ඩ කාලපරිච්ඡේදයක් සේ ගණන් බලා දෙන විශ්‍රාම වැටුපක් ඔහුට දිය හැකිය. ඒ විශ්‍රාම වැටුප ඔහු පළමු වතාවේ දී ආණ්ඩුවේ සේවයෙන් විශ්‍රාම ගන්නා විට ලැබූ විශ්‍රාම වැටුප් හිමි වැටුප ද අවසාන වශයෙන් සේවයෙන් විශ්‍රාම ගන්නා විට ලැබූ විශ්‍රාම වැටුප හිමි වැටුප ද යන මේ දෙකෙන් වැඩි වූ වැටුප පාදක කර, ගණනය කළ හැකිය.

(3) මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ පාරිතෝෂිකයක් දෙනු ලැබූ යම් කිසි නිලධාරියකු ආණ්ඩුවේ වෙන තනතුරකට නැවත පත් කරන ලදින්, විශ්‍රාම වැටුපක් හෝ පාරිතෝෂිකයක් හෝ ලැබිය යුතු තත්ත්වයක සිට පසුව සේවයෙන් විශ්‍රාම ගතහොත්, එවිට ආණ්ඩුව යටතේ ඔහු කළ මුළු සේවය අඛණ්ඩ කාලපරිච්ඡේදයක් සේ ගණන් බලා දෙන විශ්‍රාම වැටුපක් ඔහුට දිය හැකිය. ඒ විශ්‍රාම වැටුප ඔහු, පළමු වතාවේ දී ආණ්ඩුවේ සේවයෙන් විශ්‍රාම ගන්නා විට ලැබූ විශ්‍රාම වැටුප් හිමි වැටුප ද අවසාන වශයෙන් සේවයෙන් විශ්‍රාම ගන්නා විට ලැබූ විශ්‍රාම වැටුප් හිමි වැටුප ද යන මේ දෙකෙන් වැඩි වූ වැටුප පාදක කර ගණනය කළ හැකිය. විශ්‍රාම වැටුපක් හෝ පාරිතෝෂිකයක් හෝ ලැබීමට සුදුසු අවශ්‍ය සේවය නිලධරයා කර තිබේ ද නැද්ද යනු නිශ්චය කිරීමේ දී ඔහු ආණ්ඩුව යටතේ මුලින් කළ සේවයත්, නැවත පත් කිරීමෙන් පසුව කළ සේවයත් යන දෙකම ගණන් ගත යුතුය.

[1]1988.11.24 දින අංක 533/7 දරණ ගැසට් පත්‍රය බලන්න.

[2]1976.01.02 දින අංක 197 දරණ ගැසට් පත්‍රය බලන්න.

[3]1975.06.27 දින අංක 170 දරණ ගැසට් පත්‍රය බලන්න.

(4) මේ ව්‍යවස්ථාවන් යටතේ විශ්‍රාම වැටුපක් හෝ පාරිතෝෂිකයක් හෝ දෙනු ලැබූ නිලධාරියකු හුදෙක්ම විශ්‍රාම වැටුප් රහිතවද දෙවන වර සේවයෙහි යෙදී සිටි කාල පරිච්ඡේදය වෙනුවෙන් විශ්‍රාම වැටුප් සඳහා කිසිම අයිතිවාසිකමක් නැතිව ද ආපසු සේවයට ගැනීමට මේ ව්‍යවස්ථාවන්හි සඳහන් වන කිසිවකින් ලංකාණ්ඩුවට බාධාවක් නොතිබිය යුතුය.

### බලෙන් විශ්‍රාම ගැන්වීම

17. පනස් පස් හැවිරිදි පිරුණු විට හෝ ඉන් පසුව හෝ ආණ්ඩුවේ ඕනෑම සේවකයකුට ආණ්ඩුවේ සේවයෙන් විශ්‍රාම ගැනීමට නියම කරන්නට පුළුවන. නියම බලධාරි කෙනෙකු විසින් සේවයේ බඳවා ගැනීමට තීරණය කළ හොත් මිස, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චකාරයකු හැර ආණ්ඩුවේ සෙසු හැම සේවකයකුම හැට වයස පිරුණු විට අනිවාර්යයෙන්ම සේවයෙන් විශ්‍රාම ගත යුතු ය.

සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සේවය කරන වින්නඹුවෝ ය, අත් විදින්නියෝ ය යන මොවුන් අතුරෙන් කවරකු වුවත් සේවයෙහි රඳවා ගත යුතු යයි නියම බලධරයා තීරණය කළ හොත් මිස, අන් හැමවිටම, අවුරුදු පනස් පහ පිරුණු විට අනිවාර්යයෙන් ම විශ්‍රාම ගත යුතු ය.

17අ. 12 වැනි සහ 17 වැනි වගන්ති සම්බන්ධයෙන් "නියම බලධරයා" යන්නෙන් අදහස් කරන්නේ ඒ වගන්තිවල සඳහන් ඕනෑම ආණ්ඩුවේ සේවකයකු දරණ ධුරයකට කෙනෙකු පත් කිරීමට බලය ඇති නිලධාරියා ය.

18. අවලංගු කරන ලදී.

### ඇතැම් විෂම ක්‍රියා ගැන වරදකාරයා වූ විට විශ්‍රාම වැටුප අහිමි වීම

19. විශ්‍රාම වැටුපක් හෝ විශ්‍රාම දීමනාවක් හෝ ලබන ඕනෑම කෙනෙකු මරණීය දඬුවම ලැබෙන වරදකට හෝ බරපතල වැඩ ඇතිව කිනම් කාලයකට වුවත් බන්ධනාගාරගත කරවන වරදකට හෝ ඒ හා සමාන දොළොස් මාසයකට වැඩි දඬුවමකට භාජන වන වරදට හෝ අසු වී, වරදකාරයා වුවහොත් ඔහුගේ ඒ විශ්‍රාම වැටුප හෝ දීමනාව හෝ වහාම නතර කළ යුතු ය. එසේ නතර නොකළ යුත්තේ ලේකම්වරයා එලෙස විධාන කළහොත් පමණකි.

[1]එසේ වුවද, බරපතල වැඩ සහිත සිර දඬුවමක් වෙනුවට අධිකරණයක් මගින් අත්හිටවූ සිර දඬුවමක් පැන වූ කල්හි, එම අත්හිටවූ සිර දඬුවම ක්‍රියාත්මක වන කාලය තුළදී වෙනත් වරදක් සිදු නොකළහොත්, එම කාලය තුලදී හෝ ඉන්පසුව, විශ්‍රාම වැටුප හෝ දීමනාව නතර නොකරනු ලැබිය යුතුය.

20. (1) මෙම ව්‍යවස්ථා සංග්‍රහයෙහි අඩංගු ව්‍යතිරේකනයට යටත්ව, තම කැමැත්තෙන් ම ඉල්ලා අස් වීම, නිලය අත්හැරයාම හෝ යම් හේතුවක් නිසා පහකරනු ලැබීම් කරණ කොටගෙන විශ්‍රාම වැටුප් හිමි රජයේ නිලධාරියකුගේ සේවය අවසන් වූ විට, එසේ අවසන් වීමට පෙර වූ යම් සේවා කාලයක් හෝ කාලයන්, මෙම ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් විශ්‍රාම වැටුප හෝ පාරිතෝෂිකය සඳහා ගණන් නොගත යුතුය.

(2) ස්වේච්ඡාවෙන් ඉල්ලා අස්වීමේ හේතුවෙන් රජයේ නිලධාරියකු විසින් මෙම ව්‍යවස්ථාවල 32(II) වැනි වගන්තියේ විධිවිධානවල කුමක් සඳහන්ව ඇත ද, ආණ්ඩුව යටතේ කළ සේවයට බාධා පැමිණුන අවස්ථාවක-

(අ) ඉල්ලා අස්වීමෙන් පසුව ඒ රජයේ නිලධාරියා පත් කරනු ලැබූ දෙපාර්තමේන්තුවේ ඔහුගේ කටයුතු සම්බන්ධයෙන් ප්‍රයෝජනවත් විය හැකි වඩා උසස් වෘත්තීය සුදුසුකම් ලබා ගැනීමේ කාර්යය සඳහා ම ඔහු රජයේ සේවයෙන් ඉල්ලා අස් වූ බවට; හා

(ආ) එබඳු වඩා උසස් සුදුසුකම් ලබා ගැනීමෙන් පසු ලේකම්වරයා විසින් අවස්ථාවෝචිත ලෙස යුක්ති සහගත යයි සලකනු ලබන කාලසීමාවක් ඇතුළත ඒ රජයේ නිලධරයා රජයේ සේවයට නැවත බැඳුණ බවට ලේකම්වරයා සෑහීමට පත් වේ නම්, ඉල්ලා අස්වීමට පෙර ඒ රජයේ නිලධාරියා විසින් කළ සේවා කාලය, මේ ව්‍යවස්ථා යටතේ ගෙවනු ලබන යම් විශ්‍රාම වැටුපක හෝ පාරිතෝෂික දීමනාවක කාර්යය සඳහා ගණන් ගනු ලැබිය යුතු යයි ලේකම්වරයා විසින් නියම කළ හැකිය.

(3) රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබූ හෝ සේවය අවසන් කරනු ලැබූ හෝ අකාර්යක්ෂමතාව නිසා විශ්‍රාම ගන්වනු ලැබූ හෝ යම්කිසි ආණ්ඩුවේ නිලධාරියකු හෝ දෛනික පඩි ලබන සේවකයකු හෝ ආණ්ඩුව විසින් නැවතත් සේවයට ගනු ලැබුවහොත්, මෙම ව්‍යවස්ථා සංග්‍රහයෙහි මීට විරුද්ධව කුමක් සඳහන්ව තිබුණත්, එසේ සේවයෙන් පහ කරනු ලැබීමට හෝ සේවය අවසන් කරනු ලැබීමට හෝ විශ්‍රාම ගන්වනු ලැබීමට හෝ කලින් එහි නිලධාරියා නොහොත් සේවකයා කර ඇති සේවය ඉදින්,

[1]1986.08.08 දින අංක 414 දරණ ගැසට් පත්‍රය බලන්න. මෙම සංශෝධනය 1974 ජනවාරි මස 01 දින සිට බලාත්මක වූ ලෙස සළකනු ලැබිය යුතුය.

(අ) ඒ නිලධාරියා යටකී පරිදි රාජ්‍ය සේවයෙන් පහ නොකරනු ලද නම් හෝ ඔහුගේ සේවය අවසන් නොකරන ලද නම් හෝ විශ්‍රාම ගන්වනු නොලැබුයේ නම් එකී සේවය විශ්‍රාම වැටුපට හෝ පාරිතෝෂිකයට ඇතුළත් කළ හැකිව තිබුණි නම් ද,

(ආ) නැවත සේවයට ගැනීමේ දී, ඒ නිලධාරියාට නොහොත් සේවකයාට නිකුත් කළ පත්වීම් ලියුමෙහි එකී සේවය, එසේ ඇතුළත් කළ හැක්කේ නම්, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය හැකි යම් විශ්‍රාම වැටුපක් හෝ පාරිතෝෂිකයක් හෝ සඳහා ගණන් ගන්නා බව ප්‍රකාශ කර තිබුණේ නම් ද,

එබඳු අවස්ථාවකදීම පමණක් මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය හැකි යම්කිසි විශ්‍රාම වැටුපක් හෝ පාරිතෝෂිකයක් හෝ සඳහා ගණන් ගත යුතු ය.

(4) ලංකාණ්ඩුවේ සේවයෙහි ස්ථිර වූ ද, විශ්‍රාම වැටුප් හිමි වූ ද ධුරයක් දරමින් සිටි, යම්කිසි ආණ්ඩුවේ සේවකයකු රාජ්‍ය සේවයෙන් පහ කර ඇති කල්හි, ඉදින්-

(අ) එකී ආණ්ඩුවේ සේවකයා සේවයෙන් පහ කර ඇත්තේ අකාර්යක්ෂමතාව හෝ දූෂණ ක්‍රියාවක් හෝ සදාචාරය කෙලෙසන අන්දමින් අනිසි ලෙස හැසිරීම හෝ යන මේ හේතුවක් හැර වෙන යම් හේතුවක් නිසා බවට ද

(ආ) ඔහු සේවයෙන් පහ කරනු ලැබීමට තුඩුදුන් චෝදනා නගන ලද්දේ, ඔහු සේවයෙන් පහ කර දැමූ කාලයේ දී වලංගුව තිබුණේ වී නමුත් දැනට වලංගු නො වන පාලන රෙගුලාසි යටතේ බවට ද

(ඇ) ආණ්ඩුවේ සේවයෙහි ඔහුට නැවත රක්ෂාවක් දීමට නොහැකි බවටද, ලේකම්වරයා සෑහීමට පත් වුවහොත්, එකී ආණ්ඩුවේ සේවකයා, යට කී පරිදි සේවයෙන් පහ කරනු ලැබූ දිනයේ පටන් රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගත්තාක් සේ සලකා, රෝගීභාවය නිසා එකී දිනයේ දී ඔහු විශ්‍රාම ගන්වනු ලැබුවේ නම් මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ඔහුට ගෙවිය යුතුව තිබුණ විශ්‍රාම වැටුප හෝ පාරිතෝෂිකය හෝ ලේකම්වරයාගේ අභිමතය පරිදි ඔහුට ගෙවිය හැකි ය.

(5) මෙම ව්‍යවස්ථාවන්හි පූර්වයෙන් වූ විධිවිධානවල පටහැනිව කුමක් සඳහන් වුවද, 1946 හා 1947 ලංකා (ආණ්ඩුක්‍රම හා ස්වාධීනතා) රාජාඥාවන්හි 46(1) වැනි වගන්තිය යටතේ පත් කරනු ලැබූ ඇමතිවරයකුගේ පෞද්ගලික ලේකම් තනතුරක් භාරගැනීම පිණිස යම් විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරමින් සිටි යම් රජයේ නිලධාරියකු රජයේ සේවයෙන් ඉල්ලා අස් වී ඉන්පසු යම් අවස්ථාවක ඔහු රජයේ සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරකට පත් කළ අවස්ථාවක එසේ ඉල්ලා අස්වීමට පෙර එම රජයේ නිලධාරියාගේ සේවා කාලය මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවන යම් විශ්‍රාම වැටුපක් හෝ පාරිතෝෂිකයක් සඳහා ගණන් ගත යුතු ය.

[1](6) ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරකින් එක් වරක් හෝ ඊට වැඩි වාර ගණනක් ඉල්ලා අස් වී ඇති යම් රාජ්‍ය නිලධාරියෙක් පසුව, රාජ්‍ය සේවයේ ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරකට පත් කරනු ලැබූ අවස්ථාවක, ඒ එක් එක් ඉල්ලා අස්වීමට පෙර ඔහුගේ වැඩ සහ හැසිරීම සතුටුදායකව තිබුණේ යම් කාල පරිච්ඡේදයන් තුළද ඒ එක් එක් කාල පරිච්ඡේදය, මෙම ව්‍යවස්ථා සංග්‍රහයෙහි පටහැනිව කුමක් සඳහන් වුව ද මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුපක හෝ පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතුය.

[2]20අ (1) විශ්‍රාම වැටුප් හිමි සේවයක හෝ තනතුරක යෙදී ඇති යම් රජයේ නිලධාරියකු දෛනික වැටුප් ලබන හෝ තාවකාලික මාසික වැටුප් ලබන හෝ විශ්‍රාම වැටුප් රහිත ස්ථිර මාසික වැටුප් ලබන සේවකයකු ලෙස රජය යටතේ කලින් සේවය කර ඇත්තේ නම්, එම සේවා කාලය අතරතුර දී එම සේවා කාලයන් අතරතුර දී හෝ එම සේවා කාලය සහ එකී විශ්‍රාම වැටුප් හිමි සේවයෙහි හෝ තනතුරෙහි සේවය අතරතුරදී ඇති වූ යම් කඩවීමක් ගැන නොසලකා, කලින් කරන ලද එකී සේවා කාලය හෝ කාලයන් මෙම ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් විශ්‍රාම වැටුප් හෝ පාරිතෝෂිකය සඳහා ගණන් ගනු ලැබිය යුතුය;

එසේ ද වුවත්, කලින් කරන ලද දෛනික වැටුප් හෝ තාවකාලික මාසික වැටුප් සේවය හෝ විශ්‍රාම වැටුප් රහිත ස්ථිර මාසික වැටුප් සේවය විෂමාචාරය නිසා අවසන් කරන ලද්දේ නම්, එසේ අවසන් කරන ලද දිනයට පෙර කරන ලද යම් සේවා කාලයක් හෝ කාලයන් මෙම ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් විශ්‍රාම වැටුප හෝ පාරිතෝෂිකය සඳහා ගණන් නොගත යුතු ය.

(2) විශ්‍රාම වැටුප් හිමි නිලයක හෝ තනතුරක යෙදී ඇති රජයේ නිලධාරියකු යම් විශ්‍රාම වැටුප් හිමි සේවයක පූර්ණ කාලීන වැඩ බැලීමේ සේවයක් කළේ නම්, එම වැඩ බැලීමේ කාලය තුළ දී හෝ එම වැඩ බැලීමේ කාලය හා එකී විශ්‍රාම වැටුප් හිමි නිලයෙහි හෝ තනතුරෙහි සේවය අතරතුරදී ඇති වූ යම් කඩවීමක් ගැන නොසලකා, එම වැඩ බැලීමේ සේවය මෙම ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් විශ්‍රාම වැටුප හෝ පාරිතෝෂිකය සඳහා ගණන් ගනු ලැබිය යුතුය.

---

[1]1977.05.27 දින අංක 267 දරණ ගැසට් පත්‍රය බලන්න.

[2]1990.2.22 දින අංක 599 දරණ ගැසට් පත්‍රය බලන්න.

## ජනරජය යටතේ ඇති සෙසු සේවාවලින් මාරු කොට මෙහි එවන ලද්දා වූ ද, මෙරට සේවාවලින් ඒ සේවාවලට මාරු කොට යවන ලද්දා වූ ද, නිලධාරීන්ට විශ්‍රාම වැටුප් සම්බන්ධයෙන් ඇති අයිතිවාසිකම්

21. (1) වෙන ආණ්ඩුවක සේවාවෙන් ලංකාණ්ඩුවේ සේවාවට මාරු කොට එවන ලද්දා වූ ද ලංකාණ්ඩුවේ සේවාවෙන් වෙන ආණ්ඩුවක සේවාවට මාරු කොට යවන ලද්දා වූ ද, මුළු සේවයම ලංකාණ්ඩුව යටතේ කරන ලද්දේ නම් මේ ව්‍යවස්ථාවන් යටතේ විශ්‍රාම වැටුප් ලැබීමට සුදුසු වූ ද නිලධාරියකුට ඒ නිලධාරියා ලංකාණ්ඩුව යටතේ යටත් පිරිසෙයින් 12 මාසයක් වත් සේවය කොට ඇත්තේ නම්, ඔහු අන්තිමයේ දී යෙදී සිටි සේවාවේ නීති හා රෙගුලාසි අනුව විශ්‍රාම වැටුපක් හෝ පාරිතෝෂිකයක් හෝ ලැබෙන තත්ත්වයක සිට රාජ්‍ය සේවාවෙන් විශ්‍රාම ලැබීමේ දී ඔහුගේ රාජ්‍ය සේවා කාලය තුළ දී ඔහුට ලැබුණු විශ්‍රාම වැටුප් හිමි මුළු වැටුප ද, ලංකාණ්ඩුව යටතේ වූ සේවා කාලය තුළ ඔහුට ලැබුණු විශ්‍රාම වැටුප් හිමි මුළු වැටුප ද යන මේ දෙක අතර ඇති සමානුපාතයට සම වන සමානුපාතයක්, ඔහුගේ මුළු සේවයම ලංකාණ්ඩුව යටතේ කරන ලද්දක් වූවා නම්, ඔහුට ලැබිය යුතු විශ්‍රාම වැටුප ද දැන් ඔහුට දිය යුතු විශ්‍රාම වැටුප ද යන මේ දෙක අතර ද ඇති වන පමණ වූ විශ්‍රාම වැටුපක් ඔහුට දිය යුතුය.

(2) යම් නිලධාරියකුගේ මුළු සේවයම ලංකාවේහි කරන ලද නම්, ඔහුට ලැබිය යුතු විශ්‍රාම වැටුප කෙතරම් දැ යි මේ වගන්තිය සම්බන්ධයෙන් නිශ්චය කිරීමේ දී -

(අ) විශ්‍රාම වැටුප් හිමි අවසාන වැටුප වශයෙන් ගණන් ගන්නා වැටුප, ඊට අදාළ වන නීතිය හා රෙගුලාසි අනුව ගණන් බැලූ සේවයේ අවසාන කාල පරිච්ඡේදයේ වැටුප විය යුතු ය.

(ආ) මේ රෙගුලාසිවල 7 වැනි සහ 30 වැනි රෙගුලාසි ගැන සැලකිල්ලක් නො දැක්විය යුතු ය.

(ඇ) විශ්‍රාම වැටුප් හිමි අවසාන වැටුපෙන් තුනෙන් දෙපංගුවකට වඩා විශ්‍රාම වැටුප අධික නොවිය යුතු ය යන කොන්දේසිය ගැන සැලකිය යුතුය.

(ඈ) නිලධාරියාට විශ්‍රාම වැටුපක් හෝ පාරිතෝෂිකයක් හෝ නොදෙන වෙන ආණ්ඩුවක් හෝ ප්‍රාදේශික පොදු සභාවක් හෝ සෙසු සේව්‍ය අධිකාරී මණ්ඩලයක් හෝ යටතේ කළ කිසිම පොදු සේවා කාල පරිච්ඡේදයක් ගණනට නො ගත යුතු ය.

(3) මේ වගන්තිය සම්බන්ධයෙන් -

(අ) නිලධාරියාගේ විශ්‍රාම වැටුප් හිමි මුළු වැටුප වශයෙන් සැලකිය යුත්තේ එම නිලධාරියාට ලැබෙන්නට තිබුණු සම්පූර්ණ වැටුප් මුදල ද, සොළොස් හැවිරිදි වයස පිරුණාට පසු ව ඔහු ගේ රාජ්‍ය සේවා කාල පරිච්ඡේදය මුළුල්ලෙහි ස්ථිර ධුරයෙහි හෝ ධුරයන්හි හෝ සම්පූර්ණ වැටුප් හිමිව සිටියේ නම් ඔහුට ලැබෙන්නට තිබුණ අනෙක් විශ්‍රාම වැටුප් හිමි මුළු වැටුප් මුදල් ද යන මේ දෙකෙහි ඓක්‍යය යි.

එහෙත් ඔහුගේ විශ්‍රාම වැටුප් හිමි මුළු මුදල් ගණන් බැලීමේ දී, විශ්‍රාම වැටුපක් හෝ පාරිතෝෂිකයක් හෝ නොදෙන කිසිම ආණ්ඩුවක් හෝ ප්‍රාදේශීය පොදු සභාවක් හෝ සෙසු සේව්‍ය අධිකාරී මණ්ඩලයක් හෝ යටතේ ඔහු විසින් කරන ලද කිසිම සේවයක් ගණන් නොගත යුතු ය.

(ආ) "රාජ්‍ය සේවා" යන්නට (දේශීය ආයතනයෙහි) විජිත ගණන් පරීක්ෂක දෙපාර්තමේන්තුවේ හෝ විජිත ක්‍රවුන් ඒජන්ත කාර්යාලයෙහි හෝ කිනියාව සහ උගන්ඩාව යන රටවල ගමනාගමනය පිළිබඳ මහා කොමසාරිස්වරයා යටතේ හෝ සේවකයන්ට විශ්‍රාම වැටුප් ගෙවීමේ පරිපාටියක් යොදා ගත් ලාංකික ප්‍රාදේශික පොදු සභාවක් යටතේ හෝ කරන සේවය සහ ලේකම්වරයා "රාජ්‍ය සේවා" යි නිර්ණය කරන එවැනි අන්‍ය සේවයක් ද ඇතුළත් වේ.

(ඇ) "ඔහුගේ මුළු සේවයම ලංකාණ්ඩුව යටතේ වී නම් ඔහුට හිමිවන්නට තිබුණ" යන පාඨය 2 වැනි වගන්තියෙන් නියමිත "සියළු ආදායම් මාර්ගයන්ගෙන් අවුරුද්දකට පවුම් 2000 කට සීමිත වූ විශ්‍රාම වැටුප" යනු නොසලකා තේරුම් ගත යුතුය.

(4) බ්‍රිතාන්‍ය ඩොමිනියන් රාජ්‍යයක හෝ යටත් විජිතයක හෝ ආරක්ෂිත ප්‍රදේශයක හෝ බ්‍රිතාන්‍ය මැන්ඩේට් බල පත්‍රයක් යටතේ පවත්නා ප්‍රදේශයක හෝ ආණ්ඩුකාරතුමකු හෝ මහා කොමසාරිස්වරයකු හෝ ඉන්දියාවේ ආණ්ඩුකාරතුමකු හෝ වශයෙන් කරන සේවය, විශ්‍රාම වැටුප හෝ පාරිතෝෂිකය ගණන් බැලීමත්, 23 වැනි වගන්තියත්, මේ ව්‍යවස්ථා සංග්‍රහයේ 2 වැනි වගන්තියේ ඇති උපරිම විශ්‍රාම වැටුප පිළිබඳ විශේෂ විධිවිධානයන් සම්බන්ධයෙන් හැර, රාජ්‍ය සේවය වශයෙන් සැලකිය යුතුය.

(5) අන්‍ය රාජ්‍ය සේවාවකින් මාරුකොට මෙහි එවන ලද්දා වූ ද, ස්වකීය මුළු සේවය ලංකාණ්ඩුව යටතේ කරන ලද්දේ නම් මේ රෙගුලාසි යටතේ විශ්‍රාම වැටුප් පිට සේවයෙන් විශ්‍රාම ගැනීමට සුදුසු වූ ද, නිලධාරියකු ධුරය නැති කර දැමීම නිසා සේවයෙන් අනිවාර්ය ලෙස විශ්‍රාම ගන්වන විට, එම නිලධාරියා එවකට ලංකාණ්ඩුවේ සේවයෙහි යෙදී සිටී නම්, මේ වගන්තිය යටතේ දෙන විශ්‍රාම වැටුපට අතිරේක වශයෙන්, ඔහුගේ මුළු සේවය ම ලංකාණ්ඩුව යටතේ වී නම්, 2 වැනි වගන්තිය අනුව ගණන් බලන ඔහුගේ විශ්‍රාම වැටුප, ධුරය නැති කර දැමීමේ හේතුවෙන් 7 වැනි වගන්තිය යටතේ වැඩි වෙන්නට තිබුණු ප්‍රමාණයට ගෙන ඊමට යම් කරමක් අඩු වී නම්, එයට සමාන මුදලක් ලංකාවේ අරමුදලින් ඔහුට දෙන්ට පුළුවන.

එහෙත් මෙසේ සේවයෙන් විශ්‍රාම ගන්වනු ලබන නිලධාරියා රාජ්‍ය සේවයට ආපසු කැඳවනු ලැබීමට යටත් විය යුතු ය.

(6) මේ ආඥාපනත යටතේ වූ විශ්‍රාම වැටුප් හිමි තනතුරකින් අන්‍ය ආඥාපනත සේවාවකට පත් කරනු ලැබුවා වූ ද, අන්තිමට යෙදී සිටි සේවාවේ නීතිය හෝ රෙගුලාසි හෝ අනුව විශ්‍රාම වැටුපක් හෝ පාරිතෝෂිකයක් හෝ ලැබිය හැකි තත්ත්වයන් යටතේ වූ ද මුළුමනින් දහ අවුරුද්දක සේවයක් සම්පූර්ණ කිරීමට මත්තෙන් ඒ ආඥාපනතේ සේවයෙන් විශ්‍රාම ගත්තා වූ ද, නිලධාරියකුට ලංකාණ්ඩුව යටතේ ඔහුගේ වැටුපත් සම්පූර්ණ සේවා කාලපරිච්ඡේදයත් පාදක කොට ගෙන මේ රෙගුලාසිවල 2 වැනි වගන්තිය අනුව ගණන් බැලූ පාරිතෝෂිකයක් දිය හැකිය.

21අ. (1) මෙම ව්‍යවස්ථා සංග්‍රහයෙහි විරුද්ධව කුමක් සඳහන් වුව ද, මෙහි මින්මතු විධිවිධාන සලස්වා ඇති ආකාරයට යටත්ව, යම් රජයේ නිලධාරියකු අර්ථසාධක අරමුදලට දොළොස් මසක් හෝ ඊට වැඩි කාලයක් සාමාජික මුදල් ගෙවීමෙන් පසු රජයේ අනුමැතිය ඇතිව පළාත් පාලන සේවයට හෝ යම් ප්‍රාදේශීය බලමණ්ඩලයක සේවයට පත් කරනු ලැබ විශ්‍රාම වැටුප් මුදලක් හෝ පාරිතෝෂිකයක් ලැබීමට හිමි තත්ත්වයන් අනුව විශ්‍රාම වැටුප් හිමි නිලයකින් හෝ තනතුරකින් විශ්‍රාම ලැබීමේ දී ඔහුගේ මුළු සේවා කාලය සම්පූර්ණයෙන් රජය යටතේ තිබීම නිසා මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුපක් ලැබීමට සුදුසුකම් ලැබුයේ නම්, ඔහුගේ මුළු සේවා කාලය සම්පූර්ණයෙන් රජය යටතේ වූයේ නම්, ඒ සඳහා ඔහුට හිමි විශ්‍රාම වැටුප් මුදලට අනුපාතයෙන් සමානම විශ්‍රාම වැටුපක් ගෙවිය හැකිය. එසේ කළ හැක්කේ (434 වෙනි අධිකාරය වන) රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ආඥාපනතේ 14 වන වගන්තිය යටතේ ඔහුගේ ගිණුමට බැරවන සේ රජය විසින් ගෙවන ලද ප්‍රසාද මුදලකට හෝ ප්‍රදානයකට හෝ වෙනත් ප්‍රතිලාභයකට හෝ සමාන මුදලක් හා එම මුදල ලැබූ දා සිට එම මුදලට අවුරුද්දට සියයට හතර බැගින් වූ සාමාන්‍ය පොළියක් සමඟ ලේකම්වරයා විසින් ඉල්ලූ විටෙක ආපසු රජයට ගෙව්වහොත් පමණි.

(2) රජයේ නිලධාරියකුගේ සේවා කාලය මුළුමනින්ම රජය යටතේ වූයේ නම් මෙම වගන්තිය යටතේ ඔහුට හිමි විය යුතු විශ්‍රාම වැටුප් මුදල තීරණය කිරීමේ දී -

(අ) මෙම ව්‍යවස්ථා සංග්‍රහයේ 7 වන හා 30 වන වගන්තිය ගැන සැලකිලිමත් නොවිය යුතුය;

(ආ) ඔහුට ගෙවිය යුතු විශ්‍රාම වැටුප් මුදල ඔහු විසින් අවසන් වරට ලැබූ විශ්‍රාම හිමි වැටුපෙන් තුනෙන් දෙකකට වඩා අධික නොවිය යුතුය;

(ඇ) රජය යටතේ හෝ යම් ප්‍රාදේශීය බලමණ්ඩලයක් හෝ පළාත් පාලන සේවයක් හෝ යටතේ කරන ලද, විශ්‍රාම වැටුපක් හෝ පාරිතෝෂිකයක් ගෙවනු නොලබන සේවා කාලයක් ගණන් නොගත යුතුය;

(3) (1) වන උප වගන්තියෙහි දැක්වෙන අර්ථසාධක අරමුදලේ දායකයකු රජයේ සේවයෙන් මුදනු ලැබූ වහාම, ඔහුට පාලනය කළ නොහැකි හේතූන් නිසා පළාත් පාලන සේවයෙහි හෝ ප්‍රාදේශීය බලමණ්ඩලයක සේවයෙහි හෝ පත්වීම ලබන්නට නොහැකි වී ඉක්බිති පසු කලෙක පත්වීම ලද්දේ නම්, ඒ නිසා රජය යටතේ වූ සේවය හා කාරණයට ගැලපෙන පරිදි ප්‍රාදේශීය බලමණ්ඩලය හෝ පළාත් පාලන සේවය යටතේ වූ ඔහුගේ සේවය අතර වූ කඩවීම නොසලකා හැරිය යුතුය.

(4) මේ වගන්තියෙහි කාර්යයන් සඳහා -

(අ) සොළොස්විය සම්පූර්ණවීමෙන් පසු රජයේ සේවය යටතේ දැරූ ස්ථිර නිලයක හෝ නිලවල දී හෝ ප්‍රාදේශීය බලමණ්ඩලයක හෝ බලමණ්ඩලවල සේවයෙහි හෝ පළාත් පාලන සේවයෙහි යෙදී සිටියදී ලැබූ වැටුප හා ප්‍රාදේශීය බල මණ්ඩලයක හෝ බලමණ්ඩලවල හෝ පළාත් පාලන සේවය යටතේ හෝ දැරූ ස්ථිර නිලයක දී හෝ නිලවල දී ලැබූ අන් කිසි විශ්‍රාම වැටුප් හිමි වැටුප හා එක් කළ විට ලැබෙන ඓක්‍යය විශ්‍රාම වැටුප් හිමි මුළු වැටුප සේ සැලකිය යුතුය.

එසේ ද වුවත්, විශ්‍රාම වැටුප් හිමි වැටුපෙහි ඓක්‍යය ගණන් බැලීමේ දී රජය යටතේ හෝ ප්‍රාදේශීය බලමණ්ඩලයක් හෝ පළාත් පාලන ආයතනයක් හෝ යටතේ කරන ලද, විශ්‍රාම වැටුපක් හෝ පාරිතෝෂිකයක් හෝ ගෙවනු නොලබන කිසියම් සේවයක් ගණන් ගනු නොලැබිය යුතුය.

(ආ) "මුළු සේවා කාලය" යන්නෙන් -

(i) අර්ථ සාධක අරමුදලේ දායකයකු වශයෙන් අවසන් වරට රජය යටතේ කළ සේවය ඇතුළුව, ප්‍රාදේශීය බලමණ්ඩලයට හෝ පළාත් පාලන සේවයට ලැබූ පත් වීමට පෙර තමා දැරූ තනතුර හෝ නිලය මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත වූයේ නම්, මෙම ව්‍යවස්ථා සංග්‍රහය අනුව විශ්‍රාම වැටුප හෝ පාරිතෝෂිකය සඳහා ගණන් ගනු ලැබිය හැකි, රජය යටතේ කළ, සියලු සේවා කාලයන් ; හා

(ii) ප්‍රාදේශීය බලමණ්ඩලවල හා පළාත් පාලන සේවය යටතේ කළා වූ ද ඒ සඳහා අදාළ විය හැකි යම් ලිඛිත නීතියක් අනුව විශ්‍රාම වැටුප හෝ පාරිතෝෂිකය සඳහා පිළිගත හැකි සියලු සේවා කාලවල එකතුව ද අදහස් විය යුතුය ;

(ඇ) "අර්ථ සාධක අරමුදලේ දායකයා" යන්නෙන් (434 වෙනි අධිකාරය වන) රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල් ආඥාපනත යටතේ ප්‍රතිෂ්ඨාපනය කළ රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට දායක මුදල් ගෙවන්නෙක් හෝ එකී අරමුදලට දායක මුදල් ගෙවිය යුතු වූ කෙනෙක් වුව ද මොනයම් හේතුවක් නිසා හෝ දායක මුදල් නොගෙවූ තැනැත්තෙක් අදහස් විය යුතුය ; තව ද

(ඈ) "ප්‍රාදේශීය බලමණ්ඩලය" යනුවෙන් නාගරික සභාවක්, පළාත් ආණ්ඩු සභාවක්, සුළු නගර සභාවක් හෝ ගම සභාවක් අදහස් විය යුතුය.

(5) මෙම වගන්තියේ විධිවිධාන 1946 අප්‍රේල් මස 1 වැනි දින සිට ක්‍රියාත්මක වී ඇතැයි සැලකිය යුතුය.

22. (1934 අගෝස්තු මස 21 වැනි දිනය දරන නිවේදනයේ සඳහන් 21 වැනි වගන්තියෙන් 22 වැනි වගන්තිය නිෂ්ප්‍රභා විය.)

23. (1) මේ රෙගුලාසි යටතේ විශ්‍රාම වැටුපක් හිමි නිලධාරියකුට අන්‍ය ආණ්ඩුවක සේවය වෙනුවෙන් ද විශ්‍රාම වැටුපක් හෝ විශ්‍රාම වැටුප් හිමි වන තවර විටක දී වුවත් ලංකාණ්ඩුවේ සේවය වෙනුවෙන් ඔහුට ලැබිය යුතු මුළු විශ්‍රාම වැටුප දිය හැකිය. එහෙත් කිසිම කෙනෙකුට, අන්‍ය ආණ්ඩුවක සේවය වෙනුවෙන් ලැබෙන කිසියම් විශ්‍රාම වැටුපකට හෝ වැටුප් වලට හෝ එකතු කළ විට, ඔහු ලංකාවේ හෝ අන්‍ය ආණ්ඩුවක හෝ සේවය කළ කිසිම කාලයක දී ලැබූ විශ්‍රාම වැටුප් හිමි ඉහළම වැටුපෙන් තුනෙන් පංගු දෙකකට වැඩි වන විශ්‍රාම වැටුප් මුදලක් ලංකාවේ අරමුදලින් කිසි විටෙකවත් ලබා ගත නොහැකි ය. එසේ ඔහුගේ සම්පූර්ණ සේවා කාල පරිච්ඡේදය සතලිස් අවුරුද්දකට වැඩි වන, ලංකාවේ සේවයක් ගණන් ගැනීමට ඔහුට කිසිවිටෙකවත් ඉඩ දෙනු නො ලැබේ.

(2) මේ වගන්තියේ (1) වැනි උප වගන්තියේ නියමිත සීමාවට යටත් වන අවස්ථාවක දී ලංකාවේ අරමුදලින් ලැබිය යුතු විශ්‍රාම වැටුප් මුදල, අන්‍ය ආණ්ඩුවක සේවය වෙනුවෙන් එලෙස ම ලැබෙන කිසියම් විශ්‍රාම වැටුප් මුදලක් හෝ මුදල් හෝ සමඟ සලකා බලා නියම කිරීම පිණිස ලේකම්වරයාගේ අනුමැතියට යටත් විය යුතුය.

### ද්විතීයනය කරනු ලැබූ නිලධාරීහු

24. (1) ස්ථිර වූ සහ විශ්‍රාම වැටුප් හිමිවූ තනතුරක් දරන ආණ්ඩුවේ සේවාවේ නියුක්ත යම් නිලධාරියකු, ආණ්ඩුවේ සේවාවේ තාවකාලික තනතුරකට හෝ විශ්‍රාම වැටුප් අයිතිවාසිකම් නැති ආණ්ඩුවේ සේවාවේ යම් තනතුරකට හෝ ද්විතීයනය කර ඇති කල්හි, ඉදින් -

(අ) ඔහු අනිකුත් කරුණු අතින් විශ්‍රාම වැටුපකට හෝ පාරිතෝෂිකයට හෝ හිමිවන තත්ත්වයන් යටතේ සේවයෙන් විශ්‍රාම ගන්නේ නම් ද ;

(ආ) ඒ සේවයට ඔහු එසේ ද්විතීයනය කිරීම සඳහා නිසි බලධරයා විසින් බලය දී තිබුණේ නම් ද ;

(ඇ) විශ්‍රාම වැටුප් වලට හිමිකම් ඇතිව, ඒ සේවයට ඔහු ද්විතීයනය කරන ලද බවට ලේකම්වරයා විසින් ගැසට් පත්‍රයේ නිවේදනයක් පළකර තිබුණේ නම් ද ;

ඔහු එසේ ද්විතීයනය කරන ලද එම තනතුරෙහි ඔහු සේවය කර ඇති කාල පරිච්ඡේදය, මේ ව්‍යවස්ථා යටතේ ගෙවිය හැකි යම් විශ්‍රාම වැටුපක් හෝ පාරිතෝෂිකයක් හෝ සඳහා ගණන් ගත යුතුය.

(2) ඉහත කී (1) වැනි උප වගන්තියෙහි සඳහන් කරන ලද අන්දමේ එකී යම් නිලධාරියකු, ඔහු ද්විතීයනය කරනු ලැබූ තනතුර දරමින් සිටිය දී හෝ එකී තනතුරින් අස් වී තුන් අවුරුදු කාල පරිච්ඡේදයක් ඇතුළත දී හෝ සේවයෙන් විශ්‍රාම ගන්නා කල්හි, ඔහුට ගෙවිය යුතු විශ්‍රාම වැටුප හෝ පාරිතෝෂිකය හෝ ගණන් බැලීම සඳහා, විශ්‍රාම ගැනීමට කලින් අවසාන වරට ඔහු දැරූ විශ්‍රාම වැටුප් හිමි පත්වීම් වලට හෝ පත්වීමේ හෝ විශ්‍රාම වැටුප් හිමි පඩි නඩි පාදක කරගත යුතුය.

(3) මේ වගන්තියේ (1) වැනි උප වගන්තියේ හා (2) වැනි උප වගන්තියේ විධිවිධාන, 1957 ජූලි මස 1 වැනි දින දී වලංගු වූවාසේ සැළකිය යුතුය.

## ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයෝ

[1]25. මෙම ව්‍යවස්ථා සංග්‍රහයෙහි ඊට පටහැනිව කුමක් සඳහන්ව ඇති ද ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයෙකුගේ තත්ත්වයෙන් හෝ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයෙකුගේ තත්ත්වයෙන් නැතහොත් ඒ තත්ත්ව දෙකෙන්ම මාස 36 ක් සේවය කර ඇති ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරයෙකුගේ හෝ අභියාචනාධිකරණ විනිශ්චයකාරවරයෙකු විශ්‍රාම ගිය විට, විශ්‍රාම යන විට ලැබූ වැටුපෙන් සියයට 90 ක පදනම මත ගණන් බලනු ලබන විශ්‍රාම වැටුපක් ලැබීමට හිමිකම් ලැබිය හැකිය.

II සිට IX දක්වා වූ උප වගන්ති අවලංගු කරන ලදී.

[2]එසේ වුව ද ඔහුගේ සේවා කාලය අවුරුදු 3 කට අඩුවන අවස්ථාවක ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයෙකු හෝ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයෙකු වශයෙන්, ඒ ධුර දෙකින් එකක නැතහොත් ඒ ධුර දෙකෙහිම සේවා කාලය ද ඇතුළත්ව රජය යටතේ වූ ඔහුගේ මුළු සේවා කාලය

(i) ඔහුගේ පෙර සේවා කාලය මහාධිකරණ විනිශ්චයකාරවරයෙකු සහ / හෝ අධිකරණ නිලධරයෙකු වශයෙන් වූ විට අවුරුදු 7 කට හෝ ,

(ii) ඔහුගේ පෙර සේවා කාලය නීති නිලධරයෙකු සහ/ හෝ රජයේ නිලධරයෙකු වශයෙන් වූ විට අවුරුදු 10 කට නොඅඩු නම් පමණක් ඔහු විශ්‍රාම වැටුපකට හිමිකම ලැබිය යුතුය.

## ස්ථිර ලේකම්වරු, ලේකම්වරු හෝ කැබිනට් මණ්ඩලයේ ලේකම්

25අ. ස්ථිර ලේකම්වරුන්ට හෝ කැබිනට් මණ්ඩලයේ ලේකම්ට සහ ඔවුන්ගෙන් යැපෙන්නන්ටත් මේ ව්‍යවස්ථා සංග්‍රහය අනුව පහත පෙනෙන විධිවිධානයන්ට යටත්ව විශ්‍රාම වැටුප් ප්‍රදානය කළ හැකිය :-

(i) ආණ්ඩුවේ නිලධාරියෙකු ස්ථිර ලේකම් ධුරයට හෝ කැබිනට් මණ්ඩලයේ ලේකම් ධුරයට පත්ව, අනතුරුව ඒ ධුරයේ සිටිය දී රාජ්‍ය සේවාවෙන් විශ්‍රාම ගතහොත් ඒ පත්වීම මේ ව්‍යවස්ථා සංග්‍රහයේ 8 වැනි වගන්තිය සම්බන්ධයෙන් උසස් වීමක් වශයෙන් සැලකිය යුතුය.

(ii) රාජ්‍ය සේවාවෙන් පත් වූ ස්ථිර ලේකම් කෙනෙකු ජනාධිපතිතුමන් විසින් රාජ්‍ය සේවාවේ වෙන ධුරයකට මාරු කළහොත්, නැතහොත් ඒ ස්ථිර ලේකම්ගේම ඉල්ලීම පිට, ඔහු කලින් යෙදී සිටි සේවාවට හෝ ශ්‍රේණියට හෝ ධුරයට හෝ ආපසු යවන ලද්දේ නම් මේ ව්‍යවස්ථා සංග්‍රහය සම්බන්ධයෙන්, ස්ථිර ලේකම් ධුරයේ ඔහු ලැබූ වැටුප ගණන් නොගෙන ඔහු ස්ථිර ලේකම් වශයෙන් සේවය කළ කාල පරිච්ඡේදයේ දී ඔහු ඊට පෙර සිටි සේවාවේ නිලධාරියකු හෝ තනතුරු දරන්නෙකු මෙන් නොකඩවා සේවය කරමින් යථා ක්‍රමයෙන් වැටුප් වැඩිවීම ලබා ගත්තකු වශයෙන් සැලකිය යුතුය.

(iii) ජනාධිපතිතුමා ස්ථිර ලේකම් හෝ කැබිනට් මණ්ඩලයේ ලේකම් කෙනෙකු (ඒ ලේකම්ගේ ඉල්ලීමක් නැතිව) මාරු කිරීමට නියම කර, විශේෂ කොන්දේසි පිට සේවාවෙන් විශ්‍රාම ගැනීමට ඒ ස්ථිර ලේකම් හෝ කැබිනට් මණ්ඩලයේ ලේකම් කරන ඉල්ලීමට අවසර දුනහොත්, මේ ව්‍යවස්ථා සංග්‍රහයේ 7 වැනි වගන්තිය අනුව ඔහුට දීමනාවක් දියයුතුය. එහෙත් ස්ථිර ලේකම් හෝ කැබිනට් මණ්ඩලයේ ලේකම් ධුරයේ දී ලැබූ වැටුප් ගැන නොසලකා, ස්ථිර ලේකම් හෝ කැබිනට් මණ්ඩලයේ ලේකම් ධුරයේ සිටි කාල පරිච්ඡේදයේ දී ඔහු ඊට පෙර සිටි සේවාවේ නිලධාරියකු හෝ තනතුරු දරන්නකු හෝ මෙන් නොකඩවා සේවය කරමින් යථා ක්‍රමයෙන් වැටුප් වැඩිවීම ලබා ගත්තකු වශයෙන් සැලකිය යුතුය.

---

[1]2001.06.28 දින අංක 1190/18 දරණ ගැසට් පත්‍රය බලන්න. මෙම සංශෝධනය 1996 දෙසැම්බර් මස 24 වන දින බලාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතුය.

[2]1990.02.08 දින අංක 597 දරණ ගැසට් පත්‍රය බලන්න. මෙම සංශෝධනය 1985 ජනවාරි මස 1 වන දින සිට ක්‍රියාත්මක වූ ලෙස සියළු කාර්ය සඳහා සලකනු ලැබිය යුතුය.

(iv) 1970 මැයි 30 වැනි දින ස්ථිර ලේකම්වරයකුගේ තනතුරක සේවයේ යෙදී සිටියා වූ ද, එදිනට වයසින් පණස් පස් වැනි වර්ෂයට නො එළඹ සිටියා වූ ද යම් රජයේ නිලධාරියකු විසින්, 1970 අගෝස්තු 31 වැනි දින හෝ ඊට පෙර ජනාධිපතිතුමන් වෙත යථා පරිදි ලියවිල්ලක් මගින් දැන්වීමක් කිරීමෙන් රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ලබන්නට කැමැත්ත ප්‍රකාශ කළ හැකි අතර, ඔහුගේ එම විශ්‍රාම ලැබීම වලංගු වීමේ දී, මෙම ව්‍යවස්ථා සංග්‍රහයෙහි 7 වැනි වගන්තිය යටතේ තනතුර අහෝසි කිරීම හේතුකොට ගෙන ඔහු රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ලැබුවේ නම්, ඔහුට ප්‍රදානය කරනු ලැබිය හැකි ප්‍රමාණයක විශ්‍රාම වැටුපක් හෝ පාරිතෝෂිකයක්, ඔහුට ප්‍රදානය කළ හැකිය.

[1](v) ස්ථිර ලේකම්වරයකු හෝ ලේකම්වරයෙකු වශයෙන් තමා පත්කරනු ලැබූ අවස්ථාවේදී 25ඇ(5) වන වගන්තියේ අර්ථානුකූලව නීති නිලධරයකු වූද (iv) වන ඡේදයෙහි සඳහන් කර ඇත්තා වූද යම් ස්ථිර ලේකම්වරයකු හෝ ලේකම්වරයකු විශ්‍රාම ගන්නා අවස්ථාවේදී ඔහු ලබමින් සිටි වැටුපෙන් 1/450 ක ප්‍රමාණයක විශ්‍රාම වැටුපක් 10 වන වගන්තියට යටත්ව, ඔහුගේ සේවයේ එක් එක් මාසය වෙනුවෙන් ඔහුට ගෙවනු ලැබිය යුතු අතර, ඊට අමතරව ඔහුගේ සේවයේ එක් එක් සම්පූර්ණ මාස දෙකක සේවා කාල පරිච්ඡේදය වෙනුවෙන් එක් මාසය බැගින් එකතු කරනු ලැබිය යුතුය. ඒ එකතුව කිසිම අවස්ථාවකදී මාස එකසිය විස්සක සම්පූර්ණ කාල සීමාවක් නොඉක්මවිය යුතුය.

එසේ වුවද ඒ සේවයට එකතු කරනු ලබන මාස මුළු ගණන විශ්‍රාම ගන්නා අවස්ථාවේදී නිලධාරියාගේ වයසට එකතු කරනු ලැබුවහොත් ඔහුගේ වයස අවුරුදු හැට දක්වා ගෙන එන මුළු ගණන නොඉක්මවිය යුතුය.

එසේම තවදුරටත්, ඒ නිලධරයාට ගෙවිය යුතු විශ්‍රාම වැටුප කිසි විටෙක, ඔහු විශ්‍රාම ගන්නා අවස්ථාවේදී වූ ඔහුගේ වැටුපෙන් තුනෙන් දෙකක් නොඉක්මවිය යුතුය.

[2](vi) මෙම ව්‍යවස්ථා සංග්‍රහයේ මීට පටහැනිව කුමක් සඳහන් වුවද, 1977 ජූලි මස 22 වන දින ලේකම් තනතුර දරා තදනන්තරව එම තනතුරට නැවත පත් නොකරන ලද්දා වූ යම් රාජ්‍ය නිලධරයෙකු විසින් විශ්‍රාම ගැනීමට මනාපය පළ කළ හැකිය. තවද එම මනාපය ජනාධිපතිවරයා විසින් පිළිගනු ලැබූවිට මෙම ව්‍යවස්ථා සංග්‍රහයේ 7 වන වගන්තිය යටතේ තනතුර අහෝසි කිරීම හේතුකොට ගෙන රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ලැබුවේ නම්, ඔහුට ප්‍රදානය කරනු ලැබිය හැකි ප්‍රමාණයක විශ්‍රාම වැටුපක් හෝ පාරිතෝෂිකයක් ඔහුට ප්‍රදානය කළ හැකි අතර, එසේ ප්‍රදානය කරනු ලබන විශ්‍රාම වැටුප හෝ පාරිතෝෂිකය ලේකම් වශයෙන් ලැබූ වැටුප මත මෙම ව්‍යවස්ථා සංග්‍රහයෙහි 8 වන වගන්තියෙහි විධිවිධානවලට අනුකූලව ගණන් බලනු ලැබිය යුතුය.

(vii) ලේකම්, අතිරේක ලේකම් දිසා අමාත්‍යාංශයේ ලේකම් හෝ අමාත්‍ය මණ්ඩලයේ ලේකම් තනතුරක් දැරූ යම් රජයේ නිලධරයෙකු ( ඔහුගේම ඉල්ලීම මත හැර) වෙනත් යම් රජයේ තනතුරකට පසුව මාරු කරනු ලැබූ අවස්ථාවක ඒ නිලධරයාගේ විශ්‍රාම ගැනීමේ මනාපය තෝරා ගත හැකි අතර ඒ මනාපය පත් කිරීමේ බලධරයා විසින් පිළිගනු ලැබූවිට, මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව ඇත්ද, ඔහුට මේ ව්‍යවස්ථා සංග්‍රහය 1 වන වගන්තිය යටතේ ප්‍රදානය කරනු ලැබිය හැකි වූ යම් ප්‍රමාණයක විශ්‍රාම වැටුපක් හෝ පාරිතෝෂිකයක් දෙනු ලැබිය හැකි අතර, එසේ ප්‍රදානය කරනු ලැබූ විශ්‍රාම වැටුප් පාරිතෝෂිකය, ඒ නිලධාරියා විසින් අවස්ථාවෝචිත පරිදි, ලේකම්, අතිරේක ලේකම්, දිසා අමාත්‍යාංශයේ ලේකම් හෝ අමාත්‍ය මණ්ඩලයේ ලේකම්වරයා හෝ වශයෙන් ලැබූ වැටුප මත ගණනය කරනු ලැබිය යුතුය.

(viii) අමාත්‍ය මණ්ඩලයේ අතිරේක ලේකම් තනතුර හෝ අමාත්‍ය මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් තනතුර දැරූ යම් රාජ්‍ය නිලධාරියෙකුගේ සේවය, තදනන්තරව අමාත්‍ය මණ්ඩලය විසින් නතර කරනු ලබන අවස්ථාවේදී එම නිලධාරියා විසින් විශ්‍රාම ගැනීමට තීරණය කරනු ලැබිය හැකි අතර එම තීරණය අමාත්‍ය මණ්ඩලය විසින් පිළිගනු ලැබූ විට මෙම ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන් වුව ද මෙම ව්‍යවස්ථාවේ 7 වන වගන්තිය යටතේ ඔහුට ප්‍රදානය කරනු ලැබිය හැකි ප්‍රමාණයක යම් විශ්‍රාම වැටුපක් හෝ පාරිතෝෂිකයක් ප්‍රදානය කරනු ලැබිය හැකිය. තව ද ප්‍රදානය කරනු ලබන විශ්‍රාම වැටුප හෝ පාරිතෝෂිකය ඒ නිලධාරියා විසින් අමාත්‍ය මණ්ඩලයේ අතිරේක ලේකම් හෝ අමාත්‍ය මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් වශයෙන් ලබාගන්නා ලද වැටුප මත මෙම ව්‍යවස්ථා සංග්‍රහයේ 8 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව ගණන් බලනු ලැබිය යුතුය.

---

[1]1986.08.08 දින අංක 414 දරණ ගැසට් පත්‍රය බලන්න. මෙම සංශෝධනය 1970 ජූනි මස 07 දින සිට බලාත්මක වූ ලෙස සළකනු ලැබිය යුතුය.

[2]1978.01.06 දින අංක 299 දරණ ගැසට් පත්‍රය බලන්න.

(ix) මෙම ව්‍යවස්ථා සංග්‍රහයේ 7 (2) වැනි වගන්තියේ සඳහන් පරිදි රාජ්‍ය සේවාවට ආපසු කැඳවීමට යටත් වීම පිළිබඳ විශේෂ විධිවිධානය, රාජ්‍ය සේවාවෙන් පත් නොවූ ස්ථිර ලේකම්, ලේකම් හෝ කැබිනට් මණ්ඩලයේ ලේකම් කෙනෙකුට අදාළ නො විය යුතුය.

(x) නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ සභානායකගේ ලේකම් ධුරය, ආණ්ඩුපක්ෂයේ ප්‍රධාන සංවිධායක ලේකම් ධුරය හෝ විපක්ෂ නායකගේ ලේකම් ධුරය දරමින් සිටි යම් රජයේ නිලධාරියකු (ඔහුගේ ඉල්ලීම පරිදි හැරුණු විට) නිසි බලධරයා විසින් රජයේ වෙනත් යම් තනතුරකට පසුව මාරු කරනු ලබන අවස්ථාවක, එම නිලධාරියා විසින් විශ්‍රාම ගැනීමට මනාපය පළ කරනු ලැබිය හැකි අතර, එම මනාපය නිසි බලධරයා විසින් පිළිගනු ලැබීමෙදී මෙම ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව ඇතද, ව්‍යවස්ථා සංග්‍රහයේ 7 වන වගන්තිය යටතේ ඔහුට පිරිනැමිය හැකි ප්‍රමාණයක විශ්‍රාම වැටුපක් හෝ පාරිතෝෂිකයක් ඔහුට පිරිනැමිය යුතුය; තවද එසේ පිරිනමනු ලබන විශ්‍රාම වැටුප හෝ පාරිතෝෂිකය, මෙම ව්‍යවස්ථා සංග්‍රහයේ 8 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව, අවස්ථාවෝචිත පරිදි එම නිලධාරියා විසින් නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ සභානායකගේ ලේකම් ධුරය, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකගේ ලේකම් ධුරය හෝ විපක්ෂ නායකගේ ලේකම් ධුරය දරමින් සිටියදී ලැබූ වැටුප අනුව ගණන් බලනු ලැබිය යුතුය.

මේ ඡේදයේ කාර්යයන් සඳහා "නිසි බලධරයා" යන්නෙන් ඒ ඡේදයෙහි සඳහන් යම් රජයේ නිලධාරියකු විසින් දරනු ලබන ධුරයකට පත්වීම් කිරීමට බලය ඇති බලධරයා අදහස් වේ.

[1](xi) (i) මෙම ව්‍යවස්ථා සංග්‍රහයෙහි පටහැනිව කුමක් සඳහන්ව ඇතද, අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයෙකුගේ අමාත්‍යාංශයක ලේකම් තනතුරක් දරන යම් තැනැත්තෙකු විනයානුකූල හේතූන් මත හැර එම ලේකම් තනතුර දැරීම අවසන් කරන අවස්ථාවකදී -

(අ) ඔහු රාජ්‍ය සේවයෙන් බාහිරව එම තනතුරට පත් කරනු ලැබ නොකඩවා අවුරුදු පහකට නොඅඩු කාලයක් ඒ තනතුර දරා ඇත්නම් ඒ කාලසීමාවේ දී ඔහු අන්තිමට ලබාගත් වැටුපෙන් සියයට හැට හයයි තුනෙන් දෙකකට සමාන විශ්‍රාම වැටුපක් ද ඉන් ඉක්බිතිව අවුරුදු පහට වැඩිවන සේවය කළ එක් එක් මාසය සඳහා, අවුරුදු අටක සේවයට සියයට අසූ පහක උපරිමයට යටත්ව 0.51% ක වැඩි කිරීමක් ද ගෙවනු ලැබිය හැකිය. එසේ වුව ද 1985 ජනවාරි මස 01 වැනි දිනට පෙර එහෙත් 1977 ජූලි මස 22 වැනි දිනට පසුව විශ්‍රාම ගත් එවැනි ලේකම්වරයෙකු සම්බන්ධයෙන් වන විට, විශ්‍රාම වැටුප ඒ කාලසීමාව තුළ දී රජයේ නිලධරයකුට ගෙවිය හැකි වූ උපරිම ප්‍රතිශතයට සීමාවිය යුතුය.

(ආ) ඔහු රජයේ නිලධරයෙකුව සිට විශ්‍රාම ගැනීමෙන් පසුව අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයෙකුගේ අමාත්‍යාංශයක ලේකම් තනතුරකට පත්කරගනු ලැබූ හෝ විශ්‍රාම ලැබීමට පෙර අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයෙකුගේ අමාත්‍යාංශයක ලේකම් තනතුරක් දරා විශ්‍රාම ගැනීමෙන් පසුව ඒ ලේකම්වරයා වශයෙන් නැවත සේවයේ යොදවනු ලැබූ හෝ රජයේ නිලධරයෙකු නම්, ඉහත (අ) අනුඡේදයේ නිශ්චය කොට දැක්වෙන පදනම මත ප්‍රතිශෝධිත හෝ රජයේ නිලධරයෙකුට අදාළ රීති මත පදනම් වූ සංශෝධිත ඔහු කලින් විශ්‍රාම ගත් අවස්ථාවේදී ලැබූ විශ්‍රාම වැටුප සහ ඔහු අවසන් වරට ලැබූ වැටුප යන මෙයින් ඔහුට වඩා වාසිදායක ප්‍රමාණය ඔහුට ගෙවනු ලැබිය හැකිය.

(ii) ඉහත (අ) අනුඡේදය යටතේ විශ්‍රාම වැටුපක් ගෙවනු ලැබිය යුතු යම් තැනැත්තෙකු සම්බන්ධයෙන් කිසි පරිවර්තිත පාරිතෝෂිකයක් ගෙවනු නොලැබිය යුතුය.

(iii) (ආ) අනුඡේදය සම්බන්ධයෙන් 'රජයේ නිලධරයෙකු' යන යෙදුමට සන්නද්ධ සේවාවල නිලධරයෙකු ද ඇතුළත් විය යුතුය.

(iv) මෙම ඡේදයෙහි "අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයෙකුගේ අමාත්‍යාංශයක ලේකම්" යන යෙදුමට ලේකම්වරයෙකුගේ වැටුප් පරිමාණයම ලබන්නා වූ ද, එවැනි ලේකම්වරයෙකුගේ ධුරයට සමාන ධුරයක් ලෙස අතිගරු ජනාධිපතිවරයා විසින් අනුමත කරනු ලැබ ඇත්තාවූ ද ධුරයකට පත් කරනු ලැබූ තැනැත්තෙකු ඇතුළත් වේ.

(v) මෙම විධිවිධාන ලේකම්වරුන් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයට අදාළ වන ලේකම්වරයන් සම්බන්ධයෙන් ද අදාළ විය යුතුය.

---

[1]1992.03.27 දින අංක 708 දරණ ගැසට් පත්‍රය බලන්න. මෙම සංශෝධන 1977 ජූලි මස 29 වැනි දින ක්‍රියාත්මක වුවා සේ සළකනු ලැබිය යුතුය.

### දෙපාර්තමේන්තු ප්‍රධානයෝ

25ආ. කිසියම් නියමිත කාල පරිච්ඡේදයකට, දෙපාර්තමේන්තු ප්‍රධානයකු වශයෙන් විශ්‍රාම වැටුප් හිමි ධුරයකට පත් කරනු ලැබූ ආණ්ඩුවේ නිලධාරියකු එම කාල පරිච්ඡේදය අවසානයේ දී එම ධුරයට නැවතත් පත් නො කරනු ලැබූ කල්හි, නැතහොත් නැවත පත් කරනු ලැබීමට කැමති නොවන කල්හි ඔහු විශ්‍රාම ගැන් වූ ලෙස සැලකිය යුතු වන අතර, වයස නිසා හෝ රෝගී භාවය නිසා හෝ විශ්‍රාම ගන්වනු ලැබී නම් මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ඔහුට ලැබිය හැකිව තිබූ විශ්‍රාම වැටුප නැතහොත් පාරිතෝෂිකය වැනි වූ ම විශ්‍රාම වැටුපක් හෝ පාරිතෝෂිකයක් හෝ ඔහුට දිය හැකි වන්නේ ය.

### අධිකරණ නිලධාරීහු

[1]25 ආආ (1) මහාධිකරණ විනිශ්චයකාරවරයෙකු වශයෙන් මාස 84 ක දළ සේවා කාලයක් සම්පූර්ණ කිරීමට ප්‍රථම රෝගාතුර වීම හෝ වයස හේතුකොට ගෙන විශ්‍රාම ගන්නා මහාධිකරණයේ විනිශ්චයකාරවරයෙකු, ඒ සේවා කාලයේ එක් එක් වර්ෂය සඳහා, ඔහුගේ වාර්ෂික වැටුපෙන් 1/12 බැගින් වූ අනුප්‍රමාණයක් අනුව ගණන් බලනු ලබන පාරිතෝෂිකයක් ලැබීමට හිමිකම ලැබිය හැකිය.

(2) මහාධිකරණ විනිශ්චයකාරවරයෙකු වශයෙන් වූ ස්වකීය සේවා කාලය මාස 84 කට නොඅඩුව ඇති මහාධිකරණ විනිශ්චයකාරවරයෙකු විශ්‍රාම ගිය විට, 2 වන වගන්තියේ නියම කර ඇති පරිදි, විශ්‍රාම වැටුපකට හිමිකම් ලැබිය හැකිය. මහාධිකරණ විනිශ්චයකාරවරයෙකු වශයෙන් වූ ස්වකීය සේවා කාලය මාස 168 කට නොඅඩු වන්නේ නම් අවුරුදු තිහක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සේ සලකා ඊට අදාළ ප්‍රතිශතය මත ගණන් බලනු ලබන විශ්‍රාම වැටුපක් ලැබීමට හිමිකම ලැබිය හැකිය.

[1]25 ඇ (1) යම අධිකරණ නිලධරයකු එවැනි නිලධාරියකු වශයෙන් මාස 84 ක දළ සේවා කාලයක් සම්පූර්ණ කිරීමට ප්‍රථම රෝගාතුර වීම හෝ වයස හේතුකොට ගෙන විශ්‍රාම ගැනීමේ දී, විශ්‍රාම යන අවස්ථාවේ දී ඔහු දැරූ ස්ථිර තනතුරේ වාර්ෂික වැටුපෙන් 1/12 බැගින් වූ අනුප්‍රමාණයක් අනුව ගණන් බලනු ලබන සේවා කාලයේ එක් එක් වර්ෂය සඳහා පාරිතෝෂිකයක් ලැබීමට හිමිකම ලැබිය හැකිය.

(2) අධිකරණ නිලධරයෙකු වශයෙන් වූ ස්වකීය සේවා කාලය මාස 180 කට අඩු නොවන අධිකරණ නිලධරයකු විශ්‍රාම ගිය විට, 2 වන වගන්තියේ නියම කර ඇති පරිදි විශ්‍රාම වැටුපකට හිමිකම ලබන අතර අවුරුදු 30 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සේ සලකා ඊට අදාළ ප්‍රතිශතය මත ගණන් බලනු ලබන විශ්‍රාම වැටුපක් ලැබීමට හිමිකම ලැබිය හැකිය.

[1]25 ඇඇ (1) යම් නීති නිලධරයකු එවැනි නිලධරයකු වශයෙන් මාස 120 ක දළ සේවා කාලයක් සම්පූර්ණ කිරීමට ප්‍රථම රෝගාතුර වීම හෝ වයස හේතුකොට ගෙන විශ්‍රාම ගැනීමේ දී, විශ්‍රාම යන අවස්ථාවේ දී ඔහු විසින් දරන ලද තනතුරකට අදාළ වූ වාර්ෂික වැටුපෙන් 1/12 බැගින් වූ ප්‍රමාණයක් අනුව ගණන් බලනු ලබන සේවා කාලයේ එක් එක් වර්ෂය සඳහා පාරිතෝෂිකයක් ලැබීමට හිමිකම ලැබිය හැකිය.

(2) නීති නිලධරයකු වශයෙන් වූ ස්වකීය සේවා කාලය මාස තුන් සියයකට අඩු නොවන නීති නිලධරයකු විශ්‍රාම ගිය විට, 2 වන වගන්තියේ නියම කර ඇති පරිදි, විශ්‍රාම වැටුපකට හිමිකම ලබන අතර අවුරුදු 30 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සේ සලකා ඊට අදාළ ප්‍රතිශතය මත ගණන් බලනු ලබන විශ්‍රාම වැටුපක් ලැබීමට හිමිකම ලැබිය හැකිය.

25(ඈ) අවලංගු කරන ලදි.

26 (i) විශ්‍රාම ගන්නා අවස්ථාවේදී යහපත් සේවා දීමනාවක් ලබමින් සිටින්නා වූ, පොලිස් හමුදාවේ යම් නිලධාරියකුට හෝ විශ්‍රාම ගැනීමට පෙර යම් අවස්ථාවකදී යහපත් සේවා දීමනාවක් ලබමින් සිටියාවූ පොලිස් හමුදාවේ යම් නිලධරයකුට හෝ මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ඔහු වෙත ගෙවනු ලැබිය හැකි යම් විශ්‍රාම වැටුපකට අමතරව එම යහපත් සේවා දීමනාවක් ඔහු විශ්‍රාම ගනු ලැබීමේදී ලබාගත හැකිය.

(ii) සුරාබදු දෙපාර්තමේන්තුවේ සිටින්නා වූ ද, සේවාවෙන් විශ්‍රාම ගන්නා කාලයේ දී යහපත් ආචාරය නිසා මාසයකට රු. 10 ගණනේ දීමනාවක් ලබන්නා වූ ද සාජන්වරුන්ට හා මුරකාරයන්ට, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ දිය හැකි යම් කිසි විශ්‍රාම වැටුපකට අතිරේක වශයෙන් මාසයකට රු. 10 බැගින් ලබා ගත හැකිය.

(iii) (දුම්රිය දෙපාර්තමේන්තුවේ සේවයෙහි යෙදී සිටින) කවර ශ්‍රේණියකට අයත් කවරෙක් වුවත් අකාර්යක්ෂමභාවය හෝ විෂමාචාරය හෝ නිසා (විශ්‍රාම වැටුපක් නැති ව හෝ අඩු විශ්‍රාම වැටුපක් ඇති ව හෝ) විශේෂ විභාගයක් අනවශ්‍යය යි හැඟේතොත්, එවැනි කිසිම විභාගයක් නො පවත්වා, තනතුරෙන් පහකර දමනු ලැබීමට හෝ තාවකාලික වශයෙන් නවත්වනු ලැබීමට හෝ තත්ත්වයෙන් පහළ දමනු ලැබීමට යටත් වේ.

---

[1] 2001.06.28 දින අංක 1190/18 දරණ ගැසට් පත්‍රය බලන්න.

### පොලිස් උප සේවය

[1]26 අ (i) පොලිස් උප සේවයේ මාස 240 ට නොඅඩු සක්‍රිය දළ සේවයක් සම්පූර්ණ කර ඇති සෑම පොලිස් නිලධාරියෙකුටම විශ්‍රාම වැටුපකට හිමිකම් ඇති අතර, එබඳු අයෙකුට විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 2 වන වගන්තියේ විධිවිධාන අනුව විශ්‍රාම වැටුපක් ගෙවිය යුතු ය.

(ii) මාස 240 ක සක්‍රිය සේවයක් සම්පූර්ණ කිරීමට ප්‍රථම, එහෙත් මාස 120 ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කොට විශ්‍රාම යන පොලිස් උප සේවයේ සෑම පොලිස් නිලධාරියෙකුටම විශ්‍රාම ගන්නා අවස්ථාවේ ලද මාසික වැටුපෙන් 12 න් පංගුව බැගින්, සේවය කළ එක් එක් මාසය වෙනුවෙන් ගණන් බලනු ලබන පාරිතෝෂිකයක් ගෙවිය යුතුය.

මෙම වගන්තිය යටතේ විශ්‍රාම වැටුපක් හෝ පාරිතෝෂිකයක් සඳහා හිමිකම ඇති නිලධාරියකු විශ්‍රාම වැටුප් හිමි තනතුරකට පත් කරන විට ඔහුගේ පත්වීමේ දින සිට අවස්ථාවෝචිත පරිදි වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල යටතේ හෝ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල යටතේ හෝ ඒ නිලධරයා විසින් ගෙවිය යුතු දායක මුදල්වල හිඟ මුදල්, ඔහු වෙත ආපසු ගෙවනු ලබන රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලින් ගෙවීමට ඔහු යටත් විය යුතු ය.

### විශ්‍රාම වැටුප් අහිමි ධුරවල සේවය වෙනුවෙන් දෙන දීමනා

27. අවලංගු කරන ලදී.

28. 1947 ජනවාරි මස 1 වැනි දින සිට අවලංගු කරන ලදී.

### දෛනික වැටුප් ලබන සේවකයන්ට දෙන පාරිතෝෂික

29.(1) අවුරුදු දහයක හෝ ඊට වැඩි කාලයක සම්පූර්ණ සේවයක් ඇති දෛනික වැටුප් ලබන සේවකයකු ශාරීරික හෝ මානසික දුර්වලතාවයන් නිසා සිය ධුරයෙහි කටයුතු කිරීමට ශාරීරිකව නුසුදුසු බව, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් නම කරනු ලබන වෛද්‍ය මණ්ඩලයක වාර්තාවකින් පෙනී ගියහොත්, තමා සේවය කළ එක් එක් පූර්ණ මාසය වෙනුවෙන් මාසයක වැටුපෙන් 1/12 බැගින් ගණන් බලනු ලැබූ පාරිතෝෂිකයක් ඒ සේවකයාට ගෙවිය හැකිය. වයස පනස් පස් අවුරුද්දට වැඩි එවැනි සේවකයකු වෙනුවෙන් වෛද්‍ය මණ්ඩලයක් පත් කිරීම අවශ්‍ය නොවන නමුත් සේවකයාගේ වයස පණස් පස් අවුරුද්දට අඩු නොවන බව ඔප්පු කිරීමට සාක්ෂි ඉදිරිපත් කරන ලෙස දෙපාර්තමේන්තු ප්‍රධානයාට නියම කළ යුතුය.

(2) පූර්වෝක්ත උප වගන්තියෙහි කාර්යයන් සඳහා-

යම් සේවකයකු සම්බන්ධයෙන් "සම්පූර්ණ සේවය" යන්නෙන් අඛණ්ඩ සේවා කාලයක් හෝ අඛණ්ඩ නොවූ සේවා කාලවල එකතුවක් හෝ අදහස් විය යුතුය. එසේ ද වුවත් එම සේවයෙන් යම් කාලයක් ඒ සේවකයාගේ විෂමාචාරය නිසා අවසන් කර ඇති අවස්ථාවක, එසේ අවසන් කරන ලද දිනයට පෙර කරන ලද සේවා කාලය හෝ කාලයන් කිසිම පාරිතෝෂිකයක් සඳහා ගණන් නොගත යුතුය.

(3) සේවයෙහි සිටියදීම මරණයට පත් වූ දෛනික වැටුප් ලබන සේවකයකු මරණයට පත් වන අවස්ථාවේ විශ්‍රාම ගෙන සිටියේ නම් මෙම වගන්තිය යටතේ සාමාන්‍ය වශයෙන් ඔහුට හිමිවිය යුතු වූ පාරිතෝෂිකය ඔහු විශ්‍රාම ගත්තේ යයි සලකා ඔහුගේ වැන්දඹුවට හෝ ළඟම නෑයාට ගෙවිය හැකිය.

### සේවයේ කටයුතු ඉටු කිරීමේදී සිදු වූ තුවාල වෙනුවෙන් විශ්‍රාම වැටුප් ආදිය වැඩි කොට ගෙවීම

29අ. (i) 1934 අංක 19 දරන කම්කරු වන්දි ආඥාපනත යටතේ වන්දි ලැබීමට හිමිකම ඇති අයට හෝ ඔවුන්ගෙන් යැපෙන්නන්ට හෝ ඒ ආඥාපනත වලංගු වූ දින හෝ ඉන්පසුව හෝ ලංකාණ්ඩුවේ සේවයට ඒ සේවකයෝ අලුතෙන් පත් වූණි නම් මෙම ව්‍යවස්ථා සංග්‍රහයේ 30 වැනි, 31 වැනි සහ 31අ වැනි වගන්ති අදාළ නොවේ. එහෙත් ඒ දිනට කලින් ලංකාණ්ඩුව යටතේ කරන ලද සේවය ඇති අයකු, ඒ කලින් වූ සේවය වෙනුවෙන් මෙම රෙගුලාසි යටතේ විශ්‍රාම වැටුපක් හෝ විශ්‍රාම දීමනාවක් හෝ පාරිතෝෂිකයක් හෝ ලංකාණ්ඩුව විසින් පිහිටුවන ලද අර්ථසාධක අරමුදලක් යටතේ ප්‍රයෝජන හෝ ලද යුත්තක් වේ නම් ඒ අය මෙම වගන්තිය සම්බන්ධයෙන් අලුතෙන් පත් වූවන් කොට නො සැලකිය යුතුය.

(ii) යට කී ආඥා පනත යටතේ වන්දි මුදලක් හිමි වූ ද, යට කී අයුරු අලුතෙන් පත් නූවූ ද, අය සහ ඔවුන්ගෙන් යැපෙන්නවුන් ද සම්බන්ධයෙන්, 30 (iv) වැනි වගන්තියෙන් දක්වා ඇති පරිදි හැර මෙම ව්‍යවස්ථා සංග්‍රහයේ 30 වැනි 31 වැනි වගන්ති අදාළ නොවේ.

---

[1]2000.08.18 දින අංක 1146 දරණ ගැසට් පත්‍රය බලන්න. මෙම සංශෝධනය 1974 ජනවාරි මස 01 වන දින සිට බලාත්මක විය යුතු ය.

30. (i) රාජ්‍ය සේවකයකු හෝ දෛනික වැටුප් ලබන සේවකයකු හෝ

[1](අ) ඔහුගේ රාජකාරී කටයුතු ඉටු කිරීමේදී හෝ,

(ආ) ඔහු රාජකාරී කටයුතු ඉටු නොකරන අවස්ථාවේ දී වුව ද ඔහුගේ සාමාන්‍ය රාජකාරිවල විෂය සීමාව ඇතුළත වූ යම ක්‍රියාවක් කිරීමේ දී, හෝ

(ඇ) ඔහුගේ රාජකාරී කටයුතු සපුරාලීමෙහිලා යම් ක්‍රියාවක් ඉටු කිරීමෙහි ප්‍රතිඵලයක් වශයෙන්, හෝ

(ඈ) (I) ඔහුගේ වාසස්ථානයේ සිට රාජකාරී සඳහා වාර්තා කිරීම පිණිස සේවා ස්ථානය දක්වා, හෝ

(II) රාජකාරියෙන් පසු ඔහුගේ සේවා ස්ථානයේ සිට වාසස්ථානය දක්වා හෝ, කෙලින්ම යන ගමනක දී, හෝ

(ඉ) නිල කටයුතු වල නිරතවීම පිණිස ඔහුගේ සේවා ස්ථානයේ සිට කෙලින්ම යන ගමනක දී සහ ඔහුගේ සේවා ස්ථානයට ආපසු එන ගමනේ දී, හෝ

(ඊ) කැරලි කෝලාහලයක දී හෝ මහජන කැළඹීමක දී හෝ ත්‍රස්තවාදී ක්‍රියා හේතුකොට ගෙන හෝ රාජකාරී කටයුතු ඉටු කිරීමේ දී නැතහොත් එසේ නොවන අවස්ථාවක,

තුවාලයක් වීම හේතුකොටගෙන, සම්පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් හෝ ජීවනෝපායක යෙදීමට සඳහටම නොහැකි වන තත්ත්වයකට පත් වුව හොත්, මීට ඉහත වගන්තියේ ඇති විධිවිධානයන්ට හා ව්‍යතිරේකයන්ට යටත්ව, ඒ තුවාලය වෙනුවෙන් තුවාලය සිදු වූ දිනයේ දී ඔහුට ලැබුණ පඩියෙන් පහත දැක්වෙන කොටසට වැඩි නොවන, එනම් :-

ඔහුගේ තඩත්තුව කර ගැනීමේ ශක්තිය සුළු වශයෙන් හීන වූ කල, 5/60 ක ද,

හීන වූ කල, 10/60 ක ද,

අධික ලෙස හීන වූ කල, 15/60 ක ද,

සම්පූර්ණ වශයෙන් නැති වූ කල 20/60 ක ද,

වාර්ෂික දීමනාවක් ඔහුට දිය හැකි ය.

සියලුම කාර්ය සඳහා (අ), (ආ), (ඇ),(ඈ) හා (ඉ) ඡේද 1977 ජූලි මස 23 වන දින සිට ක්‍රියාත්මක වූ බව සලකනු ලැබිය යුතු අතර, සියලුම කාර්ය සඳහා (ඊ) ඡේදය 1983 ජූලි මස 23 දින සිට ක්‍රියාත්මක වූ බව සලකනු ලැබිය යුතුය.

(ii) පහත පෙනෙන අයුරු වුව හොත්, එනම් :

(අ) තුවාල ලැබූ තැනැත්තාගේ සේවා කාල පරිච්ඡේදය අනුව ඔහුට හිමිව තිබුණ වාර්ෂික විශ්‍රාම දීමනාවට වඩා අවුරුද්දකට රු. 1,000 කට නොඅඩු ගණනකින් සාමාන්‍ය මුදල වැඩි වුවහොත්, නැතහොත්,

(ආ) තුවාල ලැබූ තැනැත්තා යම් තුවාලයක් නිසා සේවාවෙන් විශ්‍රාම ගනී නම් ඒ තුවාලය සිදු වූවාට පසුවත් අවුරුද්දකට නො අඩු කාලයක් සේවය කර ඇතොත්, නැතහොත්,

(ඇ) තුවාලය සිදුවූ දිනයේ දී තුවාලය ලැබූ තැනැත්තා පනස් පස් හැවිරිදි හෝ ඊට වැඩි හෝ වෙතොත්, නැතහොත්,

(ඈ) සේවාවෙන් විශ්‍රාම ගැනීමට එකම හේතුව තුවාලයම නොවෙතොත්, එනම්, ඒ විශ්‍රාම ගැනීමට වයස හෝ දුර්වල භාවය ද, හේතුවක් වෙතොත්,

ඉහත සඳහන් ගණන් අනුව දිය හැකි මුදල් ප්‍රමාණයට වඩා දීමනාව, ලේකම්වරයා විසින් නියම කෙරෙන ගණනකින් අඩු විය යුතු ය.

(iii) ඉහත කී දීමනාව ලැබෙන්නේ තුවාල ලැබූ තැනැත්තා ස්වකීය සේවා කාල පරිච්ඡේදය නිසා ලැබීමට යෝග්‍ය වූ විශ්‍රාම වැටුපට හෝ විශ්‍රාම ගැනීමේ දීමනාවට හෝ පාරිතෝෂිකයට හෝ අතිරේක වශයෙනි. එහෙත්, එවැනි විශ්‍රාම වැටුපකට හෝ විශ්‍රාම ගැනීමේ දීමනාවකට හෝ එම දීමනාව එකතු කළ විට එය තුවාලය සිදු වූ දිනයේ දී ඔහු ලැබූ වැටුපෙන් 50/60 කට වැඩි නොවිය යුතුය. එහෙත් තුවාලය සිදුවූවාට පසුවත් නිලධාරියා සේවයෙහි යෙදී සිටීම නිසා සාමාන්‍ය විශ්‍රාම වැටුපක් හෝ විශ්‍රාම ගැනීමේ දීමනාවක් හෝ දීම, අවසාන වශයෙන් ඔහු සේවයෙන් විශ්‍රාම ගන්නා තුරු කල් දැමුවහොත්, නැතහොත් තුවාල ලැබීම නිසා දීමනාවක් ඇති ව සේවාවෙන් වරක් විශ්‍රාමගත් නිලධාරියෙකු ආපසු සේවාවට ගනු ලැබුවහොත්, අවසාන වශයෙන් විශ්‍රාම ගැනීමේ දී ඔහු ලැබූ වැටුප ද, තුවාලය සිදු වූ දිනයේ දී ඔහු ලැබූ වැටුප ද යන මෙ දෙකෙන් වැඩි එකෙන් 50/60 ට දීමනාව සීමාවිය යුතු ය.

[1]1986.08.15 දින අංක 415 දරණ ගැසට් පත්‍රය බලන්න.

(iv) දහ අවුරුද්දක දළ සේවයක් සම්පූර්ණ නොකිරීම නිසා පාරිතෝෂිකය පමණක් ලැබීමට හිමි වූ විශ්‍රාම වැටුප් සහිත නිලධාරියෙකුට, ඔහුට වුවමනා නම්, ඒ පාරිතෝෂිකය වෙනුවට තුවාල ලැබීම හේතු කොට යට කී පරිදි දෙන 60 න් පංගු ගණන සමඟ, ඔහු නියත වශයෙන් සේවය කළ මාස ගණනට සමාන 720 න් පංගු ගණනක වාර්ෂික දීමනාවක් දිය හැකිය. 1934 අංක 19 දරණ කම්කරු වන්දි ආඥාපනත යටතේ වන්දි මුදලක් හිමි වූ ද, විශ්‍රාම වැටුප් හිමි ධූරයක් දරන්නා වූ ද, නිලධාරියෙකුගේ සේවය වෙනුවෙන් ඔහුට වන්දි මුදලට අතිරේක වශයෙන් මෙ උපවගන්තියේ සඳහන් වන පරිදි වාර්ෂික දීමනාවක් දිය හැකිය.

[1]30 අ (1) මෙ ව්‍යවස්ථාවල පටහැනිව කුමක් සඳහන් වුවද එහෙත් මෙහි මින් මතු සලස්වා ඇති විධිවිධාන යටත්ව, රජයේ නිලධාරියෙකු-

(අ) ඔහුගේ රාජකාරි කටයුතු කිරීමේදී, හෝ

(ආ) ඔහු රාජකාරි කටයුතු ඉටු නොකරන අවස්ථාවක දී, එහෙත් ඔහුගේ සාමාන්‍ය රාජකාරිවල විෂය සීමාව ඇතුළත වූ යම ක්‍රියාවක් කිරීමේ දී, හෝ,

(ඇ) ඔහුගේ රාජකාරි කටයුතු ක්‍රියාත්මක කිරීමේ දී ඉටු කරන ලද යම් ක්‍රියාවක ප්‍රතිඵලයක් වශයෙන්, හෝ

(ඈ) (i) ඔහුගේ පදිංචි ස්ථානයේ සිට රාජකාරිය සඳහා වාර්තා කිරීම පිණිස සේවා ස්ථානය දක්වා, හෝ

(ii)රාජකාරියට පසු ඔහුගේ සේවා ස්ථානයේ සිට පදිංචි ස්ථානය දක්වා, හෝ කෙළින්ම යන ගමනක දී, හෝ

(ඉ) සේවා ස්ථානයේ සිට රාජකාරි කටයුතුවල නිරත වීම සඳහා කෙළින්ම යන ගමනක දී හෝ සේවා ස්ථානයට ආපසු කෙළින්ම එන ගමනක දී, හෝ

(ඊ) 1983 ජූලි මස 23 වන දින හෝ ඉන්පසුව සිදු වූ අරගලවල දී හෝ කැරැල්ලක දී හෝ මහජන කැළඹීමක දී හෝ ත්‍රස්තවාදී ක්‍රියාවල ප්‍රතිඵලයක් වශයෙන් සිදු වූ තුවාලයක ප්‍රතිඵලයක් වශයෙන් ඔහු අබලතාවයට පත්වූ විටෙක-

(i) ඒ නිලධාරියා සදහටම සම්පූර්ණ වශයෙන් අබලතාවයට පත්ව ඇතොත් සහ ඔහු සේවයට නුසුදුසු බවට සලකනු ලැබුවහොත්, අවස්ථාවෝචිත පරිදි, මාස හැටක වැටුපට හෝ මූලික වේතනයට;

(ii) ඒ නිලධාරියා තාවකාලික වශයෙන් සහ අර්ධ වශයෙන් අබලතාවයට පත්ව ඇතොත්, සහ ඔහු සැලකිය යුතු ආකාරයකින් දුර්වල බවට පත්ව ඇති බවට සලකනු ලැබුවහොත්, අවස්ථාවෝචිත පරිදි, මාස හතළිස් පහක වැටුපට හෝ මූලික වේතනයට ;

(iii) ඒ නිලධාරියා තාවකාලික වශයෙන් හා අර්ධ වශයෙන් දුබලතාවයට පත්ව ඇතොත් සහ ඔහු දුර්වල බවට පත්ව ඇති බවට සලකනු ලැබුවහොත්, අවස්ථාවෝචිත පරිදි, මාස තිහක වැටුපට හෝ මූලික වේතනයට ;

(iv) ඒ නිලධාරියා තාවකාලික වශයෙන් සහ අර්ධ වශයෙන් දුබලතාවයට පත්ව ඇතොත් සහ ඔහු සුළු වශයෙන් දුර්වල බවට පත්ව පත්ව ඇති බවට සලකනු ලැබුවහොත්, අවස්ථාවෝචිත පරිදි, මාස පහළොවක වැටුපට හෝ මූලික වේතනයට සමාන මුදලක් ඒ අබලතාවයට පත්වීම සම්බන්ධයෙන් වන්දියක ආකාරයෙන් ඔහුට ප්‍රදානය කරනු ලැබිය හැකිය.

(2) අබලතාවට පත්වීම සම්බන්ධයෙන් මෙ වගන්තිය යටතේ ගෙවිය යුතු වන්දි මුදල, මෙ ව්‍යවස්ථාවේ 30 වන වගන්තිය යටතේ හෝ වෙනත් යම් නීතියක් යටතේ හෝ ඒ අබලතාවට පත්වීම සම්බන්ධයෙන් ප්‍රදානය කරනු ලබන යම් දීමනාවලට අතිරේක වන්නේය.

(3) දෙපාර්තමේන්තුවේ ප්‍රධානයාගේ ඉල්ලීම පිට ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා විසින් තත් කාර්යය සඳහා පත් කරන ලද යථා පරිදි සංස්ථාපිත වෛද්‍ය මණ්ඩලයක් විසින්, නිලධරයා පරීක්ෂා කොට අබලතාව වර්ග කරන්නාවූ සහ ඒ නිලධරයාට නිර්දේශ කරනු ලබන නිවාඩු කාල සීමාව සඳහන් කරන්නාවූ ලිඛිත වාර්තාවක් ඉදිරිපත් කරනු ලැබුවහොත් මිස, කිසිම රජයේ නිලධාරියෙකු වන්දියකට හිමිකම් නොලබන්නේය.

(4) ආයතන අධ්‍යක්ෂවරයා, විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂවරයා සහ මුදල් අධ්‍යක්ෂවරයා යන අයගෙන් සමන්විත මණ්ඩලයක් විසින් මෙ වගන්තිය යටතේ ගෙවිය යුතු වන්දි මුදල තීරණය කරනු ලැබිය යුතුය.

(5) රජයේ නිලධරයෙකු තුවාල ලැබූ අවස්ථාවකදී ඒ තුවාලය ඒ නිලධරයාගේ නොසැලකිලිමත් භාවය නිසා සිදුවී ඇත්නම් සහ ඒ නොසැලකිලිමත්භාවය ඒ නිලධරයාගේ සහායක නොසැලකිලිමත්භාවය නිසා වන්නේ නම්, දෙපාර්තමේන්තු ප්‍රධානියා විමසා විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂවරයා විසින් තීරණය කරනු ලබන යම් මුදලක් මෙ වගන්තිය යටතේ ඒ නිලධරයාට ගෙවිය යුතු වන්දියෙන් අඩු කරනු ලැබිය හැකිය.

---

[1]1987.02.06 දින අංක 440 දරණ ගැසට් පත්‍රය බලන්න. මෙ නිවේදනයේ 1 වන, 2වන සහ 3වන ඡේද වලින් විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයට කරන ලද සංශෝධන 1986 මාර්තු 19 වන දින ක්‍රියාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතුය.

(6) නීතියට පටහැනිව හෝ ආණ්ඩුවේ හෝ දෙපාර්තමේන්තුවේ යම් රීති හෝ නියෝග උල්ලංඝනය කරමින් ක්‍රියා කරන අතරතුර රජයේ නිලධරයෙකුට තුවාල සිදුවූයේ නම්, ඒ කිසිම නිලධරයෙකුට මේ වගන්තිය යටතේ වන්දියකට හිමිකම නොලැබිය යුතුය.

(7) තුවාලයකින් උද්ගත වන සදහටම සහ සම්පූර්ණ අබලතාවයට පත්වීම සම්බන්ධයෙන් මේ වගන්තිය යටතේ වන්දිය සඳහා සුදුසුකම් ලබන රජයේ නිලධරයකු හෝ දෛනික වැටුප් ලබන සේවා නියුක්තිකයෙකු වන්දිය ගෙවීමට පෙර මිය යන අවස්ථාවක, ඒ තුවාලයේ ප්‍රතිඵලයක් වශයෙන් ඒ රජයේ නිලධරයා හෝ දෛනික වැටුප් ලබන සේවා නියුක්තිකයා මිය ගිය ලෙස, මේ ව්‍යවස්ථාවල 31 ඇ වගන්තියේ විධිවිධාන සලසා ඇති ආකාරයෙන් ඔහුට ලැබිය යුතු වන්දිය ඔහුගේ යැපෙන්නන්ට ගෙවිය යුතුය.

(8) මෙම වගන්තියේ කාර්යය සඳහා :

"සදහටම සහ සම්පූර්ණයෙන් අබලතාවයට පත්වීම" යන්නෙන් ඒ අබලතාවය නිසා උද්ගත වූ තුවාලය සිදුවූ අවස්ථාවේදී රජයේ නිලධරයකුට හෝ දෛනික වැටුප් ලබන සේවා නියුක්තයකුට ඉටු කිරීමේ හැකියාව ඇති වූ සියලු කාර්ය සම්බන්ධයෙන් ඔහු අශක්නුතාවයට පත් කරන්නාවූ ස්ථිර ස්වභාවයකින් වූ අබලතාවයක් අදහස් වේ :

එසේ වුවද දෙඇසෙහිම පෙනීම සදහටම සම්පූර්ණයෙන්ම නැතිවී යාම හෝ මෙම ව්‍යවස්ථාවල 31 අ වගන්තියෙහි දක්වා ඇති වක්‍රයෙහි සඳහන් තුවාල කීපයක් එකවර සිදුවීම නිසා උද්ගත වූ ඉපයීමේ ශක්තිය නැතිවීම එම වක්‍රයේ සඳහන් පරිදි සියයට සියයක්ම වීම යන අවස්ථාවක දී සදහටම සම්පූර්ණ අබලතාවයට පත්වූ ලෙස සලකනු ලැබිය යුතුය.

(9) මෙම වගන්තියේ රජයේ නිලධරයා යන්නෙහි අධිකරණ නිලධරයකු ඇතුළත් වන අතර සන්නද්ධ හමුදාවල සාමාජිකයෙකු හෝ පොලිස් නිලධරයෙකු ඇතුළත් නොවන්නේය.

31. (1) ආණ්ඩුවේ සේවකයකු හෝ දෛනික වැටුප් ලබන සේවකයකු හෝ ලංකාණ්ඩුවේ සේවාවෙහි යෙදී සිටියදී-

[1](අ) ඔහුගේ රාජකාරී කටයුතු ඉටු කිරීමෙ දී හෝ,

(ආ) ඔහු රාජකාරි කටයුතු ඉටු නොකරන අවස්ථාවේදී වුව ද ඔහුගේ සාමාන්‍ය රාජකාරි වල විෂය සීමාව ඇතුළත වූ යම් ක්‍රියාවක් කිරීමේ දී, හෝ

(ඇ) ඔහුගේ රාජකාරී කටයුතු සපුරාලීමෙහිලා යම් ක්‍රියාවක් ඉටු කිරීමෙහි ප්‍රතිඵලයක් වශයෙන්, හෝ-

(ඇ) (I) ඔහුගේ වාසස්ථානයේ සිට රාජකාරි සඳහා වාර්තා කිරීම පිණිස සේවා ස්ථානය දක්වා, හෝ

(II) රාජකාරියෙන් පසු ඔහුගේ සේවා ස්ථානයේ සිට වාසස්ථානය දක්වා හෝ, කෙලින්ම යන ගමනක දී, හෝ

(ඉ) නිල කටයුතු වල නිරතවීම පිණිස ඔහුගේ සේවා ස්ථානයේ සිට කෙලින්ම යන ගමනක දී සහ ඔහුගේ සේවා ස්ථානයට ආපසු එන ගමනේ දී, හෝ

(ඊ) [redacted]

තමා ලැබූ තුවාලවලින් මිය ගිය කල්හි ඒ ආණ්ඩුවේ සේවකයාගෙන් හෝ දෛනික වැටුප් ලබන සේවකයාගෙන් හෝ යැපෙන්නන්ට 2 (ඉ) වැනි, 29 වැනි සහ 44 වැනි වගන්ති යටතේ දෙන පාරිතෝෂිකයක් ඇතොත් ඊට අතිරේක වශයෙන්-

(i) ඒ ආණ්ඩුවේ සේවකයාගෙන් හෝ දෛනික වැටුප් ලබන සේවකයාගේ වැන්දඹු භාර්යාවක හෝ වැන්දඹු පුරුෂයෙකු සිටිනහොත් ඇය හෝ ඔහු දෙවැනි විවාහයකට ඇතුළත් නො වී හොඳ කල් ක්‍රියාවෙන් යුක්තව සිටින තාක් ම, ඔහුට තුවාල සිදු වූ දිනයේ දී ලැබුණ විශ්‍රාම වැටුප් හිමි වාර්ෂික වැටුපෙන් හැටෙන් පංගු දහයකට වැඩි නොවන මුදලක විශ්‍රාම වැටුප සහ අවුරුද්දට රු. 200 යන මේ දෙකෙන් වැඩි මුදලක්,

(ii) ඒ ආණ්ඩුවේ සේවකයාගේ වැන්දඹු භාර්යාවක හෝ වැන්දඹු පුරුෂයෙකු හා දරුවකු හෝ දරුවන් හෝ සිටිතොත් හා එසේ ම ඒ වැන්දඹු භාර්යාවට හෝ වැන්දඹු පුරුෂයාට (i) වැනි අනුච්ඡේදය යටතේ විශ්‍රාම වැටුපක් ලැබෙතොත්, ඒ එක් එක් දරුවාට දහ අට හැවිරිදි වයස වන තෙක්, ඊ අනුච්ඡේදයෙන් නියමිත විශ්‍රාම වැටුපෙන් අටෙන් එකකට වැඩි නොවන මුදලක විශ්‍රාම වැටුපක්,

(iii) ඒ ආණ්ඩුවේ සේවකයාගේ හෝ දෛනික වැටුප් ලබන සේවකයාගේ හෝ දරුවකු හෝ දරුවන් හෝ සිටිතත්, වැන්දඹු භාර්යාවක් හෝ වැන්දඹු පුරුෂයෙකු හෝ නැතිනම්, නැතහොත් වැන්දඹුවට විශ්‍රාම වැටුපක් නොලැබුණොත්, ඒ එක් එක් දරුවාට දහ අට හැවිරිදි වයස වන තෙක් (ii) වැනි අනුච්ඡේදයේ නියමිත මුදල මෙන් දෙගුණයක විශ්‍රාම වැටුපක්,

---

[1]1986.08.15 දින අංක 415 දරණ ගැසට් පත්‍රය බලන්න.

(iv) ඒ ආණ්ඩුවේ සේවකයාගේ හෝ දෛනික වැටුප් ලබන සේවකයාගේ හෝ දරුවකු හෝ දරුවනුත් මේ උප වගන්තිය යටතේ විශ්‍රාම වැටුපක් ලැබෙන භාර්යාවක් සිට, භාර්යාව පසු ව මළ හොත් ඒ එක් එක් දරුවාට දහ අට හැවිරිදි වයස වන තෙක් ඒ වැන්දඹු භාර්යාවගේ හෝ වැන්දඹු පුරුෂයාගේ මරණය සිදු වූ දින සිට මේ උප වගන්තියේ (ii) වැනි අනුච්ඡේදයෙන් නියමිත මුදල මෙන් දෙගුණයක විශ්‍රාම වැටුපක්,

(v) ඒ ආණ්ඩුවේ සේවකයාගේ හෝ දෛනික වැටුප් ලබන සේවකයාගේ හෝ වැන්දඹු භාර්යාවට හෝ වැන්දඹු පුරුෂයාට විශ්‍රාම වැටුපක් නොලැබේකොත් ඔහුගේ මව සම්පූර්ණ වශයෙන් හෝ ප්‍රමාණයකට හෝ ඔහුගෙන්/ඇයගෙන් යැපෙතොත්, ඒ මව යහපත් පැවැත්මෙන් යුතුව ද නඩත්තුව සඳහා සෑහෙන ආදායමක් නැතිව ද සිටිනතාක් ම, ඔහුගේ වැන්දඹු භාර්යාවක්/ඇයගේ හෝ වැන්දඹු පුරුෂයෙක් සිටියා නම් ඒ භාර්යාවට/පුරුෂයාට ලැබෙන්ට තිබුණ විශ්‍රාම වැටුපට වැඩි නොවන ප්‍රමාණයක විශ්‍රාම වැටුපක් මවට දිය හැකිය. එහෙත්-

[1](I) තුවාලය සිදුවූ දිනයේ දී වයස අවුරුදු හතලිස්පහට නොඑළඹී රජයේ නිලධරයෙකුට හෝ දෛනික වැටුප් ලබන සේවා නියුක්තයෙකුට තුවාලය සිදුවූයේ නම්, නැතහොත් තුවාලය සිදු වූ දිනයේ දී වයස අවුරුදු පනස්පහට එළඹී රජයේ නිලධරයකුට හෝ දෛනික වැටුප් ලබන සේවා නියුක්තයකුට තුවාලය සිදු වූයේ නම්, එවිට තුවාලය සිදු වූ දින ඔහුගේ වාර්ෂික විශ්‍රාම වැටුප් ලැබිය යුතු පඩි නඩි, ඔහු ශ්‍රී ලංකා ආණ්ඩුවේ සේවයෙහි නිරතව සිටියේ නම්, අවස්ථාවෝචිත පරිදි, වයස අවුරුදු පනස් පහට හෝ අවුරුදු හැටට ඔහු එළඹී දින ඔහුට ලබාගත හැකිව තිබූ පඩි නඩි රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ මතය අනුව ඔහුගේ වාර්ෂික විශ්‍රාම වැටුප් ලැබිය යුතු පඩි නඩි ලෙස සලකනු ලැබිය යුතුය.

(2) අවුරුද්දකට රු.200 යේ අඩුම විශ්‍රාම වැටුප පිළිබඳ විධිවිධානයන් අදාළ වන විට හැර මේ උපවගන්තිය යටතේ වැන්දඹුවට දෙන විශ්‍රාම වැටුප, තුවාල සිදු වූ දිනයේ දී ආණ්ඩුවේ සේවකයාට හෝ දෛනික වැටුප් ලබන සේවකයාට හෝ ලැබුණ විශ්‍රාම වැටුප් හිමි වැටුපෙන් භාගයකට වැඩි නොවිය යුතුය.

(3) මෙ උපවගන්තිය යටතේ දරුවන් සදෙනෙකුට වැඩි ගණනකට කිසි විටෙක වත් විශ්‍රාම වැටුප් නො ගෙවිය යුතුය.

(4) මවකට යම් විශ්‍රාම වැටුපක් දෙනු ලැබේ නම් ඒ මව විශ්‍රාම වැටුප දෙන කාලයේ දී වැන්දඹුවක්ව සිට ඊට පසුව නැවත විවාහයකට පත් වුවහොත්, ඒ දෙවන වරට විවාහයට පත් වූ දින සිට එම වැටුප් දීම නැවැත්විය යුතුය. මවට නඩත්තුව සඳහා වෙන ආදායම් මාර්ග සෑහෙන පමණ තිබේ යයි ලේකම්වරයාට පෙනී ගිය කවර විටෙක දී වුවත් ඒ විශ්‍රාම වැටුප ලේකම්වරයා නිර්ණය කරන ලද දිනයක දී නැවැත්විය යුතුය.

(5) මෙ වගන්තිය යටතේ දැරියකට (ගැණු දරුවකුට) හිමි විශ්‍රාම වැටුප දීම, ඕ හට වයස දහ අට අවුරුද්දකට අඩු වුවත්, ඒ දැරිය විවාහප්‍රාප්ත වීමේ දී නැවැත්විය යුතුය.

සියලුම කාර්ය සඳහා (අ), (ආ), (ඇ),(ඈ) හා (ඉ) ඡේද 1977 ජූලි මස 23 වන දින සිට ක්‍රියාත්මක වූ බව සලකනු ලැබිය යුතුය.

(2) [1]රජයේ නිලධරයෙකු හෝ දෛනික වැටුප් ලබන සේවා නියුක්තයකු, අවස්ථාවෝචිත පරිදි වයස අවුරුදු පනස් පහට හෝ හැටට එළඹියේ නම් තුවාලය සිදු වූ දින ඔහුට ලැබිය හැකි විශ්‍රාම වැටුප් හිමි වැටුප කුමක්දැයි තීරණය කිරීමේ දී, ඔහු කාර්යක්ෂමතා කඩඉම් සියල්ලම පසුකොට, පුරප්පාඩු ඇතිවීම පිට රඳා පවතින හෝ එසේ රඳා නොපවතින හෝ, පංතියෙන් පංතියට කෙරෙන උසස් වීම් ඇතුළු සාමාන්‍ය උසස් වීම් සියල්ලට පත් වූවාක් මෙන් සලකා ගත යුතුය. එහෙත් ඔහු කිසිම විශේෂ උසස්වීම් වලට හෝ කාර්යක්ෂමතා කඩඉම්වලින් උසස් කිරීම සඳහා නියමිත විභාගයන්ගෙන් හැර සෙසු විභාගයන්ගෙන් හෝ සාමාර්ථය ලැබීම පිට රඳා පවතින උසස්වීම් වලට හෝ පත් වූවාක් මෙන් නොසැලකිය යුතුය.

(3) තුවාල සිදු වූ පරිදි ගැන ආණ්ඩුවේ සේවකයාගෙන් හෝ දෛනික වැටුප් ලබන්නාගෙන් හෝ යැපෙන්ට සිටින්නන්ගේ වුවමනාවන් ගැන හෝ සලකා බලන විට දීමනාවක් දිය යුතු යයි නියෝජිත මන්ත්‍රී මණ්ඩලයට අවබෝධ වුවහොත්, මේ වගන්තියේ (1) වැනි උප වගන්තියේ "ඇ" අනුච්ඡේදයෙහි ඇති විධිවිධානයන් හි සඳහන් නියෝගයන් සම්පූර්ණ නුවූවත්, නියෝජිත මන්ත්‍රී මණ්ඩලයට ඕනෑ ම විශේෂ අවස්ථාවක දී මෙ වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ දීමනාවක් දෙන්ට බලය ඇත්තේ ය.

(4) විශ්‍රාම වැටුප් සහිත ධූරයක් නොදරන ආණ්ඩුවේ සේවකයකු හෝ දෛනික වැටුප් ලබන සේවකයකු සම්බන්ධයෙන්, මීට කලින් ඇති උපවගන්තිවල සඳහන් "විශ්‍රාම වැටුප හිමි වැටුප" යන්නෙන් අදහස් කල යුත්තේ ඔහු දැරූ ධූරය විශ්‍රාම වැටුප් හිමි ධූරයක් වී නම් ඒ ධූරය වෙනුවෙන් ඔහුට ලැබෙන්ට තිබුණ විශ්‍රාම වැටුප හිමි වැටුප වේ.

[1]1987.02.06 දින අංක 440 දරණ ගැසට් පත්‍රය බලන්න.

(5) මේ වගන්තිය සම්බන්ධයෙන් " දරුවා " යන්නට -

(අ) පියාගේ මරණයෙන් පසු උපන් දරුවකු,

(ආ) පුරුෂයාගේ හෝ ස්ත්‍රියගේ හෝ කලින් විවාහයකින් ඇති වූ දරුවකු හෝ තුවාලය සිදු වූ දිනට කලින් උපන්නා වූ ද, ආණ්ඩුවේ සේවකයාගෙන් හෝ දෛනික වැටුප් ලබන සේවකයාගෙන් හෝ සම්පූර්ණ වශයෙන් ම හෝ ප්‍රධාන වශයෙන් ම හෝ යැපෙන්නට සිදු වී සිටින්නා වූ ද අව්ජාතක දරුවකු, හා

(ඇ) තුවාලය සිදු වූ දිනට කලින් නීත්‍යානුකූලව දරුකමට ගත්තා වූ ද යට කී අයුරු යැපෙන්ට වී සිටින්නා වූ ද දරුකමට ගත් දරුවකු ද ඇතුළත් විය යුතුය.

[1](6) මෙම වගන්තියෙහි රජයේ නිලධරයා යන්නෙහි අධිකරණ නිලධරයකු ඇතුළත් වන නමුත් සන්නද්ධ සේවාවල සාමාජිකයකු හෝ පොලිස් නිලධරයකු ඇතුළත් නොවන්නේය.

31අ. මෙම ව්‍යවස්ථා සංග්‍රහයේ 30 වැනි හෝ 31 වැනි හෝ වගන්තිය යටතට වැටෙන්නා වූ ද විශ්‍රාම වැටුප් නිලධාරියකු නොවන්නා වූ ද සේවකයෙකුට තුවාලයක් වූ කල හෝ ඔහු මැරුණු කල හෝ දෙන අනාථ දීමනා වෙනුවට වන්දි මුදල් දීම ඔහුගේ උපකාරිය පිණිට කොට ඇත්තාගේ හෝ ඇත්තන්ගේ හෝ යහපත පිණිස වෙතැයි ලේකම්වරයාට අවබෝධ වුවහොත් මෙම ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධානයන් යටතේ දෙනු ලබන යෙසුසු දීමනා වෙනුවට මෙහි පහත දක්වන උපලේඛනයෙහි හා වක්‍රයෙහි සඳහන් වන ගණන් හා මූලධර්මයන් අනුව වන්දි මුදලක් ගෙවිය හැකිය. එහෙත් 29(අ) වගන්තියේ (ii) වැනි උපවගන්තියෙහි සඳහන් වන අය සම්බන්ධයෙන් :-

(අ) මෙම වගන්තිය විශ්‍රාම වැටුප් හිමි නිලධාරීන් පිළිබඳ ව වලංගු විය යුතුය. එසේම,

(ආ) අන් අයුරකින් ගණනය කරන ලදුව ගෙවිය හැකි මුදල් ප්‍රමාණය ඉහත කී රෙගුලාසි යටතේ ගෙවිය හැකි වන්දි මුදලට යම් ගණනකින් අධික වේ නම්, එම ගණන එකී අඥාපනත යටතේ වන්දි වශයෙන් ගෙවිය හැකිය.

(ඇ) එබඳු අධික මුදලක් නැත්තේ වී නම් මේ වගන්තිය යටතේ වන්දි මුදලක් නො ගෙවිය යුතු ය.

උපලේඛනය

(අ) තුවාලය නිසා සදහටම සම්පූර්ණ වශයෙන් ඔබලත් වූ කල-

(1) වැඩිහිටියෙකු සම්බන්ධයෙන් වන අවස්ථාවක, මාස හතළිස් පහක මූලික වැටුප හෝ මූලික වේතන හෝ රුපියල් පහළොස් දහස යන ප්‍රමාණයන්ගෙන් වැඩි මුදල, තව ද

(2) අඩු වයස් ඇත්තකුට නම්, මාස අසූ හතරක වැටුපට සමාන මුදලක් හෝ රුපියල් තුන් දහස් පන්සියයක් යන මෙම දෙකෙන් අඩු මුදලක්ද ; එසේ ම

(ආ) තුවාලයෙන් සදහටම අඩ වශයෙන් ඔබලත් වූ කල-

(1) වක්‍රයේ දක්වා ඇති අන්දමේ තුවාලයක් පිළිබඳ ව නම්, එම තුවාලය නිසා, ධනය ඉපයීමේ ශක්තිය නැතිවීම සියයට යම් පමණක් වේ ද, සදහටම සම්පූර්ණ වශයෙන් ඔබලත් වීම නිසා ගෙවිය යුතුයයි එම වක්‍රයෙහි සඳහන් වන වන්දි මුදලින් එම සියයට ගණනක් ද,

(2) වක්‍රයෙහි දක්වා ඇති තුවාලයක් පිළිබඳ ව නම්, තුවාලය නිසා, ධනය ඉපයීමේ ශක්තිය සදහටම නැති වූයේ යම් ප්‍රමාණයකට ද, සදහටම ඔබලත් වූ විට ගෙවන වන්දි මුදලින්, ඒ ප්‍රමාණය හා සමානුපාත වන සියයට ගණනක් ද වේ.

(ඇ) තුවාලයෙන් මැරෙන්නේ-

(1) වියපතෙක් නම්, මාස තිහක වැටුපට සමාන මුදලක් නැතහොත් රුපියල් දෙදහස් පන්සියයක් යන මේ දෙකෙන් අඩු මුදලක්ද,

(2)එසේම බාල වයස් ඇත්තෙක් නම් රුපියල් දෙසීයක් ද වේ.

මේ උපලේඛනය තේරුම් ගැනීම සම්බන්ධයෙන්-

(අ) "වියපතා" යන්නෙන් පසළොස් වයසට අඩු නොවන අයෙක් ද, " බාලවයස් ඇත්තා " යන්නෙන් පසළොස් හැවිරිදි වයසට අඩු අයෙක් ද අදහස් කළ යුත්තේ ය.

---

[1]1987.02.06 දින අංක 440 දරණ ගැසට් පත්‍රය බලන්න.

(ආ) "සදහටම සම්පූර්ණ වශයෙන් ඔබලත් වීම" යන්නෙන් අදහස් කළ යුත්තේ, ඔබලත් වීමට හේතු වූ ඇබැද්දිය සිදුවන අවස්ථාවේ දී නිලධාරියෙකු හෝ සේවකයෙකු හෝ එතෙක් කල් කළ හැකි ව තිබූ සියලු වැඩට ඔහු සදහටම අපොහොසත් කරවන, ඔබලත් වීමකි. එහෙත්, සදහටම සම්පූර්ණ වශයෙන් ඔබලත් වීම වූකලී දෙ ඇසෙහිම පෙනීම සදහටම සම්පූර්ණ වශයෙන් නැති වී යාම හෝ චක්‍රයේ සඳහන් වන අයුරු ඒ ඒ තුවාල හේතු කොට ගෙන ධනය ඉපයීමේ මුළු ශක්තිය, එම චක්‍රයේ සඳහන් වන අයුරු, සියයට සියයක්ම නැතිවීම හෝ වශයෙන් සැලකිය යුතුය.

(ඇ) "සදහටම අඩ වශයෙන් ඔබලත් වීම" යන්නෙන් අදහස් කළ යුත්තේ ඒ කාලයේදී නිලධාරියාට හෝ සේවකයාට කළ හැකි වූ හැම රක්ෂාවක්ම සම්බන්ධයෙන් ඔහුගේ ධනය ඉපයීමේ ශක්තිය අඩු වන පරිදි සදහටම ඔබලත් වීමකි. එහෙත් චක්‍රයේ සඳහන් වන එක් එක් තුවාලයෙන්ම සදහටම අඩ වශයෙන් ඔබලත් වීම සිදුවෙතැයි සැලකිය යුතුය. එසේ ම එක් ඇබැද්දියකින් තුවාල එකකට වැඩි ගණනක් සිදු වූ කල, සදහටම අඩ වශයෙන් ඔබලත් වීම ගැන ඒ ඒ තුවාලය වෙනුවෙන් ගෙවිය හැකි වන්දි මුදල් එකතු කර ඒ සම්පූර්ණ වන්දි මුදල ගෙවිය යුතුය. එහෙත් ඒ තුවාල වලින් සදහටම සම්පූර්ණ වශයෙන් ඔබලත් වීම සිදුවී නම් ඔහුට ගෙවිය යුතුව තිබුණ මුදලට ඒ මුළු මුදල කිසිවිටෙක වත් වැඩි නොවිය යුතුය.

චක්‍රය

| තුවාලය | ධනය ඉපයීමේ ශක්තිය නැතිවීම<br>සියයට ගණන |
|---|---|
| වැලමිට හන්දියෙන් හෝ ඊට ඉහළින් හෝ දකුණු අත නැති වීම | 70 |
| වැලමිට හන්දියෙන් හෝ ඊට ඉහළින් හෝ වමත නැති වීම | 60 |
| වැලමිට හන්දියට පහළින් දකුණු අත නැති වීම | 60 |
| දණහිස ළඟින් හෝ ඊට ඉහළින් හෝ කකුල නැති වීම | 60 |
| වැලමිට හන්දියට පහළින් වමත නැති වීම | 50 |
| දණහිසට පහළින් කකුල නැතිවීම | 50 |
| සදහටම සම්පූර්ණ වශයෙන් ඇහීම නැතිවීම | 50 |
| එක් ඇසක් නැතිවීම | 30 |
| මාපටැඟිල්ල නැතිවීම | 25 |
| පයක සියලු ඇඟිලි නැතිවීම | 20 |
| මාපටැඟිල්ලේ එක් ඇටයක් නැතිවීම | 10 |
| දබරැඟිල්ල නැතිවීම | 10 |
| පයේ මාපටැඟිල්ල නැතිවීම | 10 |
| දබරැඟිල්ල හැර අතේ වෙන ඇඟිල්ලක් නැතිවීම | 5 |

සංලක්ෂ්‍යය - මේ චක්‍රයේ සඳහන් ඕනෑම අවයවයකින් හෝ ඉන්ද්‍රියයකින් හෝ වැඩ ගැනීම සම්පූර්ණ වශයෙන් හා සදහටම බැරිවීම ඒ අවයවය හෝ ඉන්ද්‍රිය හෝ නැතිවූවාට සමාන සේ සැලකිය යුතුය.

31ආ. (1) ලංකාවේ සේවයේ නැතහොත් නිවාඩු කාලපරිච්ඡේදයක ආරම්භයේ දී හෝ අවසානයේ දී හෝ අනුමත කරන ලද මාර්ගයකින් ශ්‍රී ලංකාවට එද්දී හෝ ලංකාවෙන් යද්දී හෝ ගමන් කරන නැවට හෝ වාහනයට හෝ උපද්‍රවයක් සිදුවීමෙන් නැතහොත් ඒ නැවට හෝ ඒ වාහනයට හෝ කරන ලද සාහසික ක්‍රියාවකින් යම් නිලධාරියෙකුට තුවාල වුවහොත්, නැතහොත් මළහොත් ඒ උපද්‍රවය හෝ ක්‍රියාව හෝ සිදුවූයේ රාජිනියට විරුද්ධව කෙරෙන යම් කිසි යුද්ධයක හේතුවෙන් පැනනැගුණු තත්ත්වයන් නිසා යයි ලේකම්වරයා පිළිගතහොත් 30 (1) වැනි වගන්තියේ හෝ 31 (1) වැනි වගන්තියේ හෝ සඳහන් තත්ත්වයන් යටතේ ඒ නිලධාරියාට තුවාල වූ සේ හෝ ඒ නිලධාරියා මරණ ප්‍රාප්ත වූ සේ හෝ සැලකිය යුතුය.

(2) මේ වගන්තියෙහි "අනුමත කරන ලද මාර්ගය" යන්නෙන් අදහස් කරන්නේ ලේකම්වරයා විසින් හෝ ඔහු වෙනුවෙන් වෙන නිලධාරියෙකු විසින් හෝ අනුමත කරන ලද මාර්ගයකි.

31 ඇ. (1) මේ ව්‍යවස්ථාවල පටහැනි ව කුමක් සඳහන් වුව ද, මෙහි පහත විධිවිධාන සලස්වා ඇති ආකාරයට යටත්ව, රජයේ කිසි සේවකයෙකු හෝ දෛනික වැටුප් ලබන සේවකයකු-

[1](අ) ඔහුගේ රාජකාරී කටයුතු ඉටු කිරීමේ දී හෝ,

(ආ) ඔහු රාජකාරි කටයුතු ඉටු නොකරන අවස්ථාවේ දී වුවද ඔහුගේ සාමාන්‍ය රාජකාරි වල විෂය සීමාව ඇතුළත වූ යම ක්‍රියාවක් කිරීමේ දී, හෝ

(ඇ) ඔහුගේ රාජකාරී කටයුතු සපුරාලීමෙහිලා යම් ක්‍රියාවක් ඉටු කිරීමෙහි ප්‍රතිඵලයක් වශයෙන්, හෝ

(ඈ) (I) ඔහුගේ වාසස්ථානයේ සිට රාජකාරි සඳහා වාර්තා කිරීම පිණිස සේවා ස්ථානය දක්වා, හෝ

(II) රාජකාරියෙන් පසු ඔහුගේ සේවා ස්ථානයේ සිට වාසස්ථානය දක්වා හෝ, කෙලින්ම යන ගමනක දී, හෝ

(ඉ) නිල කටයුතු වල නිරතවීම පිණිස ඔහුගේ සේවා ස්ථානයේ සිට කෙලින්ම යන ගමනක දී සහ ඔහුගේ සේවා ස්ථානයට ආපසු එන ගමනේ දී, හෝ

(ඊ) කැරලි කෝලාහලයක දී හෝ මහජන කැළඹීමක දී හෝ ත්‍රස්තවාදී ක්‍රියා හේතුකොට ගෙන හෝ රාජකාරි කටයුතු ඉටු කිරීමේ දී නැතහොත් එසේ නොවන අවස්ථාවක,"

ඒ රජයේ නිලධාරියාගේ හෝ දෛනික වැටුප් ලබන සේවකයාගේ මූලික වැටුපේ හෝ මූලික වේතනයේ 2" මාස හැටක"මූලික වැටුපට හෝ මූලික වේතනයට සමාන මුදලක් හෝ රුපියල් පහළොස් දහසක් හෝ යන දෙකින් කුමක් වුව ද ඒ මුදල, පහත සඳහන් පරිදි එකී මරණය වෙනුවෙන් වන්දියක් වශයෙන් ගෙවිය හැකි ය :-

(i) රජයේ නිලධාරියාට හෝ දෛනික වැටුප් ලබන සේවකයාට වැන්දඹුවක් සහ ළමයින් සිටී නම, ඒ මුදලින් අඩක් වැන්දඹුවට ද ඉතිරි අඩ, යැපෙන්නා වූ ළමයින් අතර එක සමානව ද ලැබෙන ලෙස අනුපාතිකව ගෙවිය යුතුය.

(ii) රජයේ නිලධාරියාට හෝ දෛනික වැටුප් ලබන සේවකයාට, යැපෙන්නා වූ ළමයින් නොමැතිව වැන්දඹුවක් පමණක් සිටී නම්, සම්පූර්ණ මුදල් ඒ වැන්දඹුවට ගෙවිය යුතුය.

(iii) රජයේ නිලධාරියාට හෝ දෛනික වැටුප් ලබන සේවකයාට, වැන්දඹුවක නොමැතිව, යැපෙන්නා වූ දරුවකු හෝ දරුවන් සිටී නම, ඒ මුදල් එකී දරුවාට හෝ දරුවන්ට එක සමාන කොටස් වලින් ගෙවිය යුතුය.

(iv) රජයේ නිලධාරියාට හෝ දෛනික වැටුප් ලබන සේවකයාට වැන්දඹුවකුත්, යැපෙන්නා වූ කිසිම දරුවකු වත් නොමැත්තේ නම, ඒ මුදල ලේකම්වරයා විසින් තීරණය කරනු ලබන ආකාරයකින්, මිය ගිය තැනැත්තාගේ වෙන යම යැපෙන්නෙකුට හෝ යැපෙන්නන්ට ගෙවිය යුතුය.

සියලුම කාර්ය සඳහා (අ), (ආ), (ඇ),(ඈ) හා (ඉ) ඡේද 1977 ජූලි මස 23 වන දින සිට ක්‍රියාත්මක වූ බව සලකනු ලැබිය යුතු අතර, සියලුම කාර්ය සඳහා (ඕ) ඡේදය 1983 ජූලි මස 23 දින සිට ක්‍රියාත්මක වූ බව සලකනු ලැබිය යුතුය.

(2) මේ වගන්තිය යටතේ රජයේ නිලධාරියකුගේ හෝ දෛනික වැටුප් ලබන සේවකයකුගේ හෝ මරණය වෙනුවෙන් ගෙවනු ලබන මුදල, අවස්ථාවෝචිතව මේ ව්‍යවස්ථාවල 31 වැනි වගන්තිය යටතේ, ඒ රජයේ නිලධාරියා හෝ දෛනික වැටුප් ලබන සේවකයා වෙනුවෙන් ගෙවනු ලබන යම් විශ්‍රාම වැටුපකට හෝ වැටුප් වලට හෝ 139 වැනි අධිකාරය වන කම්කරු වන්දි ආඥාපනත යටතේ ගෙවනු ලබන දීමනාවලට අතිරේක වශයෙන් විය යුතුය.

(3) මේ වගන්තියේ කාර්යයන් සඳහා "දරුවා" යන යෙදුමට පූර්ව - දරුවෙක් හෝ නීතිය විසින් පිළිගන්නා වූ විධියකින් දරු බවට හදා ගත්තා වූ හදාගත් දරුවෙක් ඇතුළත් විය යුතුය.

[2](4) නීතියට පටහැනිව හෝ ආණ්ඩුවේ හෝ දෙපාර්තමේන්තුවේ යම් රීති හෝ නියෝග උල්ලංඝනය කරමින් ක්‍රියා කරන අතරතුර රජයේ නිලධරයකුට හෝ සේවා නියුක්තයකුට තුවාල සිදුවූයේ නම් ඒ කිසිම නිලධරයකුට හෝ සේවා නියුක්තයකුට තුවාල සිදුවූයේ නම් ඒ කිසිම නිලධරයකුට හෝ සේවා නියුක්තයකුට මේ වගන්තිය යටතේ වන්දියකට හිමිකම් නොලැබිය යුතුය.

---

[1]1986.08.15 දින අංක 415 දරණ ගැසට් පත්‍රය බලන්න.

[2]1987.02.06 දින අංක 440 දරණ ගැසට් පත්‍රය බලන්න.

[1](5) රජයේ නිලධරයකු හෝ සේවා නියුක්තයකු තුවාල ලැබූ අවස්ථාවක දී ඒ තුවාලය ඒ නිලධරයාගේ නොසැලකිලිමත්භාවය නිසා සිදු වී ඇත්නම් සහ ඒ නොසැලකිලිමත්භාවය ඒ නිලධරයාගේ සහායක නොසැලකිලිමත්භාවය නිසා වන්නේ නම් දෙපාර්තමේන්තු ප්‍රධානයා විමසා විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂවරයා විසින් තීරණය කරනු ලබන යම් මුදලක් ඒ නිලධරයාට හෝ සේවා නියුක්තයාට ගෙවිය යුතු වන්දියෙන් අඩුකරගනු ලැබිය හැකිය.

[1](6) මෙ වගන්තියේ රජයේ නිලධරයා යන්නෙහි අධිකරණ නිලධරයකු ඇතුළත් වන නමුත් සන්නද්ධ හමුදාවල සාමාජිකයකු හෝ පොලිස් නිලධරයකු හෝ ඇතුළත් නොවිය යුතුය.

[2]31. (ඉ) පොලිස් දෙපාර්තමේන්තුවේ කවර තරාතිරමක නිලධාරියකු වුව ද ත්‍රස්තවාදී හෝ නීතිය ක්‍රියාත්මක කිරීමේ දී තුවාල ලබා අබාධිත තත්ත්වයට පත්ව ඔවුන්ගේ ඉපයීමේ ශක්තිය හීනවන ප්‍රතිශතය අනුව දුබලතා විශ්‍රාම වැටුපක් ගෙවිය යුතුය.

දුබලතා විශ්‍රාම වැටුප් ගණනය කිරීමේ පිළිවෙළ

| නිලය | ඉපයීමේ ශක්තිය හීනවීමේ ප්‍රතිශතය අනුව ගෙවීම රු. | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 20% | 30% | 40% | 50% | 60% | 70% | 80% | 90% | 100% |
| පොලිස් කොස්තාපල් | 305.00 | 445.00 | 590.00 | 730.00 | 870.00 | 1010.00 | 1155.00 | 1295.00 | 1435.00 |
| පොලිස් සැරයන්/මහ සැරයන් | 330.00 | 470.00 | 615.00 | 755.00 | 895.00 | 1035.00 | 1180.00 | 1320.00 | 1460.00 |
| උප පොලිස් පරීක්ෂක/පොලිස් පරීක්ෂක | 585.00 | 875.00 | 1165.00 | 1460.00 | 1750.00 | 2040.00 | 2335.00 | 2625.00 | 2915.00 |
| ප්‍රධාන පොලිස් පරීක්ෂක | 665.00 | 1000.00 | 1335.00 | 1665.00 | 2000.00 | 2335.00 | 2665.00 | 3000.00 | 3335.00 |
| සහකාර පොලිස් අධිකාරී | 835.00 | 1250.00 | 1665.00 | 2085.00 | 2500.00 | 2915.00 | 3335.00 | 3750.00 | 4165.00 |
| පොලිස් අධිකාරී | 1000.00 | 1500.00 | 2000.00 | 2500.00 | 3000.00 | 3500.00 | 4000.00 | 4500.00 | 5000.00 |
| ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී | 1165.00 | 1750.00 | 2335.00 | 2915.00 | 3500.00 | 4085.00 | 4665.00 | 5250.00 | 5835.00 |
| නියෝජ්‍ය පොලිස්පති/ ජ්‍යෙ. නියෝජ්‍ය පොලිස්පති | 1335.00 | 2000.00 | 2665.00 | 3335.00 | 4000.00 | 4665.00 | 5335.00 | 6000.00 | 6665.00 |
| පොලිස්පති | 1500.00 | 2250.00 | 3000.00 | 3750.00 | 4500.00 | 5250.00 | 6000.00 | 6750.00 | 7500.00 |

ත්‍රස්තවාදී හෝ නීතිය ක්‍රියාත්මක කිරීමේ දී අබාධිත තත්ත්වයට පත්වන අය වෙත දුබලතා විශ්‍රාම වැටුපක් ගෙවන්නේ නම් වන්දි විශ්‍රාම වැටුප්, තුවාල දීමනා සහ පොලිස් වන්දි හිමි නොවන අතර එවැනි ගෙවීම් සිදුකොට ඇතොත් එය දුබලතා විශ්‍රාම වැටුපෙන් අඩුකළ යුතුය. දුබලතා විශ්‍රාම වැටුප ගෙවිය යුත්තේ ගරු අමාත්‍ය මණ්ඩලය අනුමත කළ 2010 ඔක්තෝම්බර් 13 වැනි දින සිටය.

---

[1]1987.02.06 දින අංක 440 දරණ ගැසට් පත්‍රය බලන්න.

[2]2010.12.29 දින දරණ අංක 1686/19 ගැසට් පත්‍රය බලන්න.

### විශේෂ ගිවිසුම් යටතේ පත් කළ නිලධාරීන්ගේ දීර්ඝ කරන ලද සේවය

32. (i) නියමිත කාල පරිච්ඡේදයක් සේවය කිරීමේ දී ගිවිසුමක් පිට ආණ්ඩුවට සේවය කරන නිලධාරියකු ඒ කාලයට පසුව, අලුත් ගිවිසුමක් නැතිව හෝ ඔහුගේ පළමු ගිවිසුම නියමිත කාලයකට විශේෂ වශයෙන් අළුත්වැඩියා කර ගැනීමක් නැතිව හෝ නිවේදනයකින් විශ්‍රාම වැටුප් හිමි තනතුරක් යයි ප්‍රකාශ කරනු ලැබූ තනතුරක් දරමින්, ආණ්ඩුව යටතේ ස්ථිර දෙපාර්තමේන්තුවක සේවකයකු වශයෙන් ආණ්ඩුවේ සේවයෙහි යෙදී සිටින කවර විටක දී වුවත් පළමු ගිවිසුමේ ඇති කොන්දේසි ඒ නිලධාරියාට හිමි නොවේ.

(ii) ආධුනිකත්වය පිට හෝ ගිවිසුමක් පිට හෝ නිලධාරියකු කරන කිසිම සේවයක් සේවයේ කැඩීමක් නැතිව, ලංකාණ්ඩුවේ හෝ වෙන ආණ්ඩුවක හෝ ඔහු තනතුරෙහි ස්ථිර කරනු ලැබුවොත් මිස, විශ්‍රාම වැටුප් සඳහා ගණන් නොගත යුතුය. එසේවුවද වුවත් ආධුනිකත්වය පිට හෝ ගිවිසුමක් පිට හෝ කරන ලද සේවයෙන් පසුව, එම සේවය නොකැඩෙන සේ විශ්‍රාම වැටුප් හිමි තනතුරක් යයි ප්‍රකාශ කරන ලද ස්ථිර සේවයකට සම්බන්ධ වූ කල්හි පළමු කාලපරිච්ඡේදය ද විශ්‍රාම වැටුප් සඳහා ගණන් ගත හැකිය.

### වෛද්‍ය මණ්ඩල හා විශ්‍රාම වැටුප් හෝ පාරිතෝෂිකයන් හෝ පිළිබඳ ලිපි

35. (i) අවුරුද්දකට රු.4,260 ට අඩුවෙන් වැටුප් ලබන නිලධාරීන් පරීක්ෂා කිරීමට වෛද්‍ය මණ්ඩල පත් කරනු ලබන්නේ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසිනි. එහෙයින් ඒ පිළිබඳ අයදුම්පත් දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් විසින් කෙළින් ම ඒ අධ්‍යක්ෂ වෙත යැවිය යුතුයි. අවශ්‍යතාවයක් නැතිව යම්කිසි අයදුම්පතක් එවා තිබෙති' යි සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂට පෙනී ගියහොත් ඔහු විසින් ඒ බව තම දෙපාර්තමේන්තුවේ පාලනය භාර අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්ට වාර්තා කළ යුතුය.

(ii) අවුරුද්දකට රු.4,260 ට වැටුපක් හෝ ඊට වැඩි වැටුපක් හෝ ලබන, තමා යටතෙහි වූ යම්කිසි නිලධාරියකු අසනීප ගතිය නිසා සේවාවෙන් විශ්‍රාම ගැන්විය යුතුයැයි දෙපාර්තමේන්තුවක ප්‍රධානියකුට පෙනී ගිය විට, වෛද්‍ය මණ්ඩලයක් පත් කරන ලෙස ඉල්ලා අයදුම් පතක් ස්වකීය දෙපාර්තමේන්තුවේ පාලනය භාර අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත ඔහු විසින් යැවිය යුතුය. එම දෙපාර්තමේන්තුව අමාත්‍යාංශයක් යටතේ නො තබන ලද්දක් නම් ඒ අයදුම්පත සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත කෙළින්ම යැවිය යුතු යි.

(iii) වෛද්‍ය මණ්ඩල පත් කරන ලෙස ඉල්ලා යවන අයදුම්පත් 142 වැනි පොදු ආකෘති පත්‍රයෙහි ලිවිය යුතුය.

36. වෛද්‍ය මණ්ඩලයේ වාර්තාව සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් ස්වකීය විවේචනයත් සමඟ ඒ ඒ දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වෙත සෑම විටකදී ම කෙළින් ම යවනු ලැබේ.

37. වාර්තා කරනු ලබන නිලධාරියා සේවයට නුසුදුසුය' යි ප්‍රකාශ කරනු ලැබුවොත් වෛද්‍ය මණ්ඩලයේ වාර්තාවත් සමඟ ඔහුගේ විශ්‍රාම වැටුප් ගණන් බැලීමට වුවමනා වන විස්තර (55 වැනි පොදු ආකෘති පත්‍රයෙහි) ලියා ලේකම්වරයා වෙත කෙළින් ම යැවිය යුතුය.

38. වයස නිසා නිලධාරියකු සේවාවෙන් විශ්‍රාම ගන්නා කල, වයස නිසා විශ්‍රාම ගැනීම පිළිබඳ ලිපි සම්බන්ධයෙන් ද මේ ක්‍රියා මාර්ගය ම පිළිපැදිය යුතුය.

38අ. රජයේ අනුමැතිය ඇතිව ව්‍යවස්ථිත ආයතනයක පූර්ණ කාලීන සාමාජිකයෙකු ලෙස හෝ ව්‍යවස්ථිත ආයතනයක නිලධාරියකු හෝ සේවකයකු හෝ ව්‍යවස්ථිත ආයතනයක කාර්ය මණ්ඩලයේ හෝ රැකියාව ලැබුවා වූ ද මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුපක් හෝ පාරිතෝෂිකයක් ලැබිය යුතු වූ විශ්‍රාම වැටුප් හිමි රජයේ නිලධාරියකු සම්බන්ධයෙන් වූ පාරිතෝෂික අයදුම්පත එම ව්‍යවස්ථිත ආයතනය විසින් ලේකම්වරයා වෙත යැවිය යුතුය.

මෙම වගන්තියෙහි-

"ව්‍යවස්ථිත ආයතනය" යන්නෙන් නීතිගත සංස්ථාවක්, මණ්ඩලයක්, විශ්ව විද්‍යාලයක්, නීතියෙන් ප්‍රතිෂ්ඨාපනය කළ වෙනත් ආයතනයක් අදහස් විය යුතුය. "පූර්ණ කාලීන සාමාජිකයා" යන්නට මේ ව්‍යවස්ථා සංග්‍රහයේ අංක 48 අ දරන වගන්තියෙහි දැක්වෙන අර්ථයම තිබිය යුතුය.

39. (1) මෙම ව්‍යවස්ථාව යටතේ ප්‍රදානය කරනු ලබන විශ්‍රාම වැටුපක් හෝ දීමනාවක් විශ්‍රාමිකයා මිය යන මාසයෙහි අවසානය තෙක් ගෙවිය යුතුය.

(2) විශ්‍රාම වැටුප් ලබන්නකු මැරුණු විට ඔහුට ලැබෙන්නට තිබුණ එහෙත් ඔහුට නොගෙවන ලද පරිවර්තිත පාරිතෝෂිකයක් හෝ නොගෙවන ලද විශ්‍රාම වැටුපක් හෝ දීමනාවක ඇතොත්, එය, මේ ආකාරයට දිය යුතුය යි අන්තිම කැමති පත්‍රයකින් කියා තිබෙතොත් මිස, (3) වැනි ඡේදයේ දැක්වෙන ආකාරයට ගෙවිය යුතුය.

(3) (1) විශ්‍රාම වැටුප් ලබන්නකු වැන්දඹු භාර්යාවක හා දරුවන් ජීවත්ව සිටිය දී මිය ගිය විට ඔහුට ලැබෙන්නට තිබුණ, එහෙත් ඔහුට නොගෙවන ලද පරිවර්තිත පාරිතෝෂිකයෙන් හෝ නොගෙවන ලද විශ්‍රාම වැටුපෙන් හෝ නොගෙවන ලද දීමනාවෙන් හෝ අර්ධයක් වැන්දඹුවට ද අනෙක් අර්ධය ඔහුගේ නීත්‍යානුකූල දරුවන්ට ද සම ලෙස ගෙවිය යුතුය. විශ්‍රාම වැටුප් ලබන්නාගේ නීත්‍යානුකූල දරුවකු තමාගේ දරුවන් ජීවත්ව සිටිය දී විශ්‍රාම වැටුප් ලබන්නාට ප්‍රථමයෙන් මළොත්, ඒ දරුවාගේ කොටස ඒ දරුවාගේ දරුවන් ට සම ලෙස ගෙවිය යුතුය. තම භාර්යාව හෝ නීත්‍යානුකූල දරුවන් හෝ ජීවත්ව සිටිය දී විශ්‍රාම වැටුප් ලබන්නකු මළහොත් ඒ සම්පූර්ණ පාරිතෝෂිකය හෝ විශ්‍රාම වැටුප හෝ දීමනාව හෝ ප්‍රස්ථාවානුකූල ව ඒ වැන්දඹු භාර්යාවට හෝ දරුවන්ට හෝ ගෙවිය යුතුය. තම භාර්යාව හෝ දරුවන් හෝ ජීවත්ව නොසිටිය දී විශ්‍රාම වැටුප් ලබන්නකු මළහොත් ඒ පාරිතෝෂිකය හෝ විශ්‍රාම වැටුප හෝ දීමනාව හෝ අන්තිම කැමතිපතක් නොලියා මරණ ප්‍රාප්ත වීම සම්බන්ධයෙන් ඊට අදාළ වන නීතිය අනුව ඒ විශ්‍රාම වැටුප් ලබන්නාගේ උරුමක්කාරයන්ට ගෙවිය යුතුය.

එසේකුදු වුවත් මෙම ඡේදයෙහි පූර්වෝක්ත විධිවිධාන මුස්ලිම් භක්තිකයක් වන, විශ්‍රාම වැටුප් ලබන්නකු සම්බන්ධයෙන් අදාළ නොවන්නේය.

(2) මුස්ලිම් භක්තියකු වන විශ්‍රාම වැටුප් ලබන්නෙකු, වැන්දඹු භාර්යාවක හෝ භාර්යාවන් එක් කෙනෙකුට වැඩි ගණනක් ද නීත්‍යානුකූල දරුවන් ද ජීවත් ව සිටිය දී මියගිය විට, ඔහුට ලැබෙන්නට තිබුණ, එහෙත් නොගෙවන ලද පරිවර්තිත පාරිතෝෂිකයෙන් හෝ නොගෙවන ලද විශ්‍රාම වැටුපෙන් හෝ නොගෙවන ලද දීමනාවෙන් එක් අර්ධයක් ඒ වැන්දඹු භාර්යාවන්ට සම සමව ඒ වැන්දඹු භාර්යාවන්ට ද අනික් අර්ධය සම සමව ඔහුගේ එකී දරුවන්ට ද ගෙවිය යුතුය. විශ්‍රාම වැටුප් ලබන්නාගේ එවැනි යම් දරුවකු, තමාගේ දරුවන් ජීවත්ව සිටිය දී විශ්‍රාම වැටුප් ලබන්නාට ප්‍රථමයෙන් මළොත්, ඒ දරුවාගේ කොටස, ඒ දරුවාගේ දරුවන්ට සම සමව ගෙවිය යුතුය.වැන්දඹු භාර්යාවක පමණක් නොහොත් වැන්දඹු භාර්යාවන් එක් කෙනෙකුට වැඩි ගණනක් පමණක් හෝ නීත්‍යානුකූල දරුවන් පමණක් ජීවත්ව සිටියදී විශ්‍රාම වැටුප් ලබන්නකු මළහොත්, ඒ සම්පූර්ණ පාරිතෝෂිකය හෝ විශ්‍රාම වැටුප හෝ දීමනාව අන්තිම කැමති පත්‍රයක් නොලියා මරණ ප්‍රාප්තවීමෙ දී උරුමවන පරිදි ප්‍රස්තාවට අදාළ වන නීතිය අනුව ඒ විශ්‍රාම වැටුප් ලබන්නාගේ උරුමක්කාරයන්ට ගෙවිය යුතුය.

(3) විශ්‍රාම වැටුප් ලබන්නියක මළහොත් ඒ තැනැත්තියට ලැබෙන්නට තිබුණු එහෙත් නොගෙවන ලද සම්පූර්ණ පරිවර්තිත පාරිතෝෂිකය හෝ නොගෙවන ලද විශ්‍රාම වැටුප හෝ දීමනාව හෝ ඇගේ දරුවන්ට ද, දරුවෝ නොසිටිත් නම්, අන්තිම කැමති පත්‍රයක් නොලියා මරණ ප්‍රාප්තවීම සම්බන්ධයෙන් ඊට ගැළපෙන නීතිය අනුව, ඇගේ නීත්‍යානුකූල උරුමක්කාරයන්ට ද ගෙවිය යුතු ය.

39.අ (1) විශ්‍රාම වැටුපක් හෝ පාරිතෝෂිකයක් හෝ දෙනු ලැබූ නැතහොත් ලබන්නට සිටින ආණ්ඩුවේ නිලධාරියකු හෝ වෙනත් තැනැත්තකු හෝ සිහි විකලව සිටින බව, විධිමත් ලෙස පත් කරන ලද වෛද්‍ය මණ්ඩලයක වාර්තාව අනුව හෝ ලියාපදිංචි කරන ලද වෛද්‍ය වෘත්තිකයකුගේ සහ සමාදාන විනිශ්චයකාරවරයකුගේ ද සහතික පිට හෝ ලේකම්වරයාට ඒත්තු ගිය කල්හි-

(අ) අධිකරණ බලය ඇති උසාවියක් මඟින්, එම සිහි විකල වූ තැනැත්තා භාර ව සිටීමට යමකු පත් කර සිටින විට, එම සිහි විකල තැනැත්තාගේ සහ ඔහුගේ පවුලේ ද නඩත්තුව සඳහා යොදවනු පිණිස එම විශ්‍රාම වැටුප හෝ පාරිතෝෂිකය හෝ එසේ පත් කර ඇති තැනැත්තාට ගෙවීමටත්,

(ආ) එසේ පත් කර නැති අවස්ථාවේදී, එම විශ්‍රාම වැටුපෙන් හෝ පාරිතෝෂිකයෙන් හෝ සුදුසු යයි තමාට වැටහෙන කිසියම් පංගුවක් එම සිහි විකල වූ තැනැත්තා ස්වකීය භාරයේ තබාගෙන සිටින තැනැත්තාට නැතහොත් ආයතනයටද, ඉතුරුව එම තැනැත්තාගෙන් යැපෙන්නන්ටද ගෙවීමටත් ඔහුට පිළිවන.

(2) (1) වැනි උපවගන්තියේ විධිවිධාන 1940 ජනවාරි මස 1 වැනි දින වලංගු වූවා සේ සැලකිය යුතුය.

### විවිධ කරුණු

40.(i) විෂමාචාරය නිසා නිලධාරියෙකු තත්ත්වයෙන් පහළ දමනු ලදුව පසුව යථා තත්ත්වයට පත් කරනු ලැබූ කල, යථා තත්ත්වයට පත් වීම ඔහු සේවාවෙන් නිදහස් වීමට තුන් අවුරුද්දකට ප්‍රථමයෙන් වූයේ නම්, විශ්‍රාම වැටුප් ගණන් බැලීම කිසිම අඩු කිරීමක් නැතිව, ඔහු නියත වශයෙන් ලැබූ වැටුපම අනුව කරනු ලැබේ; යථා තත්ත්වයට පත් වීම වූයේ සේවාවෙන් විශ්‍රාම ගැනීමෙන් මෙපිට තුන් අවුරුද්දක් ඇතුළත දී නම් විශ්‍රාම වැටුප ගණන් බලනු ලබන්නේ ඒ තුන් අවුරුද්දේ සාමාන්‍ය වැටුප අනුව ය.

(ii) විෂමාචාරය නිසා තත්ත්වයෙන් පහළ දමනු ලැබූ නිලධාරියෙකු යථා තත්ත්වයට පත් කරනු නොලැබුව හොත්, තත්ත්වයෙන් පහළ දැමීම කරන ලද්දේ සේවාවෙන් විශ්‍රාම ගැනීමෙන් මෙපිට තුන් අවුරුද්දක් ඇතුළත දී වුව ද, ඔහුගේ විශ්‍රාම වැටුප ඔහුට අන්තිමේ දී නියත වශයෙන් ලැබුණ වැටුප අනුව ගණන් බලනු ලැබේ. එහෙත් විෂමාචාරය ඉතා බරපතල වන හෝ දෙන ලද දඬුවම ප්‍රමාණවත් නොවන හෝ අති විශේෂ තත්ත්වයන් හි දී මිස, වැඩිපුර අඩු කිරීමක් කරනු නොලැබේ.

(iii) පොලිස් හමුදාවේ හා සුරාබදු දෙපාර්තමේන්තුවේ සිටින යටත් නිලධාරීන් අතුරෙන් යම් නිලධාරියෙකුගේ සාමාන්‍ය ආචාරය යහපත් වූ නිසා "තත්ත්වයෙන් පහළ දැමීම" සාමාන්‍ය සිවිල් සේවාවේ දී තදින් අවවාද කිරීමක් වශයෙන් සැළකිය හැකි වූ කල, "තත්ත්වයෙන් පහළ දැමීම" වූයේ අන්තිම අවුරුදු තුන ඇතුළත දී වුවත් එසේ ම නිලධාරියා යථා තත්ත්වයට පත් නුවුවත් විශ්‍රාම වැටුප, අන්තිම අවුරුදු තුනේ සාමාන්‍ය වැටුප අනුව ගණන් බැලිය හැක.

41. මෙම රෙගුලාසි යටතේ දෙනු ලබන කිසිදු විශ්‍රාම වැටුපක් හෝ පාරිතෝෂිකයක් අන් සතු කළ හැකි හෝ පැවරිය හැකි හෝ නොවේ.

42. මෙ නියෝගයන් යටතේ විශ්‍රාම වැටුප් දෙනු ලැබූ කෙනෙකු වස්තු භංගත්වයට පැමිණිය හොත් විශ්‍රාම වැටුප් දීම වහාම නතර විය යුතුය. එහෙත්, ඒ විශ්‍රාම වැටුප් ලබන්නාගේ ජීවිතයේ ඉතිරි හරියේ දී කලින් කල හෝ සුදුසු යයි සිතෙන කෙටි කාල පරිච්ඡේදයකදී හෝ කාල පරිච්ඡේදයන් හි දී හෝ එක දිගටම හෝ කලින් කලට හෝ ඒ විශ්‍රාම වැටුප් ලබන්නා වස්තු භංගත්වයට නොපැමිණියේ නම් ඔහුට ලැබෙන්නට හිමි ව තිබුණ මුදල් සම්පූර්ණ වශයෙන්, හෝ ඒ මුදලෙන් කොටසක් හෝ, ගෙවීමට හෝ, එය සෙසු අයකු හෝ අය හැර මතු දක්වන , එනම්, ඒ විශ්‍රාම වැටුප් ලබන්නා හා භාර්යාවක් ඇතොත් ඒ භාර්යාව හෝ දරුවා හෝ දරුවන් යන මොවුන් සියලු දෙනාගේ ම හෝ මොවුන්ගෙන් ඕනෑම කෙනෙකුගේ හෝ නඩත්තුව හා පුද්ගලික පරිපෝෂණය හෝ ප්‍රයෝජනය හෝ පිණිස කලින් කළ තමාට සුදුසුයයි සිතන ප්‍රමාණයකට හා ආකාරයකට යෙදීමට ලේකම්වරයාට නීත්‍යානුකූල බලය තිබිය යුතුය.

43. අවලංගු කරන ලදි.

43අ. රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ලබා ඇති යම් රාජ්‍ය සේවකයෙකුට හෝ යම් පුද්ගලයෙකුට මෙ ව්‍යවස්ථා යටතේ ගෙවිය හැකි යම් විශ්‍රාම වැටුප් මුදලකින්, වාර්ෂිකයකින්, දීමනාවක් හෝ පාරිතෝෂිකයකින්, රජය යටතේ ඔහු සේවය කළ කාල පරිච්ඡේදය තුළදී, රජයේ අරමුදල්වලින් ඔහුට වැඩිපුර ගෙවන යම් මුදලක් හෝ එවැනි රජයේ නිලධාරියකුගෙන් රජයට හෝ ලෝහෝර් ආර්යා ණය අරමුදලට අයවිය යුතු යම් මුදලක් හෝ මුදල් හෝ ඔහුගේ පැහැර හැරීමක් හෝ අක්‍රමිකතාවක් හේතුවෙන් නියම කරන ලද අධිභාරයක් වෙයි නම් එය අඩුකර ගත යුතුය.

[1]රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ලබා ඇති යම් රාජ්‍ය සේවකයෙකු විශ්‍රාම වැටුප් ලබමින් සිටින අවස්ථාවේ දී, එම විශ්‍රාමික පුද්ගලයා වෙත ගෙවන ලද යම් වැඩිපුර මුදලක්/ පාරිතෝෂිකයක්/ විශ්‍රාම වැටුපක්/ තිහ විශ්‍රාම වැටුපක් හෝ පාරිතෝෂිකයක් නොඑසේ නම් වෙනත් වැඩිපුර වූ විශ්‍රාම වැටුප් ගෙවීමක් වේනොත් එවැනි වැඩිපුර ගෙවීමක් විශ්රාම වැටුපෙන් අඩු කර ගත යුතුය.

### කරුණා සහගතව දෙන ලද පාරිතෝෂික

44. මෙ ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන අනුව විශ්‍රාම වැටුප් ලබන ගෙවිය නොහැකි එහෙත් එවැන්නක් ලැබීමට සුදුසු ආණ්ඩුවේ සේවකයන්ට සහ දෛනික වැටුප් ලබන සේවකයින්ට සේවාවෙන් විශ්‍රාම ගැනීමේ දී පාරිතෝෂිකයක් දිය හැකිය. එසේම මෙ ව්‍යවස්ථා සංග්‍රහය අනුව හෝ අභාවප්‍රාප්ත රාජ්‍ය සේවකයන්ගේ හෝ දෛනික වැටුප් ලැබූ සේවකයින්ගේ හෝ වැන්දඹුවන්ට හා අනාත්දරුවන්ට විශ්‍රාම වැටුප් දීමට විධිවිධාන සැලැස්වීම පිළිබඳ ආඥාපනත අනුව හෝ විශ්‍රාම වැටුප් ගෙවීමට නොහැකි නම්, අභාවප්‍රාප්ත රාජ්‍ය සේවකයන්ගෙන් හෝ දෛනික වැටුප් ලැබූ සේවකයන්ගෙන් හෝ යැපෙන්නන්ට පාරිතෝෂිකයක් දිය හැකිය. එහෙත් එවැනි කවර අවස්ථාවකදී වුවත් පාරිතෝෂිකය [2] රු. 3000 ට අධික නොවිය යුතුය.

### යුද්ධ සේවය

45. අවලංගු කරන ලදි.

45අ. නිලධාරියෙක් තමා අන්තිමට සේවය කළ දේශයේ ආණ්ඩුකාරතුමාගේ හෝ රාජ්‍ය මහා ලේකම්තුමාගේ හෝ අනුමැතිය කලින් ලබාගෙන, 1914-21 යුද්ධ කාලයේ දී හැර වෙන යුද්ධ කාලයක දී රජ්ජුරුවන්ගේ යුද්ධ සේනාවට බැඳී සටන් කලේ නම්, ඒ සඳහා පහත දක්වන විධිවිධානයන් වලංගු විය යුතුය :-

(1) යුද්ධය අවසාන වීමෙන් පසුව වූ ඒ කාල පරිච්ඡේදය ඇතුළුව, (මේ වගන්තියේ "යුද්ධ සේවය" යි හැඳින්වෙන) රජ්ජුරුවන්ගේ යුද්ධ සේනාවට බැඳී සටන් කළ කාල පරිච්ඡේදය තුළ දී, ඔහු අන්තිමට කල ආණ්ඩුවේ සේවයෙන් සම්පූර්ණ වැටුප් ඇතිව නිවාඩු පිට සිටියා සේ ද, යුද්ධ සේවයට කලින් ආණ්ඩුවේ සේවයේ අන්තිමට දැරූ ස්ථිර ධූරය දැරුවා සේ ද සැලකිය යුතුය.

(2) ඔහු රජ්ජුරුවන්ගේ යුද්ධ සේනාවට බැඳී සේවය කිරීම පිණිස ආණ්ඩුවේ සේවයෙන් ඉවත් ව ගිය දිනයත් සේවය ඇරඹූ දිනයත් අතර වූ කාල පරිච්ඡේදය තුළදී ඔහු අන්තිමට කළ ආණ්ඩුවේ සේවයෙන්, ආණ්ඩුවේ ප්‍රතිපත්තියට අනුව නුදුන්, වැටුප් රහිත නිවාඩු පිට සිටියා සේද, යුද්ධ සේවයට කලින් ඒ ආණ්ඩුවේ සේවයේ අන්තිමට දැරූ ස්ථිර ධූරය මේ නියෝග සම්බන්ධයෙන් සැලකිය යුතුය; එසේම ඔහුගේ යුද්ධ සේවය අවසන් වීමේ දිනයත් ආණ්ඩුවේ සේවයට ආපසු ඒමේ දිනයත් අතර වූ කාල පරිච්ඡේදය තුළ දී ඔහු යට කී අයුරු ආණ්ඩුවේ සේවයෙන් නිවාඩු ගෙන සිටියා සේද, ඔහු ආපසු බාරගත් ස්ථිර ධූරය දැරුවා සේ ද, මේ නියෝග සම්බන්ධයෙන් සැලකිය යුතුය.

---

[1]2012.09.21 දින අංක 1776/40 දරණ ගැසට් පත්‍රය බලන්න. මෙම සංශෝධන 1934 පෙබරවාරි මස 05 වැනි දින සිට ක්‍රියාත්මක ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතුය.

[2]1984.06.16 දින අංක 304 දරණ ගැසට් නිවේදනය බලන්න.

එහෙත්,

(අ) මෙම වගන්තියේ (2) වැනි අනුච්ඡේදයේ සඳහන් වන කාල පරිච්ඡේද දෙකෙන් කවරක් වුවද තුන් මාසයකට හෝ යම් විශේෂ අවස්ථාවක දී ආණ්ඩුකාරතුමා තීරණය කරන දීර්ඝ කාල පරිච්ඡේදයකට හෝ වැඩි වුවහොත් මේ වගන්තිය අදාළ නොවිය යුතුය; නැතහොත් නිලධාරියාට රජ්ජුරුවන්ගේ යුද්ධ සේනාවට බැඳී සේවය කළාට පසු, යුද්ධ සේවයට ප්‍රථමයෙන් ඔහු අන්තිමට යෙදී සිට, ආණ්ඩුවේ සේවාවට අදාළ වන නීති යටතේ විශ්‍රාම වැටුපක් පිට හෝ පාරිතෝෂිකයක් පිට හෝ සේවාවෙන් විශ්‍රාම ගැනීමට ඉඩ ලැබෙන තත්ත්වයන් යටතේ ආණ්ඩුවේ සේවාවට නැවත ඇතුළු නුවූව හොත් එසේ ම ඒ තත්ත්වයන් ඔහුගේ යුද්ධ සේවයෙන් පසු තුන් මාසයක් හෝ යට කී අයුරු තීරණය කරනු ලබන ඊට වඩා දීර්ඝ කාල පරිච්ඡේදයක් හෝ ගත වන්නට මත්තෙන් ඇතිවුව හොත් ;

(ආ) මෙම වගන්තියේ (1) වැනි අනුච්ඡේදයේ සඳහන් වන කාල පරිච්ඡේදක නිලධාරියා විශ්‍රාම වැටුප් ලැබීමට යෝග්‍ය වුවහොත්, නැතහොත් හුදු යුද්ධ සේවය ම නිසා, විශ්‍රාම වැටුප් අයිතිවාසිකම වෙනුවට අන් කිසි ලැබීමක් ලැබුවහොත්, මෙම වගන්තියේ (1) අනුච්ඡේදය ඒ කාල පරිච්ඡේදය සම්බන්ධයෙන් "සම්පූර්ණ වැටුප් සහිත නිවාඩු පිට" යන මෙම වචන වෙනුවට "ආණ්ඩුවේ ප්‍රතිපත්තිය අනුව නුදුන් වැටුප් රහිත නිවාඩු පිට" යන මෙම වචන යෙදූනා සේ වලංගු විය යුතුය.

(ඇ) යුද්ධ සේවයේ දී නිලධාරියාට තුවාල සිදුවුවහොත්, නැතහොත් ඔහු මළහොත් ස්වකීය සේවයේ කටයුතු කිරීමේ දී ඔහුට තුවාල සිදුවූවා සේ හෝ ඔහු මැරුණු සේ හෝ මෙම නියෝගයෙහි 30 වැනි 31 වැනි වගන්ති සම්බන්ධයෙන් නොසැලකිය යුතුය.

(ඈ) නිලධාරියා නියමිත ධුරයක් දැරුවා සේ ද, නියමිත සේවාවකින් නිවාඩු පිට සිටියා සේ ද, සැලකිය යුතුයයි නියම කරන මෙම වගන්තියේ විධිවිධානයන්, ඔහු අන්‍ය ස්ථිර ධුරයක් දැරුවා වූ ද ආණ්ඩුවේ ඕනෑම සේවාවකින් නිවාඩු පිට සිටියා වූ ද කාල පරිච්ඡේදයක් සම්බන්ධයෙන් වලංගු නොවිය යුතුය.

(ඉ) මෙම වගන්තියේ (1) වැනි අනුච්ඡේදයේ සඳහන් වන කාල පරිච්ඡේදයෙහි හෝ (2) වැනි අනුච්ඡේදයේ සඳහන් වන පළමු වැනි කාල පරිච්ඡේදයේ දී හෝ යුද්ධ සේවයට පෙර අන්තිමට ලංකාවේ රාජ්‍ය සේවයෙහි යෙදී සිටියා වූ යම් කිසි නිලධාරියෙකු තත්ත්වයෙන් උසස් කරන ලදින් විශ්‍රාම වැටුපකට හෝ පාරිතෝෂිකයකට හෝ හිමි ව සිට, සේවාවෙන් විශ්‍රාම ගැනීමට ඉඩ ඇති තත්ත්වයන් යටතේ රාජ්‍ය සේවාවට ආපසු ඊට මත්තෙන් සේවාවෙන් විශ්‍රාම ගතහොත් නැතහොත් රාජ්‍ය සේවාවට ආපසු ඊමට මත්තෙන් මළහොත් මේ නියෝගයන් සම්බන්ධයෙන්, එසේ උසස් කරනු ලැබූ දිනයේ සිට ස්ථිර ධුරය දැරුවකු සේ ඔහු සැලකිය යුතුය.

45ආ. යම් කිසිවකු "(ඉ)" උපලේඛනයෙහි සඳහන් වන ලංකාරක්ෂක හමුදාවේ යම් ධුරයක හෝ තනතුරක හෝ, 1941 සැප්තැම්බර් මස 30 වැනිදා ට පසු යම කිසි කාල පරිච්ඡේදයක් තුළ දී, මහලේකම්තුමාගේ අනුමැතිය ඇතිව සේවය කර ඇතොත් නැත්නම සේවය කරතහොත්, නැතහොත් යම් කිසිවකු නියෝජිත මන්ත්‍රණ සභාවේ පළමුවැනි රැස්වීමෙන් පසු, ලේකම්වරයාගේ අනුමැතිය ඇතිව සේවය කරතහොත්, ඒ සේවා කාල පරිච්ඡේදය ඒ තැනැත්තාට පඩිය ගෙවූයේ හෝ ගෙවන්නේ හෝ ඒකාබද්ධ රාජ්‍යයේ රජ්ජුරුවන්ගේ ආණ්ඩුව හා ලංකාණ්ඩුව අතර කරගත් යම් කිසි පොරොන්දුවක් අනුව රජ්ජුරුවන්ගේ ආණ්ඩුවෙන් දෙන ලද අරමුදල් වලින් වුවද, ඒ තැනැත්තාට මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය හැකි යම්කිසි විශ්‍රාම වැටුපක් හෝ වාර්ෂික දීමනාවක් හෝ විශ්‍රාම දීමනාවක් හෝ පාරිතෝෂිකයක් හෝ වන්දි මුදලක් හෝ නිර්ණය කිරීම සඳහා ලංකාණ්ඩුව යටතේ කළ සේවා පරිච්ඡේදයක් සේ ගණන් ගත යුතුය.

45 ඇ. රාජ්‍ය සේවයෙහි නියුක්ත වූ ද, 1914 -21 යුද්ධයේ දී රජ්ජුරුවන්ගේ යුද්ධ හමුදාවට බැඳී සටන් කලෙන් ඒ සේවයෙන් පසුව පශ්චාත් සංග්‍රාම සංවර්ධන පරිපාටිය යටතේ ලංකා සිවිල් සේවයෙහි පළමුවැනි පත්වීම ලැබුවා වූ ද, යම් කිසි නිලධාරියකු සම්බන්ධයෙන් ඔහුට තෙවිසි හැවිරිදි වයස පිරුණ දිනය හා ඔහු යුද්ධ සේවයට බැඳුණ දිනය යන මෙම දෙකෙන් පසුව වූ දිනය ඔහුට ආධුනිකයකු වශයෙන් පත්වීම ලැබුණ දිනය ද යන මේ දෙදින අතර ඇති කාල පරිච්ඡේදය, මෙම ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධානයන් යටතේ ගෙවිය හැකි මුළු විශ්‍රාම වැටුප ගණන් බැලීමේ දී සම්පූර්ණ වැටුප් සහිත නිවාඩු පිට සිටි කාල පරිච්ඡේදයක් සේ ගණන් ගත යුතුය.

46. අවලංගු කරන ලදී.

ගුරුවරයෙකු වශයෙන් කළ සේවය

47.(i) "(ඇ)" උපලේඛනයෙහි සඳහන් වන තනතුරක හෝ තනතුරුවල හෝ සිට නිලධාරියෙකු කරන ආණ්ඩුවේ සේවය ගුරුවරයෙකු වශයෙන් පාඨශාලාවක දී හෝ පාඨශාලාවල දී හෝ කළ, (ගුරුවරයන්ගේ විශ්‍රාම වැටුප් නියෝගයන්හි කී අයුරු සවහන් වූ) සේවය සමඟ නොකැඩී සම්බන්ධ වූ කල්හි සේවා දෙකේ කාලයේ අනුපිළිවෙල කුමක් වුවත් පාඨශාලාවක දී හෝ පාඨශාලාවල දී හෝ කළ ඒ සේවය ඔහු මෙම නියෝග යටතේ වයස නිසා හෝ සේවයේ දීර්ඝත්වය නිසා හෝ ඔහුගේ විශ්‍රාම ගැනීමේ තත්ත්වයන් නිසා හෝ විශ්‍රාම වැටුපකට හෝ පාරිතෝෂිකයකට හෝ යෝග්‍ය දැයි තීරණය කිරීමේ දී, නැතහොත් ඒ නිලධාරියා ආණ්ඩුවේ සේවයේ නියුක්තව සිටියදී මළ විට ඔහුගේ සේවයේ දීර්ඝත්වය නිසා ඔහුගෙන් යැපෙන්නන් මේ නියෝගයන් හි 2ආ වගන්තිය යටතේ මරණ පාරිතෝෂිකයට යෝග්‍ය දැයි තීරණය කිරීමේ දී ආණ්ඩුවේ සේවය වශයෙන් ගණන් ගත යුතුය.

(ii) එවැනි නිලධාරියෙකුගේ විශ්‍රාම වැටුප හෝ පාරිතෝෂිකය හෝ මේ වගන්තියේ විධිවිධානයන්ට පටහැනි නොවන්නා වූ ද, මේ නියෝගයන් හි සඳහන් වූ ද මූල ධර්මයන් හා ක්‍රමයන් හා අනුව ගණන් බැලිය යුතුය. එවැනි නිලධාරියෙකුගේ විශ්‍රාම වැටුප "(ඈ)" උපලේඛනයෙහි සඳහන් වන තනතුරක හෝ තනතුරුවල හෝ සිට කළ සේවයේ එක් එක් මාසය වෙනුවෙන් ඔහුගේ වැටුපෙන් 1/720 කුත්, " (ඈ)" උපලේඛනයෙහි සඳහන් වන තනතුරක හෝ තනතුරුවල හෝ සේවය සිට ඔහු කළ සේවය පාඨශාලාවක හෝ පාඨශාලාවන්හි හෝ සිට කළ අංශදායී සේවය හා "(ඈ)" උපලේඛනයෙහි සඳහන් වන තනතුරක හෝ තනතුරුවල හෝ යන මේ දෙකම එකතුව, ඔහුගේ මුළු සේවයට යම් සේ අනුපාත ව සිටී ද, එකී වැටුපට එසේම අනුපාතව සිටින සේ සර්ව කලාපීය ප්‍රදානයක් ද අතිරේක වශයෙන් ඔහුට දිය යුතුය. එහෙත් පාඨශාලාවක දී හෝ පාඨශාලාවන්හි දී කළ අංශදායී සේවයත් " (ඈ)" උපලේඛනයෙහි සඳහන් වන තනතුරක හෝ තනතුරුවල සිට ආණ්ඩුව යටතේ කළ සේවයත් යන මුළු සේවයම යටත් පිරිසෙයින් මාස 120 ක් වුව හොත් මිස, නිලධාරියෙක් මේ සර්ව කලාපීය ප්‍රසාද මුදල ලැබීමට සුදුසු නොවේ.

(iii) ආණ්ඩුව යටතේ කළ සේවයත් පාඨශාලාවක දී හෝ පාඨශාලාවන්හි දී කළ සේවයත් වෙනුවෙන් දෙන ලද මුළු විශ්‍රාම වැටුප් ප්‍රමාණය, මේ නියෝගයන් යටතේ දිය හැකි උපරිම විශ්‍රාම වැටුපට වැඩි නොවිය යුතුය. මේ උප වගන්තිය සීමිත වන කවර අවස්ථාවක දී වුවත් මේ නියෝගයන් යටතේ දෙන විශ්‍රාම වැටුප් මුදල ලේකම්වරයා විසින්, නිලධාරියා පාඨශාලාවක දී හෝ පාඨශාලාවන්හි දී හෝ කළ සේවය වෙනුවෙන් දෙන විශ්‍රාම වැටුප් මුදල හෝ විශ්‍රාම වැටුප් මුදල් හෝ ගැන ද, නිසි සේ සලකා බලා තීරණය කළ යුතුය.

(iv) 1934 ජුනි මස 15 වැනි දාට ප්‍රථම ආණ්ඩුවේ පාඨශාලාවක ගුරු තනතුරක් දැරූ තැනැත්තෙකු සම්බන්ධව මේ වගන්තියේ විධිවිධානයන් ක්‍රියාත්මක කිරීමේ දී "පාඨශාලාව" යන වචනයෙන් ආණ්ඩුවේ පාඨශාලාවක් අදහස් නොකළ යුතුය.

(v) "(ඈ)" උපලේඛනයෙහි සඳහන් වන තනතුරක හෝ තනතුරුවල හෝ සිට කරන ලද ආණ්ඩුවේ සේවා කාල පරිච්ඡේදයක් හා පාඨශාලා ගුරුවරයන්ගේ විශ්‍රාම වැටුප් නියෝගයන්හි විස්තර කෙරෙන පරිදි ලේඛනගත සේවා පරිච්ඡේදයක්, ඒ කාල පරිච්ඡේදයන් අතර යම් කිසි ඛණ්ඩ වීමක් ඇති වුවත්, මේ වගන්තිය සම්බන්ධයෙන් එකම අඛණ්ඩ සේවා කාල පරිච්ඡේදයක් වශයෙන් ද ඒ කාල පරිච්ඡේදයන් අතර ඇති ඛණ්ඩ වීම නිලධාරියාට වලක්වාලිය නොහැකි හේතූන් නිසා සිදුවූයෙන් ඇවුරුද්දකට වැඩි නොවෙනත් 20 වැනි වගන්තිය සම්බන්ධයෙන් අඛණ්ඩ සේවයක් වශයෙන් ද සැලකිය යුතුය.

(vi) (i) වැනි උප වගන්තියේ සඳහන් වන තැනැත්තකුට මේ වගන්තිය යටතේ ද (1928 පෙබරවාරි මස 24 වැනි දිනය හා 7631 අංකය දරන) ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ වූ පාඨශාලා ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් නියෝගයන් යටතේ ද සර්ව කලාපීය ප්‍රසාද මුදලක් වශයෙක් ලැබිය හැකි මුළු මුදල ඔහුගේ පඩියෙන් 5/60 වැඩි නොවිය යුතුය.

(vii) මේ වගන්තිය ක්‍රියාත්මක කිරීමේ දී විශ්‍රාම වැටුප් හා සර්ව කලාපීය ප්‍රසාද මුදල -

(අ) (i) වැනි උප වගන්තියේ සඳහන් වූ ද, සේවාවෙන් විශ්‍රාම ගැනීමට පූර්වාසන්න වූ තුන් අවුරුදු කාල පරිච්ඡේදය මුළුල්ලෙහි, එම ස්ථිර වැටුප ම හෝ වැටුපෙහි එම වැඩි වීම් ක්‍රමය නියම කරන ලද ස්ථිර ධූරයක් හෝ ධූරයන් දැරුවා වූ ද කෙනෙකු සම්බන්ධයෙන් ඔහු ඒ දිනයේ දී ලැබූ පඩිය අනුව ද,

(ආ) (i) වැනි උප වගන්තියේ සඳහන් වූ ද, සේවාවෙන් විශ්‍රාම ගැනීමට පූර්වාසන්න වූ තුන් අවුරුදු කාල පරිච්ඡේදය මුළුල්ලෙහි, එම ස්ථිර වැටුප හෝ වැටුපෙහි එම වැඩි වීම ක්‍රමයම නියම නොකරන ලද ධූරයක් හෝ ධූරයන් දැරුවා වූ ද කෙනෙකු සම්බන්ධයෙන් ඔහු ඒ කාල පරිච්ඡේදයේ දී දැරූ ඒ ධූරය හෝ ධූරයන් වෙනුවෙන් ලැබූ වැටුප්වල සාමාන්‍ය මාසික ගණන අනුව ද,

ගණන් බැලිය යුතුය.

එහෙත් (ආ) අනුච්ඡේදය අදාළ වන කෙනෙකු උසස් පන්තියට හෝ ශ්‍රේණියකට හෝ පැමිණ තුන් අවුරුද්දක් ඇතුළත සේවාවෙන් විශ්‍රාම ගතහොත්, ඔහුට ඒ අනුච්ඡේදයේ සඳහන් වන සාමාන්‍ය මාසික ගණන අනුවම විශ්‍රාම වැටුප හා සර්ව කලාපීය ප්‍රසාද මුදල ඒ පන්තියට හෝ ශ්‍රේණියට උසස් වීමට පූර්වාසන්නව තමා ලැබූ වැටුප් අනුව බලවා ගැනීමට බලය තිබේ.

47අ. 47 වැනි වගන්තියේ කුමක් සඳහන් වී තිබුණද, මෙහි "(ඈ)" දරන උපලේඛනයෙහි නියම කොට ඇති යම් තනතුරක හෝ තනතුරුවල හෝ යම් කිසි නිලධාරියෙකු විසින් කරන ලද ආණ්ඩුවේ සේවය යම් පාඨශාලාවක හෝ පාඨශාලාවල අංශදායී සේවය හා අඛණ්ඩව පවතී ද, එසේම ආණ්ඩුවේ සේවයෙහි යෙදුණු එම කාල පරිච්ඡේදය මාස 120 ට නොඅඩු වේ ද, එවිට, සර්ව කලාපීය ප්‍රසාද මුදල වශයෙන් මාස 60 ක් වන කාල පරිච්ඡේදයක්, තමන් ආණ්ඩුවේ සේවයෙහි යෙදුණ කාල පරිච්ඡේදයට එකතු කිරීමට එම නිලධාරියාට හිමිකම ඇත්තේය. එතෙකුදු වුවත්, යම් පාඨශාලාවක හෝ පාඨශාලාවල හෝ තමන් අංශදායී සේවයෙහි යෙදුණ කාල පරිච්ඡේදය වෙනුවෙන්, සර්ව කලාපීය ප්‍රසාද මුදල වශයෙන් අතිරේකව යමක් ලැබීමට, එම නිලධාරියාට හිමිකම් නැත්තේය.

## අර්ථසාධක අරමුදල් සේවය

48.(1) මේ නියෝගයන් හි 30 වැනි සහ 31 අ වැනි වගන්තිවල ඇති විධිවිධානයන්, මෙහි 29අ වැනි වගන්තියේ ඇති විධිවිධානයන් ට යටත්ව, රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ හෝ අනුමත කරන ලද අන් කිසි අර්ථසාධක අරමුදලක හෝ දායකයකුට අදාළ විය යුතුය.

(2) දෛනික වැටුප් ලබන සේවකයෙකු වූ තැනැත්තකු රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායකයකු වන විටක දී, ඔහුට මෙම ව්‍යවස්ථා සංග්‍රහයේ 29 වැනි වගන්තිය යටතේ හෝ 44 වැනි වගන්තිය යටතේ හෝ පාරිතෝෂිකයට සුදුසුකම් ඇත්දැයි තීරණය කිරීම සඳහා ඔහුගේ මුළු සේවය (දෛනික වැටුප් ලබන සේවකයෙකු වශයෙන් හා රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ දායකයෙකු වශයෙන්) ගණන් ගත යුතුය. තවද එසේ ඔහුට සුදුසුකම් ඇතොත් අවස්ථාවෝචිත පරිදි, 29 වැනි වගන්තිය යටතේ හෝ 44 වැනි වගන්තිය යටතේ ඔහුගේ සම්පූර්ණ දෛනික වැටුප් සේවා කාලය සඳහා පාරිතෝෂිකයක් ප්‍රදානය කළ හැකිය.

(3) අනුමත කරන ලද යම් අර්ථසාධක අරමුදලක දායකයකු වී සිට රජයේ සේවයේ විශ්‍රාම වැටුප් හිමි නිලයකට පත් කරනු ලැබ එම නිලයෙහි රාජකාරි භාරගත් තැනැත්තෙකුට මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුපක්, පාරිතෝෂිකයක් හෝ වෙනත් ප්‍රතිලාභයක් ප්‍රදානය කිරීම සඳහා, අරමුදලේ ඇති ඔහුගේම දායක මුදල් පමණක් හා ඊට නියමිත පොලියත් සමඟ අරමුදලෙන් එම දායකයාට ගෙවන ලද්දේ නම්, එම දායකයා අරමුදලට දායක මුදල් ගෙවීමට සුදුසුකම් ලැබූ දවසේ සිට අරමුදලේ ඇති ඔහුගේ ගිණුම පිය වූ දවස දක්වා වූ කාලය, සේවය වශයෙන් ගණන් ගත යුතුය.

(4) අනුමත කරන ලද යම් කිසි අර්ථසාධක අරමුදලක දායකයකු රජයේ සේවයේ විශ්‍රාම වැටුප් හිමි ධූරයකට පත් කරනු ලැබ ඒ ධූරයේ කටයුතු කිරීමට ඇරඹූ කල්හි, යම් ඒ සේවයක් වෙනුවෙන් ඔහු එම අරමුදලට ගෙවීමට බැඳුණේද (මෙහි පහත "අර්ථසාධක අරමුදල් සේවය" යයි සඳහන් කරනු ලබන), එම සේවය විශ්‍රාම වැටුප් හිමි ධූරයේ ඔහු කරන සේවය හා නොකඩවා පවතින්නක් නොවීමද නොසලකා, ඔහුගේ අර්ථසාධක අරමුදල හිමි සේවය මෙම නියෝගය යටතේ විශ්‍රාම වැටුපක්, පාරිතෝෂිකයක් හෝ වෙනත් ප්‍රයෝජනයක් හෝ දීම සඳහා අවශ්‍ය සේවය වශයෙන් ගණන් ගත යුතු නමුත්, එසේ ගණන් ගත යුත්තේ -

(අ) ඔහුට එම විශ්‍රාම වැටුප් හිමි ධූරය බාර ගැනීමට ඉඩ සැලසීම සඳහා, අර්ථසාධක අරමුදල සම්බන්ධ ව අදාළ වන යම් කිසි ලිඛිත නීතියක් හෝ නියෝගයක් හෝ යටතේ දෙන ලද කැමැත්ත ඇතිව ඔහු අර්ථසාධක අරමුදල් සේවය කෙළවර කර තිබීමය; එසේම,

(ආ) යථෝක්ත ධූරය සඳහා ඔහු නියම වශයෙන් ම පුහුණු කරවනු ලබන කාලපරිච්ඡේදයක් හැර, ඔහුගේ අර්ථසාධක අරමුදල් සේවය කෙළවර වන දිනයත්, ඔහු එම විශ්‍රාම වැටුප් සහිත ධූරයේ කටයුතු අරඹන දිනයත් අතර කාලය දින 31 කට වැඩි නොවීමය ;

යන මේ කරුණු සම්පූර්ණ වෙතොත් පමණකි.

(5) අනුමත කරන ලද යම් කිසි අර්ථසාධක අරමුදලක දායකයකු වූ දිනට කලින්, මේ නියෝගයන් යටතේ දීමනාවකට යෝග්‍ය වූ හෝ යෝග්‍යවන හෝ සේවයක් ඇති මනාම තනතුරක් හෝ ධූරයක් හෝ දරා ඇති දායකයකුට මේ නියෝගයන් යටතේ යම් ප්‍රයෝජනයක් හෝ යෝග්‍යතාවක් හෝ අත් වී ඇත්නම් ඒ ප්‍රයෝජනය හෝ යෝග්‍යතාව හෝ තබා ගැනීමට බලය තිබේ ; එහෙයින් -

(අ) පහත පෙනෙන තත්ත්වයන්ගෙන් කවරක් වුවත් යටතේ, එනම් :-

(i) වයස නිසා හෝ අසනීප ගතිය නිසා හෝ සේවාවෙන් විශ්‍රාම ගැනීම ; නැතහොත්,

(ii) ධූරය නැති කර දැමීම,

නිසා ඔහු රාජ්‍ය සේවාවෙන් අස් වුවහොත් ඔහුට පහත සඳහන් දීමනාව - එනම්, ඔහු අරමුදලට දායක වූ දිනයේ දී අසනීප ගතිය නිසා රාජ්‍ය සේවාවෙන් විශ්‍රාම ගන්වනු ලැබූ යේ නම් මේ නියෝගයන් යටතේ ඔහුට යම් දීමනාවක් ලැබෙන්ට තිබුණි නම් ඒ දීමනාව ගෙවිය හැකිය ; නැතහොත්,

(ආ) රාජ්‍ය සේවයේ යෙදී සිටියදීම ඔහු මැරුණි නම් පහත සඳහන් දීමනාව - එනම්, ඔහු අරමුදලට දායක වූ දිනයේ දී මැරුණි නම් මේ නියෝගයන් යටතේ ගෙවිය හැකි තැනැත්තාට හෝ තැනැත්තන්ට හෝ යම් දීමනාවක් ගෙවිය හැකිව තිබුණි නම් ඒ දීමනාව - ඒ තැනැත්තාට හෝ තැනැත්තන්ට හෝ ගෙවිය හැකිය.

එසේකුදු වුවත්, ධූරය නැති කර දැමීමේ හේතුවෙන් ඒ දායකයා රාජ්‍ය සේවාවෙන් අස් වුවහොත් සේවයෙන් අස්වන දිනය හා පණස් පස් හැවිරිදි වයස පිරෙන යන මේ දෙකෙන් පසුව ලබන දිනයේදී ඔහුට ඒ දීමනාව ප්‍රදානය කළ යුතුය.

(6) "අනුමත කරන ලද අර්ථසාධක අරමුදලක්" යන්නෙන් මේ වගන්තිය සම්බන්ධයෙන් අදහස් කෙරෙන්නේ-

(අ) විදුලිය දෙපාර්තමේන්තුවේ අර්ථසාධක අරමුදල ; හා

(ආ) රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල හැර මේ නියෝග සම්බන්ධයෙන් ආණ්ඩුකාරතුමා විසින් හෝ නියෝජිත මන්ත්‍රී සභාවේ පළමුවැනි රැස්වීමෙන් පසුව නම්, ලේකම්වරයා විසින් හෝ ආණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නිවේදනයකින් අනුමත කරන ලද වෙන ඕනෑම අර්ථ සාධක අරමුදලකි.

"රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල" යන්නෙන් අදහස් කරනු ලබන්නේ 1942 අංක 18 දරන රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල් ආඥාපනතෙන් පිහිටුවන ලද රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලයි.

(7) මේ වගන්තියේ විධිවිධානයන්, 1946 ජනවාරි මස 1 වැනි දින වලංගු වූවා සේ සැලකිය යුතුය.

48 අ. ලංකා රජයේ යම් විශ්‍රාම වැටුප් හිමි නිලධාරියෙකු හෝ සේවකයෙකු, රජයේ අනුමැතිය ඇතිව තම නිලය හෝ තනතුර අතහැර, ව්‍යවස්ථාපිත මණ්ඩලයක පූර්ණකාලීන සාමාජිකයකු වශයෙන් හෝ එහි නිලධරයෙකු හෝ සේවකයෙකු වශයෙන් හෝ එහි කාර්ය මණ්ඩලයේ සේවය භාරගත් අවස්ථාවක, මේ ව්‍යවස්ථා යටතේ ඔහුට ලැබිය හැකි යම් ප්‍රතිඵලයක් හෝ සුදුසුකමක් ඔහු විසින් තබා ගත හැකිය. එසේම ඒ අනුව -

(අ) පහත දැක්වෙන -

(i) වයස් ගතවීම හෝ රෝගී බව හේතුවෙන් විශ්‍රාම ගත් අවස්ථාවක ;

(ii) නිලය නැතිකළ අවස්ථාවක ; හෝ

(iii) අකාර්යක්ෂමතාවය හෝ දූෂණය හැර අන්කිසි හේතුවක් උඩ නිලයෙන් ඉවත් කළ අවස්ථාවක ;

ඒ සේවය ඔහු විසින් අත්හැරි විටෙක පහත දැක්වෙන, එනම් ඒ සේවයට බැඳුණු දිනයෙහි රෝගී භාවය නිසා ලංකා රජයේ සේවයෙන් විශ්‍රාම ගන්නා ලද නම්, මේ ව්‍යවස්ථා යටතේ ඔහුට දිය යුතුව තිබුණු යම් ප්‍රදානයක් ඔහුට ප්‍රදානය කළ යුතුය. නැතහොත්,

(ආ) එබඳු සේවයක යෙදී සිටියදී ඔහු මිය ගිය විටෙක පහත දැක්වෙන, එනම් ඒ සේවය ඔහු භාරගත් දිනයෙහි ඔහු මියගියේ නම්, මේ ව්‍යවස්ථා යටතේ ඔහුට දිය යුතුව තිබුණු යම් ප්‍රදානයක් මේ ව්‍යවස්ථා යටතේ ප්‍රදානය කළ යුතු තැනැත්තාට හෝ තැනැත්තන්ට දිය හැකිය.

මේ වගන්තියේ -

ව්‍යවස්ථිත මණ්ඩලයක සාමාජිකයකු සම්බන්ධයෙන් "නිලය නැති කිරීම" යන්නට නැවත පත් කිරීමක් පිරිනමනු නොලැබ, නිලය ඉකුත් වීමෙන් නිලය හිස් කිරීමක් ඇතුළත් වේ.

"ව්‍යවස්ථිත මණ්ඩලය" යන්නෙන් සමාගම් ආඥාපනත යටතේ හැර වෙනත් යම්කිසි ලිඛිත නීතියකින් හෝ ලිඛිත නීතියක් යටතේ හෝ පිහිටුවන ලද්දා වූ ද පිහිටුවනු ලබන්නා වූ ද ආණ්ඩුව විසින් ප්‍රදානයක් හෝ ණයක් වශයෙන් නැතහොත් වෙනත් ආකාරයකින් මුළු අරමුදල හෝ මුළු ප්‍රාග්ධනය නැතහොත් අරමුදලෙන් කොටසක් හෝ ප්‍රාග්ධනයෙන් කොටසක් හෝ සපයනු ලබන්නා වූ ද සංස්ථාවක්, මණ්ඩලයක් හෝ වෙනත් ආයතනයක් අදහස් වේ. තවද,

"පූර්ණකාලීන සාමාජිකයා" යන්නෙන් ව්‍යවස්ථිත මණ්ඩලය පිහිටවනු ලැබූ නීතියෙන් හෝ එය යටතේ නියමිත යුතුකම් ඉටු කිරීම සඳහා පමණක් යොදවනු ලබන ව්‍යවස්ථිත මණ්ඩලයක සාමාජිකයෙක් අදහස් වේ.

ව්‍යවස්ථිත මණ්ඩලයක පූර්ණකාලීන සාමාජිකයකු, නිලධරයකු හෝ සේවකයකු සම්බන්ධයෙන් මේ වගන්තියේ විධිවිධාන ඒ ව්‍යවස්ථිත මණ්ඩලය පිහිටවනු ලැබූ නීතිය ක්‍රියාත්මක වූ දිනයෙහි වලංගු වූ ලෙස සැලකිය යුතුය.

48අඅ. (1) විශ්‍රාම වැටුප් හිමි රජයේ නිලධාරියකු ,1942 ජූලි 1 වැනිදා සහ 1966 සැප්තැම්බර් 30 වැනිදා අතර රජය යටතේ වූ තම නිලය හෝ තනතුර රජයේ අනුමැතිය ඇතුව අත්හැර, ලංකා විශ්ව විද්‍යාලයෙහි කාර්ය මණ්ඩලයේ ගුරුවරයෙකුගේ හෝ නිලධරයකුගේ තනතුරක් හැර, සෙසු යම් තනතුරක් ලැබ සේවයෙහි යෙදුණ අවස්ථාවක, මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ඔහුට උපචිත වූ ප්‍රතිලාභයක් හෝ සුදුසු කමක්, ඔහු විසින් තබා ගත හැකි අතර, එපරිද්දෙන්ම,

(අ) පහත දැක්වෙන යම් හේතුවක් නිසා ඔහු එම තනතුර හැර ගිය විටෙක, එනම් -

(i) වයස් ගතවීම නිසා හෝ, අසනීප වීම නිසා හෝ, ලේකම්වරයා විසින් අනුමත කරන ලද වෙනයම් හේතුවක් නිසා විශ්‍රාම ගැනීමේ දී හෝ

(ii) නිලය අහෝසි කිරීමේ දී,

ඔහු වෙත පහත දැක්වෙන ප්‍රදානය කළ හැකිය. එනම්,ඔහු එම රක්ෂාව භාරගත් දිනය වන විට අසනීපවීම නිසා ලංකාණ්ඩුවේ සේවයෙන් විශ්‍රාම ගන්වනු ලැබ සිටියේ නම්, මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ඔහු වෙත කරනු ලැබිය හැකිව තිබූ ප්‍රදානය; හෝ

(ආ) ඒ රක්ෂාවේ යෙදී සිටියදී ඔහු මිය ගිය විට, මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ප්‍රදානය ලැබිය යුතු තැනැත්තාට හෝ තැනැත්තන්ට පහත සඳහන් ප්‍රදානය මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ කරනු ලැබේ. එනම් ඔහු රක්ෂාව භාරගත් දින මිය ගියේ නම්, මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ඔහු වෙත කරනු ලැබිය හැකිව තිබූ ප්‍රදානය.

(2) මෙ වගන්තියේ කාර්යයන් සඳහා "ගුරුවරයා" සහ "නිලධරයා" යන යෙදුම්වල අර්ථය 1966 අංක 20 දරන උසස් අධ්‍යාපන පනතේ 96 වැනි වගන්තියෙන් අවලංගු කරන ලද 1942 අංක 20 දරන ලංකා විශ්ව විද්‍යාල පනතින් ඒ යෙදුම්වලට දී ඇති අර්ථයම විය යුතුය.

(3) මෙ වගන්තියේ විධිවිධාන 1942 ජූලි 1 වැනි දින ක්‍රියාත්මක වූ ලෙස සැලකිය යුතුය.

[1]48ආ. ආණ්ඩුව යටතේ වූ තම නිලය හෝ තනතුර අතහැර ආණ්ඩුවේ අනුමැතිය ඇතිව ව්‍යවස්ථාපිත මණ්ඩලයක ස්ථිර රක්ෂාවක් භාරගත් විශ්‍රාම වැටුප් හිමි රාජ්‍ය නිලධරයකු ඒ ව්‍යවස්ථාපිත මණ්ඩලයෙන් වෙනත් ව්‍යවස්ථාපිත මණ්ඩලයකට හෝ අනුක්‍රමයෙන් ව්‍යවස්ථාපිත මණ්ඩල කීපයකට මාරු කළ අවස්ථාවක දී මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ඔහුට ලැබිය හැකි යම් ප්‍රතිලාභයක් හෝ සුදුසුකමක් ඔහු විසින් තබා ගත හැකි අතර, ඒ අනුව -

(අ) පහත දැක්වෙන යම් හේතුවක් නිසා, එනම්-

(1) වයස හෝ අයහපත් සෞඛ්‍ය තත්ත්වය හෝ ලේකම්වරයා විසින් අනුමත කරන ලද වෙනයම් හේතුවක් හෝ නිසා විශ්‍රාම ගැනීම හෝ,

(2) තනතුර අහෝසි කිරීම යන මෙ හේතුවක් නිසා ඔහු ඒ ව්‍යවස්ථාපිත මණ්ඩලය හැර යන අවස්ථාවක දී පහත දැක්වෙන පරිදි ඔහුට ප්‍රදානයක් දිය හැකිය. එනම්, ව්‍යවස්ථාපිත මණ්ඩලයක සේවය භාර ගැනීම සඳහා ආණ්ඩුව යටතේ ඔහුගේ නිලය හෝ තනතුර අතහරිනු ලැබූ දින අයහපත් සෞඛ්‍ය හේතූන් මත ඔහු ආණ්ඩුවේ සේවයෙන් විශ්‍රාම ගනු ලැබුවේ නම් මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ඔහු වෙත කරනු ලැබිය හැකිව තිබූ ප්‍රදානය හෝ,

(ආ) ව්‍යවස්ථාපිත මණ්ඩලයක සේවයේ යෙදී සිටිය දී ඔහු මියගිය විටෙක මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ප්‍රදානයක් ගෙවනු ලැබිය හැකි තැනැත්තාට හෝ තැනැත්තන්ට පහත සඳහන් පරිදි ප්‍රදානයක් මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය හැකිය. එනම්, ව්‍යවස්ථාපිත මණ්ඩලයක ස්ථිර සේවය භාර ගැනීම සඳහා ආණ්ඩුව යටතේ වූ ඔහුගේ නිලය හෝ තනතුර අත්හරිනු ලැබූ දින ඔහු මියගියේ නම මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය හැකිව තිබූ ප්‍රදානය,

මෙම වගන්තියේ කාර්යයන් සඳහා "මාරු කළ" යන්නෙන්, එක් ව්‍යවස්ථාපිත මණ්ඩලයක සිට ඒ ව්‍යවස්ථාපිත මණ්ඩලයේ අනුමැතිය ඇතිව වෙනත් ව්‍යවස්ථාපිත මණ්ඩලයකට මාරු කරනු ලබන පත් කිරීම් අදහස් කෙරෙන අතර, "ව්‍යවස්ථාපිත මණ්ඩලය" යනුවෙන් නීතිය අනුව පිහිටුවනු ලැබූ හා මෙම ව්‍යවස්ථා සංග්‍රහයේ 48 අ වගන්තියේ "ඌ" උපලේඛනයේ දැක්වෙන සංස්ථාවක්, මණ්ඩලයක්, විශ්ව විද්‍යාලයක් හෝ වෙනත් යම් ආයතනයක් හෝ, මෙම වගන්තියේ කාර්යයන් සඳහා ලේකම්වරයා විසින් "ව්‍යවස්ථාපිත මණ්ඩලයක්" හැටියට තීරණය කරනු ලබන වෙනත් සංස්ථාවක්, මණ්ඩලයක්, විශ්ව විද්‍යාලයක් හෝ ආයතනයක් අදහස් කෙරේ.

48ඇ. රජයේ සේවයේ ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරනු ලැබූ යම් රජයේ නිලධරයකු ව්‍යවස්ථාපිත මණ්ඩලයක සේවය සඳහා මුදා හරිනු ලැබ ඒ මණ්ඩලයේ සේවයෙන් ඒ නිලධාරියා ඉල්ලා අස්වීමට හේතු වූ කරුණු කෙරෙහි සැලකිල්ල ඇතිව, ඒ නිලධාරියාට ඒ මණ්ඩලයේ සේවයෙහි තවදුරටත් රැඳී සිටීමට නොහැකි බව සහ රජයේ සේවයේ හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයක සේවයේ හෝ ඒ නිලධාරියාට සුදුසු සේවා නියුක්තියක් දීමට නොහැකි බව අමාත්‍ය මණ්ඩලයේ මතය වන අවස්ථාවක, ඔහු මුදා හරිනු ලැබූ දින සිට ඒ නිලධාරියා රජයේ සේවයෙන් විශ්‍රාම ගනු ලැබූ ලෙස ලේකම්වරයා විසින් සලකනු ලැබිය හැකි අතර, ඒ නිලධාරියාගේ රජයේ සේවයේ කාලසීමාව කෙරෙහි සැලකිල්ල ඇතිව, අයහපත් සෞඛ්‍ය තත්ත්වය හේතුකොට ගෙන ඔහු විශ්‍රාම ගනු ලැබූ ලෙස ඔහුට විශ්‍රාම වැටුපක් හෝ පාරිතෝෂිකයක් හෝ ප්‍රදානය කළ හැකිය.

[2]48ඈ.(1) මෙම ව්‍යවස්ථා සංග්‍රහයෙහි මීට පටහැනිව කුමක් සඳහන් වුව ද, මෙහි මින්මතු සලස්වා ඇති විධිවිධානවල ආකාරයට යටත්ව, අවුරුදු දහයකට අඩු එහෙත් අවුරුදු අටකට නොඅඩු විශ්‍රාම වැටුප් සහිත සේවා කාලයක් ඇති, ස්ථාන මාරු සහිත සේවයක නිලධරයන් හැර වෙනත් කවරවූ හෝ රාජ්‍ය නිලධරයකු, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ සම්පූර්ණයෙන්ම රජයට හෝ රාජ්‍ය සංස්ථාවකට අයත් සමාගමක හෝ රජයට සහ රාජ්‍ය සංස්ථාවකට හවුලේ අයත් සමාගමක කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක (මෙහි මින්මතු "අදාළ කාලපරිච්ඡේදය" යනුවෙන් සඳහන් කරනු ලබන) ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ සමාගම යටතේ එකී නිලධරයාගේ සේවා කාලය, රජය යටතේ ඔහුගේ විශ්‍රාම වැටුප් සහිත සේවා කාලයට එකතු කළ විට මුළු සේවා කාලය අවුරුදු දහයක් වේ නම් ඒ සේවා කාලය එකී නිලධරයා රජය යටතේ කළ විශ්‍රාම වැටුප් සහිත සේවා කාලයක් වශයෙන් ගණන් ගත යුතුය.

---

[1]1973.06.08 දින අංක 63 දරණ ගැසට් පත්‍රය බලන්න.

[2]1986.06.20 දින අංක 407 දරණ ගැසට් පත්‍රය බලන්න.

(ii) ව්‍යවස්ථාපිත මණ්ඩලය හෝ සමාගම විසින් එකී ව්‍යවස්ථාපිත මණ්ඩලයේ හෝ සමාගමේ අරමුදල් වලින්, එකී නිලධරයා ද්විතීයනය කළ දින රාජ්‍ය සේවයේ දරණ ලද ස්ථිර තනතුරට හිමි වැටුපෙන් සියයට විසි පහක මුදලක් සෑම මාසයක් සඳහාම අදාළ කාලපරිච්ඡේදය වෙනුවෙන් ඒකාබද්ධ අරමුදලට බැර කිරීම සඳහා විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂවරයාට ගෙවිය යුතුය, තවද,

(iii) අදාළ කාලපරිච්ඡේදය අවසානයේදී, 1978 අංක 19 දරණ ගමනාගමන මණ්ඩල පනතේ 13(3) වන වගන්තිය අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඒ නිලධරයා සම්බන්ධයෙන් හා ඔහු කෙරෙහි අදාළ විය යුතුය;

එසේ වුව ද, ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක් යම් ව්‍යවස්ථාපිත මණ්ඩලයක් හෝ සමාගමක් බවට පරිවර්තනය කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් ස්ථාපනය කරන ලද ව්‍යවස්ථාපිත මණ්ඩලයකට හෝ සමාගමකට මේ වගන්තියේ විධිවිධාන අදාළ විය යුතුය.

48අ. (1) (අ) රාජ්‍ය සේවයේ නිලධරයකු ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ සම්පූර්ණයෙන්ම රජයට හෝ රාජ්‍ය සංස්ථාවකට අයත් සමාගමක හෝ රජයට සහ රාජ්‍ය සංස්ථාවකට හවුලේ අයත් සමාගමක කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කළ අවස්ථාවක සහ ඔහු ඒ ව්‍යවස්ථාපිත මණ්ඩලයේ හෝ සමාගමේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලබන අවස්ථාවේ ඔහු රාජ්‍ය සේවයේ දැරූ ස්ථිර තනතුර විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරක් බව ප්‍රකාශයට පත් කර ඇති අවස්ථාවක, ඔහු ව්‍යවස්ථාපිත මණ්ඩලයේ හෝ සමාගමේ සේවයේ යෙදී සිටින කාලය තුළ, ඔහු රාජ්‍ය ප්‍රතිපත්ති හේතූන් මත වැටුප් රහිත නිවාඩු ලැබ රාජකාරියට නොපැමිණි තැනැත්තෙකු සේ සැලකිය යුතු අතර, ඒ අනුව මෙම ව්‍යවස්ථා සංග්‍රහයේ 10 (1) වන වගන්තිය ඔහුට අදාළ විය යුතුය ; තවද

(ආ) ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ සමාගම විසින් එකී අරමුදල්වලින්, ඔහු ව්‍යවස්ථාපිත මණ්ඩලයේ හෝ සමාගමේ සේවය කරන කාලය තුළ, සෑම පූර්ණ මාසයක් සඳහාම, ඔහු රාජ්‍ය සේවයේ දැරූ ස්ථිර තනතුරට හිමි වැටුපෙන් සියයට විසිපහකට වැඩි නොවන මුදලක් ඒකාබද්ධ අරමුදලට බැර කිරීම සඳහා විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂවරයාට ගෙවිය යුතුය.

(2) (අ) සම්පූර්ණයෙන්ම රජයට හෝ රාජ්‍ය සංස්ථාවකට අයත් සමාගමක හෝ රජයට සහ රාජ්‍ය සංස්ථාවකට හවුලේ අයත් සමාගමක කාර්ය මණ්ඩලයට රාජ්‍ය සේවයේ යම් නිලධරයකු ස්ථිර පත්කළ අවස්ථාවක, ඔහුගේ ස්ථිර පත්වීමේ දිනයේ සිට ඔහු රාජ්‍ය සේවයෙන් අස් වූ තැනැත්තකු සේ සැලකිය යුතුය ; තව ද

(ආ) ඔහු සමාගමේ කාර්ය මණ්ඩලයට ස්ථිර වශයෙන් පත් කරනු ලබන අවස්ථාවේ ඔහු රාජ්‍ය සේවයේ දැරූ ස්ථිර තනතුර විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරක් බවට ප්‍රකාශයට පත් කර තිබුණේ නම්, ඔහු එකී ව්‍යවස්ථා සංග්‍රහය යටතේ අයහපත් සෞඛ්‍ය හේතූන් මත රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගන්වනු ලැබූ විටක ඔහුට පිරිනැමීමට ඉඩ තිබූ යම් ප්‍රදානයක් සමාගමේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබූ දින දී ලැබීමට ඔහුට හිමිකම තිබිය යුතු ය.

(ඇ) පහත සඳහන් කිනම් හෝ අවස්ථාස්ථාවක දී,

එනම්,

(i) වයස් සම්පූර්ණ වීමෙන් හෝ අයහපත් සෞඛ්‍ය හේතූන් මත හෝ විශ්‍රාම ගැනීමේ දී, හෝ
(ii) තනතුර අහෝසි කිරීමේ දී හෝ,
(iii) අකාර්යක්ෂමතාව හෝ දූෂණය හැර වෙනත් කිනම් හෝ හේතුවක් මත තනතුරෙන් ඉවත් කිරීමේ දී හෝ, සමාගමේ කාර්ය මණ්ඩලයෙහි ඔහුගේ සේවය අවසන් කළහොත් මිස මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ එවැනි කිනම් හෝ ප්‍රදානයක මුදල් ඔහුට නොගෙවිය යුතුය.

ඒ සේවය ඔහු විසින් අත්හැරි විටෙක පහත දැක්වෙන, එනම්; ඒ සේවයට බැඳුන දිනයෙහි (i) හා (ii) සම්බන්ධයෙන් වන විටක රෝගී භාවය හේතුකොට ගෙන සහ (ii) සම්බන්ධයෙන් වන විටක මේ රීතිවල 7 වන වගන්තිය යටතේ රජයේ සේවයෙන් විශ්‍රාම ගන්නා ලද නම්, මේ රීති යටතේ ඔහුට දිය යුතුව තිබුණ යම් ප්‍රදානයක් ඔහුට ප්‍රදානය කළ යුතුය ;

(ඇ) ඔහු සේවයේ යෙදී සිටිය දී මියගියේ නම්, එම රැකියාව භාරගත් දින මියගියේ නම් එවිට මෙම ව්‍යවස්ථා සංග්‍රහය අනුව ඔහුට ලබා දීමට තිබූ යම් ප්‍රදානයක් තිබුණේ ද, එවැනිම ප්‍රදානයක් මෙම ව්‍යවස්ථා සංග්‍රහය අනුව ගෙවිය යුතු තැනැත්තාට හෝ තැනැත්තියට දෙනු ලැබිය හැකි ය.

එසේ වුව ද, ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක් යම් ව්‍යවස්ථාපිත මණ්ඩලයක් හෝ සමාගමක් බවට පරිවර්තනය කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් සංස්ථාපනය කරන ලද සමාගමකට මේ වගන්තියේ විධිවිධාන අදාළ විය යුතුය.

48 ආ. අවලංගු කරන ලදි.

48 ඇ. (1) ලංකාණ්ඩුවේ විශ්‍රාම වැටුප් හිමි යම් නිලධාරියකු ව්‍යවස්ථිත මණ්ඩලයක ස්ථිර නිලධාරියෙකු ලෙස පත් කරනු ලැබ, එකී ව්‍යවස්ථිත මණ්ඩලයෙහි සේවයේ යෙදී සිටිය දී, ඒ නිලධාරියාගේ විශ්‍රාම වැටුප් අයිතිවාසිකම් විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ, යම් කිසි පැන වූ නීතියකින් ආරක්ෂා කර නොමැතිව තිබියදී විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ, විශ්‍රාම වැටුපක් ලැබීමට සාමාන්‍ය වශයෙන් හිමිකමක් නැති තත්ත්වයකින් ඔහු එකී ව්‍යවස්ථිත මණ්ඩලයෙහි දරමින් සිටි ධුරයෙන් අස්වුණොත්, ඉදින් එකී ධුරයෙන් අස්වීම ඒ නිලධාරියාගේ ම වුවමනාව පිට සිදු නොවූයේ නම්, ලේකම්වරයාගේ අභිමතය පරිදි ඔහුට විශ්‍රාම වැටුපක් ගෙවිය හැකිය. එසේතකුදු වුවත් සේවයේ කැඩීමක් නැතිව, එවැනි යම්කිසි නිලධාරියෙකු ලංකාණ්ඩුව යටතේ විශ්‍රාම වැටුප් හිමි තනතුරකට නැවතත් පත් කරනු ලැබුවහොත් ආණ්ඩුවේ සේවයෙන් ඔහු විශ්‍රාම ගන්නා තෙක් මෙම වගන්තියේ විධිවිධාන ක්‍රියාත්මක නොවන්නේය.

මේ වගන්තියේ කාර්යයන් සඳහා-

යම්කිසි ව්‍යවස්ථිත මණ්ඩලයක රක්ෂාවෙහි නියුක්ත පුද්ගලයෙකු සම්බන්ධයෙන් "නිලධාරියා" යන පාඨයෙන් අදහස් කෙරෙන්නේ, එකී ව්‍යවස්ථිත මණ්ඩලය පිහිටුවීම සඳහා පැනවූ නීතියෙහි ඒ පාඨයට දී ඇති අර්ථයම ය.

"ව්‍යවස්ථිත මණ්ඩලය" යන පාඨයෙන් අදහස් කෙරෙන්නේ පැනවූ නීතියෙන් පිහිටුවන ලද ඕනෑම මණ්ඩලයක් ය. එහෙත් එම පාඨයට ලංකා විශ්ව විද්‍යාලය ඇතුළත් නොවේ.

(2) මෙම වගන්තිය ක්‍රියාත්මක වන දිනයට කලින්, ව්‍යවස්ථිත මණ්ඩලයක් යටතේ කරන ලද සේවය අවසන් වී ඇත්තා වූ විශ්‍රාම වැටුප් හිමි යම් නිලධාරියකු සම්බන්ධයෙන්, මෙම වගන්තියේ විධිවිධාන ඒ නිලධාරියාගේ සේවය අවසන් වූ දිනයේ දී වලංගු වූවා සේ සැලකිය යුතුය.

48.ඈ (1) මෙම ව්‍යවස්ථා සංග්‍රහයෙහි මීට විරුද්ධව කුමක් සඳහන් වී තිබුණත් ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරයකුගේ පුද්ගලික ලේකම් තනතුරට ද්විතීයනය පිටපත් කර ඇති විශ්‍රාම වැටුප් හිමි නිලධාරියකු ඒ විනිශ්චයකාරයා විශ්‍රාම ගත් විට, ද්විතීයනය කරනු ලැබීමට කලින් ඔහු දරමින් සිටි තනතුරට ආපසු යෑමට අකමැති වන කල්හි, එකී නිලධාරියා ද්විතීයනය කිරීමට කලින් ඔහු දැරූ තනතුරෙන් විශ්‍රාම ගත්තා සේ සැලකිය යුතුය. තව ද ඒ නිලධාරියා වයස නිසා හෝ රෝගී භාවය නිසා හෝ විශ්‍රාම ගන්වන ලද්දේ නම්, මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ඔහුට ප්‍රදානය කළ හැකිව තිබුණ විශ්‍රාම වැටුප හෝ පාරිතෝෂිකය හෝ ලේකම්වරයාගේ අභිමතය පරිදි ඔහුට ගෙවිය හැකිය.

(2) ඉහත සඳහන් (1) වැනි උපවගන්තිය යටතේ ප්‍රදානය කෙරෙන විශ්‍රාම වැටුප හෝ පාරිතෝෂිකය වූ කලී-

(අ) ඒ නිලධාරියා, අවුරුදු තුනකට නො අඩු අවිච්ඡින්න කාලයක් තුළ තමා ද්විතීයනය කරනු ලැබ සිටි තනතුරු දැරුවේ නම, ඔහු විශ්‍රාම ගන්නා විට එකී තනතුර සඳහා ඔහු ලැබූ වැටුප හෝ දීමනාව අනුව ගණන් බැලිය යුතුය.

(ආ) ඒ නිලධාරියා ඒ තනතුර දැරුවේ අවුරුදු තුනකට අඩු කාලයක් නම්, ඔහු විශ්‍රාම ගන්නා දිනය එක්කම ඊට කලින් අවුරුදු තුන ඇතුළත ඔහු දැරූ තනතුර සඳහා ඔහු ලැබූ වැටුප්වල හෝ දීමනාවේ සාමාන්‍යය අනුව ගණන් බැලිය යුතු ය.

මේ උපවගන්තියේ කාර්යයන් සඳහා "දීමනාව" යන පාඨයෙන් අදහස් කෙරෙන්නේ වැටුප හිලව්වට ගෙවනු ලැබූ පෞද්ගලික දීමනාවකි.

48ඉ (1) මෙම ව්‍යවස්ථා සංග්‍රහයෙහි මීට විරුද්ධව කුමක් සඳහන් වුව ද, එහෙත් (2) වැනි උපවගන්තියේ විධිවිධානයට යටත්ව-

(අ) (434 වැනි අධිකාරය වන) රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ආඥාපනත අනුව රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලෙහි දායකයකුව සිට එම අරමුදලෙහි දායකයකු වශයෙන් සේවය අවසාන වූ විට එකී ආඥාපනතෙහි 14 වන වගන්තිය යටතේ ප්‍රදානයක් ලැබූ යම් රජයේ නිලධාරියකු, හෝ

(ආ) මෙම ව්‍යවස්ථා සංග්‍රහයේ අංක 48 (6) දරණ වගන්තියෙහි අර්ථානුකූලව අනුමත කරන ලද යම් අර්ථසාධක අරමුදලක දායකයකුව සිට එම අරමුදලෙහි දායකයකු වශයෙන් සේවය අවසාන වූ විට එකී අරමුදලෙහි ව්‍යවස්ථාවලට යටත්ව යම් ප්‍රසාද මුදලක්, ප්‍රදානයක් හෝ වෙනත් ප්‍රතිලාභයක් ලැබූ යම් රජයේ නිලධාරියකු,

මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුපක් හෝ පාරිතෝෂිකයක් ගෙවිය යුතු වූ යම් නිලයකට හෝ තනතුරකට හෝ පත් කරනු ලැබුයේ නම්, එවිට අවස්ථානුකූලව, රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට හෝ අනුමත කළ අර්ථසාධක අරමුදලට හෝ ඔහුගේ සේවයේ දී දායක මුදල් ගෙවූ කාලය, මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු වූ යම් විශ්‍රාම වැටුපක් හෝ පාරිතෝෂිකයක් සඳහා පිළිගත හැකි සේවා කාලයක් සේ සැලකිය යුතුය. එසේ කළ හැක්කේ ඉහත කී ආඥාපනතේ 14 වන වගන්තිය යටතේ හෝ අනුමත කරන ලද අර්ථසාධක අරමුදලේ ව්‍යවස්ථා යටතේ හෝ රජය විසින් ඔහුගේ ගිණුමට බැර වන සේ ගෙවන ලද ප්‍රසාද මුදලට හෝ ප්‍රදානයට හෝ වෙනත් ප්‍රතිලාභයට හෝ සමාන මුදලක් හා එම මුදල ලැබූ දා සිට එම මුදලට අවුරුද්දට සියයට හතර බැගින් වූ සුළු පොළියත් සමඟ ලේකම්වරයා එසේ කරන ලෙස නියම කරනු ලැබූ විටෙක එම රජයේ නිලධාරියා විසින් ආපසු රජයට ගෙවූ පසු පමණකි.

එසේ වුවද, ස්වකීය ගිණුමට බැර වෙන සේ ගෙවන ලද ප්‍රසාද මුදලට හෝ ප්‍රදානයට හෝ වෙනත් ප්‍රතිලාභයට හෝ සමාන මුදලක් ආපසු ගෙවන ලෙස මේ වගන්තිය යටතේ නියම කරනු ලැබ සිටින යම් රාජ්‍ය සේවකයකුගේ ලිඛිත ඉල්ලීමක් උඩ, එසේ කරනු වෙනුවට, නිලධරයා විශ්‍රාම ලැබීමේ දී ඒ මුදල ඔහුගේ පරිවර්තිත පාරිතෝෂිකයෙන් හෝ විශ්‍රාම වැටුපෙන්, පළමු ණයක් වශයෙන්, අඩුකර ගන්නා දිනය දක්වා පොළිය ද සමඟ, ලේකම්වරයා විසින් අඩුකර ගත හැකි ය.

(2) වෙනස් කාල පරිච්ඡේදයන් දෙකක් හෝ වැඩි ගණනක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ හෝ අනුමත කරන ලද යම් අර්ථසාධක අරමුදලක දායකයකු වී සිටි රජයේ නිලධාරියකුට රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ආඥාපනතේ 14 වන වගන්තිය යටතේ ප්‍රදානයන් දෙකක් හෝ වැඩි ගණනක් නැතහොත් අනුමත කරන ලද අර්ථසාධක අරමුදලේ ව්‍යවස්ථා යටතේ ඒ හා සමාන ප්‍රදානයක් ගෙවන ලද්දේ නම්, අර්ථසාධක අරමුදල් සේවා කාලයේ දී වූ ඒ වෙනස් කාල පරිච්ඡේද අතර ඇතිවූ කඩවීම් හෝ කඩවීම් ද අවසාන අර්ථසාධක අරමුදල් සේවයක් මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුපක් හෝ පාරිතෝෂිකයක් ගෙවිය යුතු වූ සේවයත් අතර වූ යම් කඩවීමක් නොසලකා හැරිය යුතුය.

48ඉද (1) මෙම ව්‍යවස්ථා සංග්‍රහයෙහි මීට විරුද්ධව කුමක් සඳහන් වුව ද, එහෙත් (2) වන උපවගන්තියේ විධිවිධානයන්ට යටත්ව, 434 වෙනි අධිකාරය වන රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල් ආඥාපනත අනුව, රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලේ දායකයකුව සිට එම අරමුදලෙහි දායකයකු වශයෙන් ඔහුගේ සේවය අවසන් වූ විට එකී ආඥාපනතෙහි 16 වන වගන්තිය අනුව ප්‍රදානයක් ලැබීමෙන්, ඉක්බිති මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුපක් හෝ පාරිතෝෂිකයක් හිමි නිලයකට හෝ තනතුරකට පත් කරනු ලැබුයේ නම්, රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට දායක මුදල් ගෙවූ ඔහුගේ සේවා කාලය මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු වූ යම් විශ්‍රාම වැටුපක් හෝ පාරිතෝෂිකයක් සඳහා පිළිගත හැකි සේවා කාලයක් සේ සැලකිය යුතුය.

එසේ ද වුවත්, විෂමාචාරය නිසා රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලේ දායකයකු වශයෙන් වූ තම සේවය අවසන් කරනු ලැබූ හෝ සේවයෙන් පහ කරනු ලැබූ රජයේ නිලධාරියකු සම්බන්ධයෙන් පූර්වෝක්ත වගන්තියෙහි සඳහන් විධිවිධාන අදාළ නොවිය යුතුය.

(2) (1) වන උප වගන්තියෙහි කාර්යයන් සඳහා රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලේ දායකයකු වශයෙන් වූ සේවය අවසන් කිරීම හා මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුපක් හෝ පාරිතෝෂිකයක් ගෙවිය යුතු වූ සේවය අතර වූ යම් කඩවීමක් නොසලකා හැරිය යුතුය.

48ඉඇ (1) මෙම ව්‍යවස්ථා සංග්‍රහයෙහි මීට විරුද්ධව කුමක් සඳහන් වුව ද, එහෙත් මින් මතු විධිවිධාන සලස්වා ඇති ආකාරයට යටත්ව, (434 වෙනි අධිකාරය වන) රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල් ආඥාපනත අනුව රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට හෝ මෙම ව්‍යවස්ථා සංග්‍රහයේ අංක 48(6) දරණ වගන්තියෙහි අර්ථානුකූල වූ යම් අනුමත කළ අර්ථ සාධක අරමුදලකට හෝ දායක මුදල් ගෙවිය යුතු වූ රජයේ නිලධාරියකුගේ සේවා කාලය තුළ දී මොන යම් හේතුවක් නිසා හෝ එවැනි කිසියම් අරමුදලකට දායක මුදල් නොගෙවූ නමුත්, (මෙහි මින් මතු "දායක නොවූ සේවය" යනුවෙන් සඳහන් කරනු ලබන) එම සේවා කාලයට ඉක්බිතිව ම, මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් හෝ පාරිතෝෂිකයක් ගෙවිය යුතු සේවයක් සිදු වූයේ නම්, මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු වූ විශ්‍රාම වැටුපක් හෝ පාරිතෝෂිකයක් සඳහා එම සේවා කාලය ගණන් ගත යුතුය.

එසේ ද වුවත්, එකී දායක නොවූ සේවය අවසන් කරන ලද්දේ රජයේ නිලධාරියා සේවයෙන් පහ කිරීම නිසා හෝ එම රජයේ නිලධාරියාගේ විෂමාචාරය නිසා හෝ වේ නම්, එකී සේවය මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු වූ විශ්‍රාම වැටුපක් හෝ පාරිතෝෂිකයක් සඳහා ගණන් නොගත යුතුය.

(2) අංක (1) දරණ උප වගන්තියෙහි කාර්යයන් සඳහා දායක නොවූ සේවය හා මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුපක් හෝ පාරිතෝෂිකයක් ගෙවිය යුතු වූ සේවය අතර යම් කඩවීමක් නොසලකා හැරිය යුතුය.

(3) මෙම වගන්තියෙහි විධිවිධාන 1942 අප්‍රේල් මස 1 වැනි දින සිට ක්‍රියාත්මක වී ඇතැයි සැලකිය යුතුය.

[1]48ඉඇ. (1) රාජ්‍ය සේවයේ අර්ථ සාධක අරමුදලේ දායකයකු රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත නිලයකට පත් කරනු ලැබ, එම නිලයෙහි රාජකාරි භාරගත් අවස්ථාවක අරමුදලේ ඇති ඔහුගේම දායක මුදල් ප්‍රමාණය පමණක් ඊට නියමිත පොලියක් සමඟ අරමුදලින් එම දායකයාට ගෙවනු ලබන්නේ නම්, එම දායකයා අරමුදලට දායක මුදල් ගෙවීමට හිමිකම් ලැබූ දින සිට අරමුදලේ ඇති ඔහුගේ ගිණුම් පියවූ දිනය දක්වා වූ කාලය මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ යම් විශ්‍රාම වැටුපක්, පාරිතෝෂිකයක් හෝ වෙනත් ප්‍රතිලාභයක් ප්‍රදානය කිරීමේ කාර්යය සඳහා සේවය වශයෙන් ගණන් ගත යුතුයි.

(2) රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලේ දායකයෙකු, තමා දායකයෙකු වූ දිනට කලින් මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ප්‍රදානයක් ලැබීමට යෝග්‍ය වූ හෝ යෝග්‍ය වන සේවයක් ඇති යම් තනතුරක් හෝ නිලයක් හෝ උසුලන ලද අවස්ථාවක, මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ යම් ප්‍රතිලාභයක් හෝ යෝග්‍යතාවයක් ඔහුට අත්වී ඇත්නම් එකී දායකයා විසින් එම ප්‍රතිලාභය හෝ යෝග්‍යතාවය තබාගනු ලැබිය හැකිය. තව ද ඊ අනුව -

(අ) ඔහු පහත සඳහන් කරුණු අතුරින් කිසිවක් යටතේ රාජ්‍ය සේවය අත්හැර යන විට එනම්-

(i) වයස නිසා හෝ අයහපත් සෞඛ්‍ය තත්ත්වය නිසා සේවයෙන් විශ්‍රාම ගන්නා විට ;

(ii) තනතුර අහෝසි කිරීම හේතුකොට ගෙන ; හෝ

(iii) අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන වෙනයම හේතුවක් නිසා පහත දැක්වෙන ප්‍රදානයන් එනම්,

ඔහු අරමුදලට දායකයෙකු වූ දිනයෙහි අයහපත් සෞඛ්‍ය තත්ත්වය හේතුකොට ගෙන රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගනු ලැබුවේ නම් මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ දිය යුතුව තිබුණ ප්‍රදානයක් ඔහුට ප්‍රදානය කරනු ලැබිය හැකිය ; නැතහොත්

(ආ) රාජ්‍ය සේවයේ යෙදී සිටියදී මියගියහොත් මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ පහත දැක්වෙන එනම්, දායකයා අරමුදලට දායකයකු වූ දිනයේ දී මියගියේ නම්, මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ දායකයාට තිබිය යුතුව තිබූ ප්‍රදානයක්, මෙම ව්‍යවස්ථාව යටතේ ප්‍රදානය කළ යුතු තැනැත්තාට හෝ තැනැත්තන්ට දිය හැකිය.

48ඊ. අවලංගු කරන ලදී.

48උ. අවලංගු කරන ලදී.

48ඌ. (1) මෙම ව්‍යවස්ථාවන් හි විරුද්ධව කුමක් සඳහන් වුව ද, සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ විශේෂඥයෙකුගේ තත්ත්වයෙහි අර්ධකාල නිලධරයකු ලෙස කටයුතු කිරීමට කැමැත්ත දැක් වූ එහෙත් ඉන්පසු 1962 ජනවාරි 1 වෙනි දින සිට ඒ දෙපාර්තමේන්තුවේ සම්පූර්ණ කාල සේවය ප්‍රතික්ෂේප කළ ඒ දෙපාර්තමේන්තුවේ වෛද්‍ය නිලධාරියකු විසින් 1961 දෙසැම්බර් 31 වෙනි දිනට පසු නොවූ දිනක සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා වෙත ලිඛිත දැන්වීමක් මගින් සේවයෙන් විශ්‍රාම ගැනීමට තීරණය කර 1962 අප්‍රේල් 1 වෙනි දිනට පසු නොවූ දිනක ඒ විශ්‍රාම පිළිබඳව මාස තුනක දැන්වීමක් කර ඇතහොත්, ඔහු විශ්‍රාම ගනු ලබන කල්හි, අසනීපවීම හේතු කොට ගෙන ඔහු සේවයෙන් විශ්‍රාම ගත් විටෙක මේ ව්‍යවස්ථා යටතේ ඔහු වෙත ප්‍රදානය කළ හැකි

ව තිබූ ප්‍රමාණයේ විශ්‍රාම වැටුපක් හෝ පාරිතෝෂිකයක් ඔහුට ප්‍රදානය කළ හැකි ය.

(2) මෙම වගන්තියේ විධිවිධාන ලංකා විශ්ව විද්‍යාලයේ සේවය සඳහා සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවෙන් ද්විතීයනය කළ අර්ධ කාල වෛද්‍ය නිලධරයකුට ද අදාළ විය යුතු ය.

48ඌඅ. (1) විශේෂඥයකු වශයෙන් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවෙහි අර්ධ කාල නිලධරයකු ලෙස කටයුතු කිරීමට කැමැත්ත දක්වා සිටියා වූ ද එහෙත් ඉන්පසුව 1964 අගෝස්තු මස 1 වන දින සිට ඒ දෙපාර්තමේන්තුවෙහි සම්පූර්ණ කාල සේවය සඳහා කැමැත්ත දැක්වීම ප්‍රතික්ෂේප කළා වූ ද සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවෙහි යම් වෛද්‍ය නිලධරයකු විසින්, මේ ව්‍යවස්ථා සංග්‍රහයෙහි විරුද්ධව කුමක් සඳහන් වුව ද, 1964 ජූලි මස 1 වන දිනයට පසු ව නොවූ දිනයක සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා වෙත දෙනු ලැබූ ලිඛිත දැන්වීමකින් 1964 අගෝස්තු මස 1 වන දින සිට සේවයෙන් විශ්‍රාම ගැනීමට කැමැත්ත දක්වා තිබේ නම්, අසනීප නිසා ඔහු සේවයෙන් විශ්‍රාම ගත්තේ නම් මේ ව්‍යවස්ථා යටතේ ඔහුට ප්‍රදානය කළ හැකි වූ ප්‍රමාණයෙන් යුත් විශ්‍රාම වැටුපක් හෝ පාරිතෝෂිකයක් ඔහු විශ්‍රාම ගැනීමේ දී ඔහුට ප්‍රදානය කළ හැකි ය.

(2) මෙම වගන්තියේ විධිවිධාන ලංකා විශ්ව විද්‍යාලයේ සේවය සඳහා සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවෙන් ද්විතීයනය කළ අර්ධ කාල වෛද්‍ය නිලධරයකුට ද අදාළ විය යුතු ය.

[1]1976.07.23 දින අංක 223 දරණ ගැසට් පත්‍රය බලන්න.

48උආ. (1) මෙම ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව ඇත ද එය නොසලකා එහෙත් මින් මතු මෙහි සඳහන් වන කරුණුවලට යටත්ව, විශේෂඥයකු වශයෙන් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවෙහි අර්ධ කාල නිලධරයකු ලෙස සේවය කිරීමට කැමැත්ත දක්වා සිටියා වූ සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ යම් වෛද්‍ය නිලධරයකු 1965 අගෝස්තු 1 වෙනි දින සිට හෝ ඊට පෙර සේවයෙන් විශ්‍රාම ගැනීමට තමා අදහස් කරන බව සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත ලියවිල්ලක් මගින් දන්වා ඇතහොත් ඔහු විශ්‍රාම ලත් විට, සෞඛ්‍ය හේතූන් උඩ ඔහු විශ්‍රාම ලැබූයේ නම් මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ඔහුට ප්‍රදානය කෙරෙන ප්‍රමාණයේ ම වූ විශ්‍රාම වැටුපක් හෝ පාරිතෝෂිකයක් ඔහුට ප්‍රදානය කළ යුතු ය.

(2) විශේෂඥයකු වශයෙන් අර්ධ කාල නිලධරයකු සේ සේවය කිරීමට කැමැත්ත දක්වා ඇති, එහෙත් 1964 අගෝස්තු මස 1 වන දින හෝ එදිනට පසු පූර්ණ කාල නිලධරයකු වශයෙන් සේවය කර තිබෙන සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ වෛද්‍ය නිලධරයකුට ප්‍රදානය කෙරෙන විශ්‍රාම වැටුප හෝ පාරිතෝෂිකය-

(අ) මෙ වගන්තියේ (1) වන උපවගන්තියෙහි විධිවිධාන යටතේ විශ්‍රාම ගන්නා එවැනි යම් වෛද්‍ය නිලධරයකු සම්බන්ධයෙන් වූ විට, ඒ විශ්‍රාම වැටුප ආරම්භවීමෙ දිනයට පෙරාතුවම පැමිණි අවුරුදු තුන ඇතුළත ඔහු දැරූ ස්ථිර තනතුරුවලට අයත් වැටුප්වල සාමාන්‍ය අනුව ; සහ

(ආ) මෙ ව්‍යවස්ථාවල වෙන යම් විධිවිධානයක් යටතේ විශ්‍රාම ගන්නා එවැනි යම් වෛද්‍ය නිලධරයකු සම්බන්ධයෙන් වූ විට, 1964 අගෝස්තු මස 1 වන දින සිට අවුරුදු තුනක කාලයක් ඇතුළත ඔහු විශ්‍රාම ගත්තේ නම්, ඒ විශ්‍රාම වැටුප ආරම්භ වීමේ දිනයට පෙරාතුවම පැමිණි අවුරුදු තුන ඇතුළත ඔහු දැරූ ස්ථිර තනතුරුවලට අයත් වැටුප්වල සාමාන්‍යය අනුව ගණන් බැලිය යුතු ය.

(3) මෙම වගන්තියේ (1) වන සහ (2) වන උපවගන්තිවල විධිවිධාන ලංකා විශ්ව විද්‍යාලයේ සේවය සඳහා සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවෙන් ද්විතීයනය කළ අර්ධ කාල වෛද්‍ය නිලධරයකුට ද අදාළ විය යුතු ය.

48උඇ (1) මෙම ව්‍යවස්ථා සංග්‍රහයෙහි පටහැනිව කුමක් සඳහන්ව ඇත ද එය නොසලකා, එහෙත් මින් මතු මෙහි සඳහන් වන විධි විධානවලට යටත් ව, නියාමක වෛද්‍ය උපදේශක සේවා ක්‍රමයට බැඳීමට 1972 පෙබරවාරි 1 වැනි දිනට ප්‍රථම මනාපය පාවිච්චි කරන ලද විශේෂඥ සේවක සංඛ්‍යාවේ අවුරුදු දහයක සේවය සම්පූර්ණ කර ඇත්තා වූ හෝ වයස අවුරුදු පණහට එළඹුනා වූ සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ විශේෂඥ සේවක සංඛ්‍යාවේ යම් වෛද්‍ය නිලධාරියකු විසින් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් නිර්ණය කරනු ලබන ආකාරයට දෙනු ලබන ලිඛිත නිවේදනයක් මගින් රජයේ සේවයෙන් විශ්‍රාම ගැනීමට කැමැත්ත පලකළ හැකි අතර, ඔහුගේ විශ්‍රාම ගැනීම ක්‍රියාත්මක වූ විට ඔහු වෛද්‍ය හේතූන් උඩ විශ්‍රාම ගනු ලැබූවේ නම් ඔහුට මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ කළ හැකි ප්‍රදානයට සමාන ප්‍රමාණයක විශ්‍රාම වැටුපක් හෝ පාරිතෝෂිකයක් ප්‍රදානය කළ හැකිය.

(2) නිශ්චිත කාල පරිච්ඡේදයක් සඳහා රජයට සේවය කිරීමට රජය සමඟ ඇපයකට සහ/හෝ ගිවිසුමකට ඇතුලත් වී ඇත්තා වූ ද, එකී ඇපයේ සහ/හෝ ගිවිසුමෙ සම්පූර්ණ කාල පරිච්ඡේදය සඳහා රජයේ සේවය සම්පූර්ණ කර නොමැත්තාවූ ද සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ විශේෂඥ සේවක සංඛ්‍යාවේ යම් වෛද්‍ය නිලධාරියකුට මෙම වගන්තියේ (1) වැනි උප වගන්තියේ විධිවිධාන අදාළ නොවිය යුතුය.

(3) මෙම වගන්තියේ (1) වැනි උප වගන්තියේ සඳහන් වන එහි විධිවිධාන සලසා ඇති ආකාරයට විශ්‍රාම ගැනීමට කැමැත්ත ප්‍රකාශ කරනු ලබන යම් වෛද්‍ය නිලධාරියකුට ඔහුගේ විශ්‍රාම ගැනීමේ දින සිට අවුරුදු පහක් හෝ වයස අවුරුදු පණස් පහට එළඹෙන තෙක් හෝ යන මේ දෙකින් පළමුව එළඹෙන දින තෙක් ලංකාවේ පදිංචිව, සිය වෘත්තියෙහි නිරත වී සිටින බවට ඔහු ලංකාණ්ඩුව සමඟ ගිවිසුමකට ඇතුළත් වන්නේ නම් මිස, සහ ඇතුළත් වනතුරු ඔහුගේ විශ්‍රාම වැටුප නොගෙවිය යුතුය.

(4) මෙම වගන්තියේ (1) වැනි උප වගන්තියේ සඳහන් යම් වෛද්‍ය නිලධාරියෙකු (3) වැනි උප වගන්තියෙහි විධිවිධාන සලසා ඇති ආකාරයට ලංකාණ්ඩුව සමඟ ගිවිසුමකට ඇතුලත්ව එම ගිවිසුමෙහි නිශ්චිත කාල පරිච්ඡේදය අවසන් වීමට ප්‍රථම සෞඛ්‍ය අමාත්‍යවරයාගේ විශේෂ අවසරය නොලබා ශ්‍රී ලංකාව අතහැර යයි නම් එකෙණෙහිම ඔහුගේ විශ්‍රාම වැටුප ගෙවීම නතර විය යුතුය.

48එ. මෙ ව්‍යවස්ථාවන්හි විරුද්ධව කුමක් සඳහන් වුව ද, කොළඹ වරාය කොමිෂන් සභාවේ සේවයෙහි නියුක්ත වූ ද ලංකාවේ පුරවැසියෙකු නොවන්නා වූ ද නියමු හෝ නියේජ්‍ය මාස්ටර් ඇටෙන්ඩන්ට් හෝ අතිරේක මාස්ටර් ඇටෙන්ඩන්ට් තනතුරු වැනි විශ්‍රාම වැටුප් සහිත ස්ථිර තනතුරක් දරන්නා වූ හෝ දැරූ යම් නිලධරයකු නියමුවකු ලෙස හෝ කලින් ඔහු සේවය කළ තනතුරෙහි ලංකාණ්ඩුවේ සේවය කිරීමට නියමිත නිල කාලසීමාවක් සඳහා ගිවිසුමක් හෝ එකඟවීමක් හෝ පිට ලංකාණ්ඩුවේ සේවයට යළිත් බැඳීමට කැමති වන්නේ නම්, 1962 නොවැම්බර් 1 වැනි දින සිට රජයේ සේවයෙන් විශ්‍රාම ගැනීමට ඔහුට අවසර දිය හැකි ය. එබඳු යම් නිලධරයකු එලෙස සේවයෙන් විශ්‍රාම ගන්නා අවස්ථාවක, අසනීපව සිටීමේ හේතුව නිසා ඉහත කී දින සිට ඔහු විශ්‍රාම ගෙන ඇත්නම්, මේ ව්‍යවස්ථා යටතේ ඔහුට ප්‍රදානය කරනු ලැබිය හැකිව තිබූ ප්‍රමාණයේ විශ්‍රාම වැටුප් මුදලක් හෝ පාරිතෝෂිකයක් ඔහුට ප්‍රදානය කළ යුතු අතර ඒ විශ්‍රාම වැටුප් මුදල හෝ පාරිතෝෂිකය-

(අ) ඔහුගේ ගිවිසුමේ හෝ එකඟ වීමේ කාල සීමාව ඉකුත්වීම හෝ වයස අවුරුදු 55 ව එළඹීම යන කරුණු දෙකින් පසුව සිදු වන්නේ යම් කරුණක් ද ඒ කරුණ නිසා ; හෝ

(ආ) සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් පත් කරන ලද වෛද්‍ය මණ්ඩලයක සහතිකයක් අනුව ඔහු සේවය සඳහා නුසුදුසු යයි තීරණය කරනු ලැබීම නිසා ඔහු රජයේ සේවයෙන් අස්වන දින දී පමණක් ගෙවිය යුතු ය.

48ඡ. මෙ ව්‍යවස්ථාවල විරුද්ධව කුමක් සඳහන් වුව ද-

(අ) 1963 අප්‍රේල් 30 වෙනි දින ලංකා සිවිල් සේවයේ සාමාජිකයකු වූ රජයේ සේවයේ යම් නිලධරයකු විසින් , හෝ

(ආ) 1963 මැයි 1 වෙනි දින පටන් ලංකා පරිපාලන සේවයට පත් කරනු ලැබ, ලංකා පරිපාලන සේවයට තමා පත් කිරීමේ හේතුවෙන්, නිලය නැති කිරීමේදී මෙන් රජයේ සේවයෙන් විශ්‍රාම ගැනීමේ සහනය තමාට ප්‍රදානය කිරීමේ ප්‍රමාණයකට එය විරුද්ධ ලෙස බල පැවැත්වූ බවට රාජ්‍ය සේවා කොමිෂන් සභාව සෑහීමට පත් කරනු ලැබූ රජයේ සේවයේ වෙනයම් නිලධරයකු විසින්

නියියාකාර දෙනු ලැබූ ලිඛිත දැන්වීමක මාර්ගයෙන් 1973 අප්‍රේල් 30 වෙනි දින හෝ ඊට පෙර රජයේ සේවයෙන් විශ්‍රාම ගැනීමට තෝරා ගත හැකි ය ; නිලය නැති කිරීමේදී රජයේ සේවයෙන් ඔහු විශ්‍රාම ලැබුවේ නම්, මෙ ව්‍යවස්ථාවල 7 (1) වෙනි වගන්තිය යටතෙහි ඔහුට ප්‍රදානය කරනු ලබන ගණනක විශ්‍රාම වැටුපක් හෝ පාරිතෝෂිකයක් ලැබීමට විශ්‍රාම ගැනීම ක්‍රියාත්මක වීමෙන් පසු ඔහුට හිමිකම තිබිය යුතුය.

48 ඡඡ. මෙ ව්‍යවස්ථාවල මීට පටහැනිව කුමක් සඳහන් වුව ද,

ලංකා සිවිල් සේවයෙහි සාමාජිකයකුව සිට භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්, භාණ්ඩාගාරයේ අතිරේක නියෝජ්‍ය ලේකම් හෝ ස්ථිර ලේකම්වරයෙකු වශයෙන් පත් කරන ලද්දාවූද, තදනන්තරව 1963 මැයි 1 වැනි දින හෝ ඊට පසු දිනක ස්වකීය මනාපය මත ලංකා පරිපාලන සේවයට පත් කරන ලද්දාවූ ද රාජ්‍ය සේවයේ යම් නිලධාරියකු විසින් යථා පරිදි දෙනු ලැබූ ලිඛිත දැන්වීමක් මගින් 1973 අප්‍රේල් මස 30 වැනි දින හෝ ඊට පෙර රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගැනීමේ මනාපය ඔහුට පළකර සිටිය හැකිය. තවද ඔහුගේ විශ්‍රාම ගැනීම ක්‍රියාත්මක වූ විට තනතුර නැති කරනු ලැබීමේ හේතුව මත ඔහු රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ලැබුවේ නම්, මෙම ව්‍යවස්ථාවල 7 (1) වැනි වගන්තිය යටතේ ඔහුට ප්‍රදානය කරනු ලැබිය හැකිව තිබූ ප්‍රමාණයේ විශ්‍රාම වැටුපක් හෝ පාරිතෝෂිකයක් ලැබීමට ඔහුට හිමිකම තිබිය යුතු අතර, ඔහුගේ විශ්‍රාම වැටුප හෝ පාරිතෝෂිකය ගණන් බැලීමේ කාර්යයන් සඳහා ඒ නියෝජ්‍ය ලේකම් වශයෙන් හෝ අතිරේක නියෝජ්‍ය ලේකම් වශයෙන් හෝ ස්ථිර ලේකම් වශයෙන් හෝ ඔහුගේ වැටුප නොසලකා හැරිය යුතුවාක් මෙන් ම, ඒ නියෝජ්‍ය ලේකම්, අතිරේක නියෝජ්‍ය ලේකම් හෝ ස්ථිර ලේකම්වරයෙකු වශයෙන් වූ ඔහුගේ සේවා කාලය තුළ 1963 අප්‍රේල් 30 වැනිදා දක්වා නොකඩවා ලංකා සිවිල් සේවයේ සාමාජිකයකුව ද ඉන්පසු ලංකා පරිපාලන සේවයෙහි සාමාජිකයෙකුව ද සිට සාමාන්‍ය ක්‍රමයට ඒ සේවාවල වැටුප් වැඩිවීම උපයා ඇත්තකු ලෙස සලකනු ලැබිය යුතුය.

48ඡඹ. ලංකා සිවිල් සේවයේ සාමාජිකයෙකු නොවන්නාවුද 1963 මැයි 1 දින සිට ලංකා පරිපාලන සේවයට පත් කරන ලද්දාවූද, යම රජයේ නිලධාරියකු 1973 අප්‍රේල් 30 වැනි දින හෝ ඉන් පෙර හෝ සේවයෙන් විශ්‍රාම ගැනීමට කැමැත්ත පළකරතහොත්, අයහපත් සෞඛ්‍ය තත්ත්වය උඩ ඔහු සේවයෙන් විශ්‍රාම ගත්තේ නම්, මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ඔහුට ප්‍රදානය කළ හැකිව තිබූ ප්‍රමාණයක විශ්‍රාම වැටුපක් හෝ පාරිතෝෂිකයක් හෝ ඔහුගේ විශ්‍රාම ගැනීමේ දී ප්‍රදානය කළ හැකිය.

48ඹ. අවලංගු කරන ලදී.

48ඹ. අවලංගු කරන ලදී.

48ක (1) මෙ ව්‍යවස්ථාවල පටහැනිව කුමක් සඳහන් වුව ද, එහෙත් මෙහි මින් මතු සලසනු ලබන විධිවිධානවලට යටත්ව, 1966 සැප්තැම්බර් 4 වන දින අංක 2/9/156/26 (එච්) දරණ භාණ්ඩාගාර චක්‍රලේඛයෙහි නිශ්චිතව සඳහන් රජයේ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ කාර්යයන් සඳහා ආදි ප්‍රවේශකයකු වන්නාවූ ලංකාවේ රජයේ සේවයෙහි ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත නිලයක්, දරණ යම් රජයේ නිලධාරියකු විසින් සිංහල භාෂාවෙන් කටයුතු කිරීමට තමාට නොහැකිවීමේ හේතුවපිට ඒ නිලයෙන් විශ්‍රාම ගැනීමට කැමැත්ත දක්වන්නේ නම් හා ලේකම්වරයා විසින් එසේ කිරීමට ඔහුට අවසර දෙනු ලබන්නේ නම්, එසේ ඔහු විශ්‍රාම ගැනීමෙහි දී, රෝගී භාවය නිසා ඒ නිලයෙන් ඔහු විශ්‍රාම ගතහොත් මෙ ව්‍යවස්ථා යටතේ ඔහුට ප්‍රදානය කළ හැකි වූ ප්‍රමාණයක විශ්‍රාම වැටුපක් හෝ පාරිතෝෂිකයක් ඔහුට ප්‍රදානය කළ හැකි ය :

එසේ වුව ද මෙ උපවගන්තියෙහි පෙරාතුව වූ විධිවිධාන මීට යාකොට ඇති "ඕ" උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් රජයේ යම් සේවකයකු සම්බන්ධයෙන් අදාළ නොවිය යුතුය.

(2) මෙ වගන්තිය යටතේ රජයේ සේවයෙන් විශ්‍රාම ගැනීමට කැමැත්ත දක්වන රජයේ නිලධාරියකු හට මෙ ව්‍යවස්ථාවල 12 වන වගන්තියේ විධිවිධාන අදාළ විය යුතුය.

48ග (1) මෙ ව්‍යවස්ථාවල මීට පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, "ග" අකුර දරණ උප ලේඛනයෙහි නිශ්චය කොට දක්වා ඇති ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරක් උසුලන්නා වූද, 1968 අගෝස්තු 1 වැනි දින කාර්යාල සේවක සේවයට අන්තර්ග්‍රහණය කරගනු ලැබුවා වූ ද යම් රජයේ නිලධාරියකු යථා පරිදි දෙන ලිඛිත නිවේදනයක් මගින් 1969 ජූලි 31 වැනිදා හෝ ඊට පළමු රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගැනීමට ඔහුට කැමැත්ත පළකර සිටිය හැකි අතර, ඔහු විශ්‍රාම ගැනීමේ දී, ඉදින් ඔහු තනතුර නැති කිරීම හේතුවෙන් රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගන්නේ නම්, මෙ ව්‍යවස්ථා සංග්‍රහයේ 7 වැනි වගන්තිය යටතේ ඔහුට ප්‍රදානය කරනු ලැබිය හැකිව තුබූ මුදල් ප්‍රමාණයක විශ්‍රාම වැටුපක් හෝ පාරිතෝෂිකයක් ලැබීමට ඔහුට හිමිකම් තිබිය යුතුය.

(2) මෙ වගන්තිය යටතේ රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගැනීමට කැමැත්ත පළකරන රාජ්‍ය සේවකයකු සම්බන්ධයෙන් මෙ ව්‍යවස්ථා සංග්‍රහයේ 12 වැනි වගන්තියේ විධිවිධාන අදාළ විය යුතුය ;

48ජ. මෙ ව්‍යවස්ථා සංග්‍රහයෙහි මීට පටහැනිව කුමක් සඳහන් වුවද, 1967 සැප්තැම්බර් 30 වැනි දින සේවයෙහි සිටි දුම්රිය ආරක්ෂක සේවයේ යම් නිලධාරියෙකුට 1967 ඔක්තෝම්බර් 1 වැනි දින සිට වලංගුවන පරිදි එම සේවයෙන් විශ්‍රාම ගැනීමට 1968 සැප්තැම්බර් 30 වැනි දින හෝ ඊට පළමු කැමැත්ත පළකර සිටිය හැකි අතර, එසේ ඔහු විශ්‍රාම ගැනීමේදී 1967 ඔක්තෝම්බර් 1 වැනි දින ඉදින් ඔහුගේ ධුරය නැති කිරීම නිසා ඒ සේවයෙන් විශ්‍රාම ලැබුවේ නම් මෙ ව්‍යවස්ථා සංග්‍රහයේ 7 වැනි වගන්තිය යටතේ ඔහුට ප්‍රදානය කරනු ලැබිය හැකිව තිබූ ප්‍රමාණයේ විශ්‍රාම වැටුපක් හෝ පාරිතෝෂිකයක් හෝ ලැබීමට හිමිකම ලැබිය හැකිය.

එසේ ම, එවැනි යම් නිලධාරියෙකු 1967 සැප්තැම්බර් 30 වැනි දිනට පසු දුම්රිය ආරක්ෂක සේවයෙහි සේවය කර තිබුණේ නම්, 1967 ඔක්තෝම්බර් 1 වැනි දින සිට එම සේවයේ ඔහුගේ අවසාන රාජකාරි දිනය දක්වා වූ සේවය මෙ ව්‍යවස්ථා සංග්‍රහයේ 16 (4) වැනි වගන්තිය යටතේ නැවත සේවයෙහි යෙදවීමේ සේවයක් වශයෙන් සැලකිය යුතුය.

48ට. ලංකා විදේශ සේවයේ තමා දරන තනතුර විශ්‍රාම වැටුප් සහිත යයි තමා එම තනතුර දරමින් සිටියදීම ප්‍රකාශයට පත් කරනු ලැබුවාවූද, වයසින් පනස් පස් වැනි වියට නො එළඹියාවූ ද ලංකා විදේශ සේවයේ 1 වැනි හෝ 2 වැනි ශ්‍රේණියේ කිසියම් රජයේ නිලධාරියකුට 1970 අගෝස්තු 15 වැනි දින හෝ ඊට පෙර රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යථා පරිදි දෙන ලද ලිඛිත දැනුම් දීමක් මගින් රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගැනීමට කැමති විය හැකි අතර, ඔහුගේ එම විශ්‍රාම ගැනීම ක්‍රියාත්මක වීමේදී, තනතුර අහෝසි කිරීම හේතුකොට ඔහු රජයේ සේවයෙන් විශ්‍රාම ගනු ලැබීනම්, මෙම ව්‍යවස්ථා සංග්‍රහයෙහි 7 වැනි වගන්තිය යටතේ ප්‍රදානය කරනු ලැබිය හැකි වූ ප්‍රමාණයක විශ්‍රාම වැටුපක් හෝ පාරිතෝෂිකයක් ප්‍රදානය කළ හැකිය.

48ඩ. (1) මෙම ව්‍යවස්ථා සංග්‍රහයෙහි පටහැනිව කුමක් සඳහන් වුව ද, ඇමතිවරයෙකුගේ පෞද්ගලික ලේකම් තනතුරකට ද්විතියනය කරන ලද විශ්‍රාම වැටුප් හිමි රජයේ නිලධාරියකු, ඒ ඇමතිවරයා ධුරය අත්හරින විට, තමන් රාජ්‍ය සේවයේ දැරූ විශ්‍රාම වැටුප් සහිත නිත්‍ය තනතුරට ආපසු යාමට අකමැති වූ අවස්ථාවක, ඒ ඇමතිවරයා ධුරය අත්හළ දින සිට තුන් මසක් ඇතුළත වූ දිනයක සිට රජයේ සේවයෙන් විශ්‍රාම ගැනීමට ඔහු විසින් කැමැත්ත පළ කළ හැකිය. ඒ රජයේ නිලධාරියා එසේ විශ්‍රාම ගත් අවස්ථාවක අයහපත් සෞඛ්‍ය තත්ත්වය හේතු කොට ගෙන එකී දින සිට ඔහු විශ්‍රාම ගෙන සිටියේ නම්, මෙ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ඔහුට ප්‍රදානය කළ හැකිව තුබූ ප්‍රමාණයක විශ්‍රාම වැටුපක් හෝ පාරිතෝෂිකයක් ඔහුට ප්‍රදානය කළ යුතුය.

(2) මෙම වගන්තියෙහි කාර්යයන් සඳහා "ඇමතිවරයා" යන යෙදුමෙන් 1946 ලංකා (ආණ්ඩුක්‍රම) රාජ්‍ය සභා ආඥාවේ 46 (1) වැනි වගන්තිය යටතේ පත් කරන ලද ඇමතිවරයෙක් අදහස් වේ.

48ත. ලංකා ආණ්ඩුවේ සේවයේ ස්ථිර හා විශ්‍රාම වැටුප් හිමි තනතුරක් දරන්නා වූ ද, 1964 ඉන්දු-ලංකා ගිවිසුම යටතේ හෝ ආණ්ඩුවේ ලාංකික කිරීමේ ප්‍රතිපත්තිය යටතේ හෝ ලංකාවෙන් පිටවීමට නියමිතව ඇත්තාවූ ද, ලංකා පුරවැසියෙකු නොවන යම් රජයේ නිලධාරියකු විසින්, මෙ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව ඇතද එය නොතකා එහෙත් මෙහි මින්මතු සලස්වා ඇති විධිවිධානයන්ට යටත්ව, ඒ තනතුරින් විශ්‍රාම ගැනීමට කැමැත්ත යථා පරිදි දෙන ලද ලිඛිත නිවේදනයකින් ප්‍රකාශ කළ හැකි අතර, ඔහුගේ විශ්‍රාම ගැනීම ක්‍රියාත්මක වූ විට, ඔහු වෛද්‍ය හේතූන් උඩ විශ්‍රාම ගත්තේ නම් ඔහුට මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ප්‍රදානය කරනු ලැබිය හැකි වූ ප්‍රමාණයක විශ්‍රාම වැටුපක් හෝ පාරිතෝෂිකයක් හෝ ප්‍රදානය කරනු ලැබිය හැකිය. තව ද මෙම ව්‍යවස්ථා සංග්‍රහයේ දොළොස්වෙනි වගන්තියේ විධිවිධාන එසේ විශ්‍රාම ගැනීම තෝරා ගන්නා රජයේ නිලධාරීන්ට අදාළ විය යුතුය.

49. අවලංගු කරන ලදී.

50. 1935 අංක 38 දරන ආඥාපනතෙන් පිහිටුවන ලද්දාවූ ද, 1937 අංක 10 දරන ආඥාපනතෙන් විසුරුවා හරින ලද්දාවූ ද විදුලිය බල මණ්ඩලය යටතේ කළ සේවය, මෙ ව්‍යවස්ථා සංග්‍රහයේ කවයුතු සම්බන්ධයෙන් ලංකාණ්ඩුව යටතේ කළ සේවය වශයෙන් සලකන ලෙසටත්, ඒ එබඳු වූ සෙසු සේවාවල ඇති අගය ඊට දෙන ලෙසටත්, සැක දුරුකිරීම වශයෙන් මෙයින් විධාන කරනු ලැබේ.

51. ගැසට් පත්‍රයේ නිවේදනයක් පළ කොට කලින් කල මේ ව්‍යවස්ථා සංග්‍රහය වෙනස් කිරීමට හෝ ඊට අමුතුවෙන් යමක් එකතු කිරීමට හෝ එය අන් ලෙසකින් සංශෝධනය කිරීමට හෝ බලය අමාත්‍යවරයාට ඇත්තේය. එසේ ම ඒ ඕනෑ ම නිවේදනයකින් කරන ඕනෑ ම සංශෝධනයක් ඒ සංශෝධනයේ කියා තිබුණොත්, එහි කියා තිබෙන දිනයක සිට, ගැසට් පත්‍රයේ නිවේදනය පළවන දිනයට කලින් වලංගු වූවා සේ සැළකිය යුතුය.

51අ. (1) මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ තමා වෙත පවරා ඇති යුතුකම් හෝ කාර්යයන් හෝ බලතල, තමා විසින් නියම කරනු ලැබිය හැකි කොන්දේසිවලට යටත්ව, ලේකම්වරයා විසින්, විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ වෙත හෝ අමාත්‍යාංශයේ වෙන යම් නිලධාරියකු වෙත ලියවිල්ලකින් පැවරිය හැකිය.

(2) එසේ පවරන ලද බලතල අනුව විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ විසින් හෝ අමාත්‍යාංශයේ වෙනයම් නිලධාරියකු විසින් කරනු ලබන යම් තීරණයක් ගැන සෑහීමකට පත් නොවන තැනැත්තෙකු විසින් අමාත්‍යවරයාට ආයාචනයක් කළ හැකිය. එම ආයාචනය ගැන ඇමතිවරයාගේ තීරණය අවසාන තීරණය විය යුතුය.

51ආ(1) මෙම ව්‍යවස්ථා සංග්‍රහයේ ඉහත දැක්වෙන විධිවිධානවලට යටත්ව විශ්‍රාම වැටුපක් වාර්ෂික දීමනාවක් හෝ පාරිතෝෂිකයක් ගෙවිය නොහැකි සේවයක් ඇති-

(අ) රජයේ සේවයෙන් විශ්‍රාම ලබන හෝ ලබා ඇති, හෝ

(ආ) රජයේ අනුමැතිය ඇතිව, (මෙම ව්‍යවස්ථා සංග්‍රහයේ අංක 38අ දරණ වගන්තියෙහි විස්තර කොට ඇති) යම් නීතිගත සංස්ථාවකට පත්වීමක් ලැබීමෙන් පසු එම සංස්ථාවෙන් විශ්‍රාම ලබන හෝ ලබා ඇති, හෝ

යම් රජයේ නිලධාරියකුට, අමාත්‍යවරයා විසින් සිය අභිමතය අනුව විශ්‍රාම වැටුපක්, වාර්ෂික දීමනාවක් හෝ පාරිතෝෂිකයක් ප්‍රදානය කළ හැකිය ;

එසේ ද වුවත්, එලෙස ප්‍රදානය කරනු ලබන එම විශ්‍රාම වැටුප, වාර්ෂික දීමනාව හෝ පාරිතෝෂිකය, එකී රජයේ නිලධාරියා විශ්‍රාම ලබන විට විශ්‍රාම වැටුප් හිමි නිලයක් දැරුයේ නම් ඒ සඳහා මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ඔහුට ප්‍රදානය කළ යුතු වූ විශ්‍රාම වැටුපට, වාර්ෂික දීමනාවට හෝ පාරිතෝෂිකයට කවර ලෙසකින්වත් වැඩි නොවිය යුතුය.

තවද, එසේ වුවත් මෙම වගන්තිය යටතේ විශ්‍රාම වැටුපක්, හෝ පාරිතෝෂිකයක් සඳහා ගණන්ගනු ලබන සේවයක් වෙනුවෙන් (434 වෙනි අධිකාරය වන) රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල් ආඥාපනතේ 14 වන වගන්තිය යටතේ ගෙවන ප්‍රදානයක් හෝ අනුමත කළ යම් අර්ථ සාධක අරමුදලක (මෙම ව්‍යවස්ථා සංග්‍රහයේ 48 (6) වන වගන්තියෙහි විස්තර කොට ඇති) ව්‍යවස්ථා යටතේ ගෙවන ප්‍රදානයක් ලැබූ රජයේ නිලධාරියකු විසින්ම විශ්‍රාම වැටුප, වාර්ෂිකය හෝ පාරිතෝෂිකය ගෙවීමට කලින් සම්පූර්ණ විය යුතු කොන්දේසියක් වශයෙන්, ඒ ඒ අවස්ථානුකූලව, පූර්වෝක්ත ආඥාපනතේ 14 වන වගන්තිය යටතේ හෝ අනුමත කළ අර්ථ සාධක අරමුදලේ ව්‍යවස්ථා යටතේ හෝ (තමාගේ ගිණුමට රජය විසින්) ගෙවන ලද ප්‍රසාද මුදලට හෝ ප්‍රදානයට හෝ වෙනත් ප්‍රතිලාභයට සමාන වන මුදලක් ද ඒ ප්‍රදානය ඔහු ලැබූ දා සිට එසේ කරන ලෙස ලේකම්වරයා විසින් නියම කරනු ලැබූ විට, අවුරුද්දට සියයට හතර බැගින් වූ සුළු පොලිය ද සමග, ආපසු රජයට ගෙවිය යුතුය.

[1]51ඇ. මෙම ව්‍යවස්ථා සංග්‍රහයෙහි පටහැනිව කුමක් සඳහන් වුව ද, ආණ්ඩුව යටතේ යම් නිලධරයකුගේ යම් සේවා කාලයක් හෝ සේවාකාල කිසිවක් මෙ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ යම විශ්‍රාම වැටුපක් වාර්ෂික දීමනාවක් හෝ පාරිතෝෂිකයක් ප්‍රදානය කිරීමේ කාර්යය සඳහා ගණන් ගැනීමට අමාත්‍යවරයා විසින් බලය දිය හැකිය.

[2](52) පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම මිස, මේ ව්‍යවස්ථා සංග්‍රහයෙහි -

"අමාත්‍යවරයා" යන්නෙන් විශ්‍රාම වැටුප් විෂයය භාර අමාත්‍යවරයා අදහස් වේ;

"ලේකම්වරයා" යන්නෙන් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා අදහස් වේ.

---

[1]1974.05.10 දින අංක 111 දරණ ගැසට් පත්‍රය බලන්න.

[2]1986.10.10 දින අංක 423 දරණ ගැසට් පත්‍රය බලන්න.